# ඉතිහාසය

# මූලික පිරිවෙණ

# ගුරු මාර්ගෝපදේශය

# 4 ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)


පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය: www.nie.lk

විද්‍යුත් ලිපිනය: info@nie.lk

වෙබ් අඩවිය : www.pirivena.sch.lk

විද්‍යුත් ලිපිනය: Pirivena@moegov.lk



මුද්‍රණය හා බෙදා හැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ඉතිහාසය**

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

4 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය : 2020

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය: www.pirivena.lk

විද්‍යුත් ලිපිනය: Pirivena@moegov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය: www.nie.lk

විද්‍යුත් ලිපිනය: info@nie.lk

මුද්‍රණය එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් (පුද්.) සමාගම

නො. 49, ජයන්ත වීරසේකර මාවත,

කොළඹ 10.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලාංකේය බෞද්ධ ජාතික අනන්‍යතාවේ සංකේතය භික්ෂූන් වහන්සේ ය. භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනය කේන්ද්‍ර කර ගනිමින් සමස්ත ජාතියටම අධ්‍යාපනික මංපෙත විවර කර දුන් ජාතික පිරිවෙන් අධ්‍යාපනයට දුරාතීතයක් ඇත. අනුරාධපුර යුගයේ සිට ම භික්ෂූන් වහන්සේගේ නායකත්වය යටතේ පිරිවෙන් අධ්‍යාපනය කෙතරම් සුහුඹුල් ව වැඩී ගියා ද කිවහොත් විදේශිකයන් පවා මෙරටට පැමිණ අධ්‍යාපනය හදාළ බව පුරාවෘත්තවලින් පැහැදිලි වේ.

වර්තමානය වන විට පාසැල් අධ්‍යාපනය හා සමාන පහසුකම් ලබමින් විහාරස්ථාන කේන්ද්‍ර කොටගත් පිරිවෙන් ආයතන අධ්‍යාපන අමාත්‍යාංශයේ නියාමනය යටතේ සිය අතීත උරුමයන් එලෙසින් ම ආරක්ෂා කර ගනිමින් පවත්වා ගැනීමට ලැබීම අපගේ සතුටට කරුණකි.

පිරිවෙන් අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් ලබා දෙමින් කාලීන අවශ්‍යතා සපුරා ගැනීමට සුදුසු වියත් යතිවර පරපුරක් හා උගත් විනයවත් ගිහි සමාජයක් බිහිකරලීම අපගේ පරම අභිලාෂය විය යුතු ය. එයට ශක්තියක් වෙමින් 2018 නව විෂයමාලා සංස්කරණය යටතේ ඔබ අතට පත් කෙරෙන මෙම ගුරුමාර්ගෝපදේශය නව ඉගෙනුම් ක්‍රම ඔස්සේ ශිෂ්‍යයාට අවශ්‍ය දැනුම ලබා දීම සඳහා පරිවෙණාචාර්යවරයාට ආධාරකයක් වනු ඇතැයි අපගේ විශ්වාසය යි. මෙය මැනවින් පරිශීලනය කර නිවැරදි අවබෝධයක් ශිෂ්‍ය ප්‍රජාවට ලබා දීම පරිවෙණාචාර්යවරුන් වන ඔබගේ වගකීමක් සේ දකිමි.

මෙම භාරදූර කාර්ය සම්පූර්ණ කිරීම සඳහා ඇපකැප වූ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවට, ජාතික අධ්‍යාපන ආයතනයට හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට මාගේ හෘදයාංගම ස්තුතිය පළකරමි.

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා
අධ්‍යාපන ලේකම්

## ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ ව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්

# පෙරවදන

පිරිවෙන් ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණීතලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසුකර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්නව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙණ මගින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේ සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂාකර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙණ මගින් සිදු වූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂාකර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදකව නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙණ සඳහා පෙළ පොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක නව විෂය මාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදු වන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක් ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

පී.එන්.අයිලප්පෙරුම
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකේය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහි වීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණ.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අපව පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන් එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017.03.16 දිනැති 412.5.12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යයන්ට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජුව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුද්ද, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්හි ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් පිරිවෙන් පන්ති කාමරය ශිෂ්‍ය මිත්‍රභාවයෙන් ප්‍රබෝධාත්මකව ඉහළ සාධනයකට පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

පෙරදිග ලෝකයේ පැවති ඉතා ප්‍රශස්ත අධ්‍යාපන ආයතන අතර පිරිවෙණට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. මෙම අධ්‍යාපන ආයතන ක්‍රමයෙන් වැඩී ගොස් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල මට්ටමට සංවර්ධනය වූ බව නොරහසකි. ශ්‍රී ලාංකේය භික්ෂු අනන්‍යතාව හා දේශීය ජන විඥානය පුබුදුවාලීමට එදා සිට අද දක්වා ම පිරිවෙන් අධ්‍යාපනය සමත් වී ඇත. අෂ්ට මූලායතන කේන්ද්‍ර කරගත් අතීත පිරිවෙන් අධ්‍යාපනය ආධ්‍යාත්මික ගුණයෙන් මෙන් ම ධර්මඥානයෙන්ද හෙබි පරපුරක් මෙරටට දායාද කළේ ය.

නූතන පිරිවෙන් අධ්‍යාපනය ජාතික අධ්‍යාපන ප්‍රවාහයේ තවත් එක් සුවිශේෂ පැතිකඩකි. පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධශාසනෝන්නතිය උදෙසා අවශ්‍ය භික්ෂූන් වහන්සේ ජාතියට දායාද කිරීම හා උගත් වියත් බුද්ධිමත් පිරිසක් බිහි කිරීම පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රමුඛ අභිලාෂය යි.

සෞභාග්‍යමත් දේශයක් කරා යන මේ ගමනේ දී ආකල්ප සම්පත්තියෙන් යුතු ප්‍රජාවක් නිර්මාණය කිරීමට මග පෙන්වීම භික්ෂූන් වහන්සේගේ ප්‍රබල වගකීමකි. ඒ සඳහා උන්වහන්සේ අවශ්‍ය දැනුම් සම්භාරයක් පෝෂිත කරවීමට පිරිවෙණ පෙරටත් වඩා ශක්තිමත් ව ක්‍රියාත්මක විය යුතු ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය යාවත්කාලීන කරමින් නව විෂය නිර්දේශ යටතේ ඉදිරි පියවර රාශියක් තැබීමට අපට හැකි වීම සතුටට හේතුවකි. විවිධ උපාය මාර්ග ඔස්සේ ඉදිරි අනාගත පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීමට අප ගන්නා උත්සාහයේ දී ඔබ අතට පත් කෙරෙන නව ගුරු මාර්ගෝපදේශය ශිෂ්‍ය සාධනය ඉහළ මට්ටමකට ඔසවා තැබීමට ප්‍රබල ගුණාත්මක යෙදවුමක් වනු ඇතැයි මාගේ විශ්වාසයයි. සාම්ප්‍රදායික ඉගෙනුම් ක්‍රම මෙන් ම නූතන ඉගෙනුම් ක්‍රමවේද පිළිබඳව ද පරිවේණාචාර්ය වරුන්ගේ දැනුම යාවත්කාලීන කරගනිමින් ක්‍රියා කිරීම ඔබ සතු වගකීමක් බව ද අවධාරණය කරමි. ගුරු මාර්ගෝපදේශය මැනවින් අධ්‍යයනය කර ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට මෙය මැනවින් භාවිත කර ගන්නා ලෙස ද සිහිපත් කරමි.

මෙවන් ගුරුමාර්ගෝපදේශයක් සකස්කර ඔබ අතට පත්කිරීම ඉතා භාරධූර ක්‍රියාවලියකි. මේ සඳහා මූලික ව ක්‍රියා කළ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ විෂය සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ටත්, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියටත්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමියන්ටත්, පිරිවෙන් අධ්‍යාපන ඒකක ප්‍රධාන හිමියන් හා අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමන් ප්‍රධාන කාර්ය මණ්ඩලයට ද පිරිවෙන් අධ්‍යාපන ශාඛාව වෙනුවෙන් ගෞරවනීය ප්‍රසංසාව පිරිනමමින් ආශිර්වාදය මෙසේ පළකරමි.

පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි
පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

# ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

**උපදේශකත්වය හා අනුමැතිය** : ජාතික අධ්‍යාපන ආයතනය සහ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**මෙහෙයවීම** : පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි
අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය** : ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම
අධ්‍යක්ෂ
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය** : පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය නියාමනය** : ගමගේ වික්‍රම් සම්පත්
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වෛකල්පික)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය විශේෂඥ උපදේශනය** : ඇස්. බී. හෙට්ටිආරච්චි
සම්මානිත මහාචාර්ය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ලේඛක මණ්ඩලය :** ඩී. එච්. චන්දිමා නිශානි ධර්මපාල
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ඩබ්ලිව්. සමන්ති ශිරෝමාලා ගුණවර්ධන
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

ගමගේ විකුම් සම්පත්
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වෛකල්පික)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

එම්. එම්. එස්. කේ. හේරත්
පරිවේණාචාර්ය
බප/ගම් විද්‍යාවංශ මහ පිරිවෙණ, බණ්ඩාරවත්ත, ගම්පහ

පූජ්‍ය ගම්මුල්ලේ සුමංගල හිමි
පරිවේණාචාර්ය
මා/ශ්‍රී ධර්මරාජ මහ පිරිවෙණ, විහාර පාර, මාතලේ

ඒ. ඩී. එස්. අමරසිංහ
ගුරු සේවය
බප/මීග ශාන්ත මරියා මහා විද්‍යාලය
උස්වැටකෙයියාව, ජා ඇල

දිනේෂ් පුෂ්පකුමාර එදිරිමාන්න
පරිවේණාචාර්ය
මාර/ ශ්‍රී මේධංකර පිරිවෙණ, ඌරුැ බොක්ක.

**භාෂා සංස්කරණය :** එම්. ජී. මුණසිංහ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සෝදුපත් කියවීම :** පූජ්‍ය අගුණකොලපැලස්සේ අමිතනන්ද හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (පිරිවෙන් ඉතිහාසය
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**පරිගණක වදන් :** ඩබ්ලිව්. ඉසුරි මධුෂානි පෙරේරා
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සිතියම් නිර්මාණය :** රෙස්ටා ප්‍රියන්ති ප්‍රනාන්දු
පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**පිටකවර නිර්මාණය :** තරිඳු හසංග
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිගණක විද්‍යා)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

# පටුන


- අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය III
- ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය IV
- පෙරවදන V
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය VI
- පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය VII
- ගුරු මාර්ගෝපදේශක සම්පාදක මණ්ඩලය VIII - IX
- පටුන XI
- විෂය නිර්දේශය - 4 වන ශ්‍රේණිය XIII- XXXIII
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් XXXIV

1. පොලොන්නරුව රාජධානිය 1 - 21
2. පොලොන්නරුව බිඳ වැටීමෙන් පසු බිහි වූ රාජධානි 22 - 35
3. ශ්‍රී ලංකාවේ පෘතුගීසී පාලන සමය 36 - 55
4. ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශවල බලය ලබා ගැනීම 56 - 70
5. ශිෂ්ටාචාර ව්‍යාප්තිය 71 - 116
6. අග්නිදිග ආසියාවේ පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය 117 - 142

## වාර සටහන

| නිපුණතාව | කාලච්ඡේද | වාරය |
|---|---|---|
| 01. ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.<br>(පොලොන්නරු රාජධානිය) | 8 | 01 |
| 02. ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.<br>(පොලොන්නරුව බිඳ වැටීමෙන් පසු බිහි වූ රාජධානිය) | 8 | |
| 03. ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.<br>(ශ්‍රී ලංකාවේ පෘතුගීසි පාලන සමය)<br>(1 වාරය කාලච්ඡේද 28) | 12 | |
| 04. ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.<br>(ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශවල බලය අල්ලා ගැනීම) | 10 | 02 |
| 05. ලෝක ශිෂ්ටාචාරවල ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.<br>(ශිෂ්ටාචාර ව්‍යාප්තිය)<br>(2 වාරය කාලච්ඡේද 27) | 17 | |
| 06. අග්නිදිග ආසියාවේ පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය පෙන්වා දෙයි.<br>(අග්නිදිග ආසියාවේ පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය)<br>(1 වාරය කාලච්ඡේද 20) | 20 | 03 |

# ඉතිහාසය

## විෂය නිර්දේශය

## 4 ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

## පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු

2. (අ) භික්ෂූන් වහන්සේලාට, සහ

(ආ) පිරිවෙනක පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට කැමැත්තෙන් සිටින්නා වූ ද බෞද්ධ පරිසරයක ස්වකීය අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන්නා වූ ද වයස අවුරුදු දහහතර ඉක්ම වූ ගිහි පිරිමි ශිෂ්‍යයන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණු වන්නේ ය.

3. (අ) පරියත්ති, පටිපත්ති, පටිවේධ යන ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය කෙරෙහි භික්ෂූන් වහන්සේලා අතර උනන්දුවක් ඇති කිරීම.

(ආ) සැරියුත් මහ මුගලන් තෙර පරපුරෙන් පැවත එන සඟ පරපුර අවිච්ඡින්න ව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය විනය, ත්‍රිපිටක ඥානය, ධර්ම ගරුක බව භික්ෂූන් වහන්සේලා අතර ඇති කිරීම.

(ඇ) දේශීය සහ විදේශීය ධර්මදූත මෙහෙයෙහි මෙන් ම භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන්හි නිරත වීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික දැනුම සඳහා ශික්ෂණයක් දීම, සහ

(ඈ) බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, සිංහල, පාලි, සංස්කෘත ඇතුළු භාෂාන්තර හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනීමක් ලබා ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට පහසුකම් සලසා දීම, පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ වන්නේ ය.

**(1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත)**

## ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ජාතික පොදු අරමුණු

(I) සෑම (ළමයෙකුටම) දෙනාටම පාසල් අධ්‍යාපනයට ඇති සර්ව සහ සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.

(II) සංස්කෘතික විවිධත්වය හඳුනා ගනිමින් ජාතික සහජීවනය පෝෂණය කිරීම, ජාතික අඛණ්ඩතාව සහ ජාතික සමගිය වර්ධනය කිරීම තුළින් මව්බිමට ආදරය, ගෞරවය හා කැපවීමෙන් යුතු ශ්‍රී ලාංකික පුරවැසියෙකු නිර්මාණය කිරීම.

(III) දේශීය හා ගෝලීය අභියෝගයන්ට ප්‍රතිචාර දක්වමින් ජාතියේ සංස්කෘතික හා පාරිසරික උරුමයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම.

(IV) නිර්මාණශීලිත්වය, නවෝත්පාදනය සහ විචක්ෂණශීලී චින්තනය සහිත ඵලදායී පුද්ගලයින් නිර්මාණය කිරීම.

(V) තෘප්තිමත් ජීවන රටාවකට අවශ්‍ය ශාරීරික, මානසික සහ ආධ්‍යාත්මික යහපැවැත්ම පුද්ගලයන් තුළ ප්‍රචලිත කිරීම.

(VI) ගෝලීය ප්‍රවණතාවන්ට සරිලන පරිදි සමාජ, ආර්ථික හා සංස්කෘතික උන්නතිය සඳහා දැනුම, කුසලතා, ආකල්ප සහ මානව ගුණාංග සංවර්ධනය කිරීම.

(VII) මානව හිමිකම්, රටේ නීතිය හා යුතුකම් සහ වගකීම්වලට ගරු කරන, සමාජ සාධාරණත්වය හා ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවකට අවශ්‍ය සාධක නිර්මාණය කිරීම හා ඒ සඳහා අනුබල දීම.

(VIII) සංකීර්ණ හා අනපේක්ෂිත තත්වයන්ට මුහුණ දීම සඳහා වෙනස්වීම් කළමනාකරණය සහ ඉගෙනුමට ඉගෙනීමේ පුද්ගල හැකියාවන් සංවර්ධනය කිරීම.

**(ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව - 2019)**

# මූලික නිපුණතා

අධ්‍යාපනය මඟින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

## (I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

## (II) පෞරුෂ වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය,
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා :
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

## (III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරයට : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය ශාඛ, සත්තව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාවන් ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝග හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් මඟින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීරණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබා දීම.
( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## ඉතිහාස විෂයය අධ්‍යයනයේ අරමුණු

1. මානව ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ විවිධාකාර වූ ස්වභාවය බුද්ධිමත් ව, නිවහල් ව, නිර්මාණශීලී ව හා විවේචනාත්මක ව වටහා ගැනීම.
2. අතීතය මත පදනම් ව වර්තමානය ගොඩනැගෙන බැවින් වර්තමානය මත පදනම් ව ගොඩනැගෙන අනාගතය වඩා ඵලදායී කරලීම වර්ධනය කර ගැනීම
3. ජාතික අනන්‍යතාව හඳුනා ගෙන දේශීය උරුමයන් සුරකිමින් දෑ හිතකාමී පුරවැසියෙකු බවට පත්වීම.
4. ඓතිහාසිකව වැදගත් භූමිකා ඉටු කළ පුද්ගලයන්ගේ චරිතාපදාන චරිතායනය කර ගැනීම.
5. ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකම් හා හර පද්ධතීන් පිළිබඳව අභිමානවත් හැඟුමෙන් කටයුතු කිරීම.
6. ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව බැලීම.
7. ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය වටහා ගෙන ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගැනීම.
8. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.
9. කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම.
10. ඓතිහාසික තොරතුරු ඇසුරෙන් ස්ථාන හඳුනා ගැනීමේ හැකියාව දියුණු කර ගැනීම

## මූලික පිරිවෙන් විෂය නිර්දේශය
## 4 ශ්‍රේණිය - ඉතිහාසය

| නිපුණතාව | නිපුණතා මටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1.0 ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 1.1 අනුරාධපුර රාජධානිය පරිහානියට පත්වීම පිළිබඳ තොරතුරු විමසා බලයි. | **1.පොලොන්නරු රාජධානිය**<br>1.1 අනුරාධපුර රාජධානියේ පරිහානිය | • අනුරාධපුර රාජධානිය පරිහානිය පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි.<br>• අභ්‍යන්තර අරගල නිසා බාහිර බලවේග ක්‍රියාත්මක වන ආකාරය පෙන්වා දෙයි.<br>• තම රටේ අනන්‍යතාව ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතු බව විස්තර කරයි. | 01 |
| | 1.2 චෝළ පාලනය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි. | 1.2 චෝළ පාලනය | • චෝළයන් පිළිබඳ විස්තර කරයි.<br>• චෝළයන් මෙරට අල්ලා ගැනීමේ අරමුණු විස්තර කරයි.<br>• ශ්‍රී ලංකාවේ චෝල පාලනය සිදු වූ ආකාරය පැහැදිලි කරයි. | 01 |
| | 1.3 පොලොන්නරු රාජධානියේ පළමුවන විජයබාහු යුගය පිළිබඳ විග්‍රහ කරයි. | පොලොන්නරු යුගයේ ශ්‍රේෂ්ඨ රජවරු<br>1.3 පළමුවන විජයබාහු රජතුමා | • පළමුවන විජයබාහු රජු පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• පළමුවන විජයබාහු රජුගේ කාර්ය සාපල්‍ය පැහැදිලි කරයි.<br>• පළමුවන විජයබාහු රජතුමා ලංකා ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ රජෙකු බව අගය කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 1.4 පොලොන්නරුව රාජධානියේ මහා පරාකමබාහු යුගය පිළිබඳ විග්‍රහ කරයි. | 1.4 මහා පරාක්‍රමබාහු රජතුමා | • මහා පරාක්‍රමබාහු රජු පිළිබඳ තොරතුරු විස්තර කරයි.<br>• පරාක්‍රමබාහු රජු මුහුණ දුන් අභියෝග පෙන්වා දෙයි.<br>• මහා පරාක්‍රමබාහු රජතුමා පාලකයකු ලෙස තම රටට කළ සේවාව අගය කරයි. | 02 |
| | 1.5 පොලොන්නරු රාජධානියේ නිශ්ශංකමල්ල යුගය පිළිබඳ විග්‍රහ කරයි | 1.5 නිශ්ශංකමල්ල රජතුමා | • නිශ්ශංකමල්ල රජතුමා පිළිබඳ තොරතුරු විස්තර කරයි.<br>• නිශ්ශංකමල්ල රජතුමා අභියෝග ජයගත් ආකාරය විස්තර කරයි.<br>• නිශ්ශංකමල්ල චරිතයෙන් ගත හැකි ආදර්ශ අගය කරයි. | 01 |
| | 1.6 පොලොන්නරුව රාජධානිය බිඳ වැටීම පිළිබඳ විග්‍රහ කරයි. | 1.6 පොලොන්නරුව රාජධානිය බිඳ වැටීම | • පොලොන්නරු රාජධානිය බිඳ වැටීමට හේතු පැහැදිලි කරයි.<br>• පාලකයින්ගේ ක්‍රියාකලාපය රාජ්‍යයක නැගීම සහ වැටීම කෙරෙහි බලපාන ආකාරය පෙන්වා දෙයි.<br>• උන්නතිකාමී පාලකයින් පත්වීමේ වටිනාකම අගයයි. | 01 |

| | | | | |
|---|---|---|---|---|
| **2.0 ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.** | 2.1 දඹදෙණි රාජධානිය පිළිබඳ තොරතුරු විමසා බලයි. | 2. පොළොන්නරුව බිඳ වැටීමෙන් පසු බිහි වූ රාජධානි<br>2.1 දඹදෙණි රාජධානිය | • පොළොන්නරු යුගයෙන් පසු රාජධානි විතැන්වීමට හේතු පහදයි.<br>• දඹදෙණි රාජධානියේ වැදගත්කම විස්තර කරයි.<br>• දෙවන පරාක්‍රමබාහු රජු දඹදෙණිය රාජධානියේ උන්නතියට දැක් වූ දායකත්වය පෙන්වා දෙයි. | 02 |
| | 2.2 යාපහුව රාජධානි යුගයේ සිට ගංපළ යුගය අවසානය දක්වා දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික තොරතුරු විමසා බලයි. | 2.2 යාපහුව රාජධානි යුගයේ සිට ගංපළ රාජධානි යුගයේ අවසානය දක්වා | • යාපහුව, කුරුණෑගල හා ගංපළ රාජධානි පිළිබඳ විස්තර කරයි.<br>• නිරිත දිග රාජධානි වූ රාජධානි කෙටි කලකින් අවසන්වීමට හේතු විස්තර කරයි.<br>• ඒ ඒ රාජධානි තුළ දී බුද්ධහමට සිදු වූ සේවාව විස්තර කරයි | 02 |
| | 2.3 කෝට්ටේ රාජධානිය පිළිබඳ තොරතුරු විමසා බලයි | 2.3 කෝට්ටේ රාජධානිය | • කෝට්ටේ යුගය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• හයවන පරාක්‍රමබාහු රජු කෝට්ටේ යුගයේ ශ්‍රේෂ්ඨ රජු ලෙස පෙන්වා දෙයි.<br>• කෝට්ටේ යුගය ඇසුරෙන් තොරතුරු වගුගත කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 2.4 දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගයේ අවසානය දක්වා බිහි වූ රාජධානි සිතියමක් ඇසුරෙන් පෙන්වා දෙයි. | 2.4 දඹදෙණි රාජධානි යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා රාජධානි සිතියම්ගත කිරීම. | • පෙලොන්නරු යුගය බිඳ වැටීමෙන් පසු බිහි වූ රාජධානි නම් කරයි.<br>• එම රාජධානි ගොඩනැගුණු අනුපිළිවෙළ පෙන්වා දෙයි.<br>• එම රාජධානි සිතියමක ලකුණු කර නම් කරයි. | 02 |
| **3. ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.** | 3.1 යුරෝපීයයන් පෙරදිගට පැමිණීම හා පෘතුගීසීන් පැමිණෙන විට ශ්‍රී ලංකාවේ පැවැති දේශපාලන තත්ත්වය විස්තර කරයි. | **3. ශ්‍රී ලංකාවේ පෘතුගීසී පාලන සමය**<br><br>3.1 යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම | • යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීමට හේතු ඉදිරිපත් කරයි.<br>• පෙරදිගට පැමිණි යුරෝපා ජාතීන් නම් කරයි.<br>• පෘතුගීසීන් පැමිණෙන විට ශ්‍රී ලංකාවේ දේශපාලන තත්ත්වය විස්තර කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 3.2 ශ්‍රී ලංකාවේ පෘතුගීසි බල ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය කරයි. | 3.2 කෝට්ටේ රාජ්‍යයේ පෘතුගීසි බල ව්‍යාප්තිය | • කෝට්ටේ රාජ්‍යය බෙදී ගිය ආකාරය විස්තර කරයි.<br>• පෘතුගීසීන් කෝට්ටේ රාජ්‍යයේ බලය පිහිටුවාගත් ආකාරය විස්තර කරයි.<br>• කෝට්ටේ රාජ්‍යය බෙදී යෑම සිතියමක ලකුණු කර නම් කරයි. | 02 |
| | 3.3 පෘතුගීසි හා සීතාවක රාජධානිය පිළිබඳ විමර්ශනය කරයි. | 3.3 සීතාවක රාජධානිය හා පෘතුගීසීන් | • සීතාවක රාජධානියේ බලය වර්ධනය වූ ආකාරය විස්තර කරයි.<br>• පෘතුගීසීන් සීතාවක රාජධානිය කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු දක්වයි.<br>• පෘතුගීසීන් සීතාවක බලය පිහිටුවීමේ අවස්ථා පැහැදිලි කරයි. | 02 |
| | 3.4 පෘතුගීසීන් හා උඩරට රාජධානිය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි. | 3.4 උඩරට රාජධානිය හා පෘතුගීසීන් අතර සම්බන්ධතා | • පෘතුගීසීන් හා උඩරට රජවරු අතර සම්බන්ධතා විස්තර කරයි.<br>• පෘතුගීසීන් උඩරට රාජ්‍යයේ බලය ලබා ගැනීමට උත්සාහ කළ ආකාරය පෙන්වා දෙයි.<br>• පෘතුගීසි උඩරට ආක්‍රමණ පිළිබඳ විස්තර කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 3.5 යාපනය රාජධානිය හා පෘතුගීසී බල ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය කරයි. | 3.5 යාපනය රාජධානිය තුළ පෘතුගීසි බලය පිහිටුවීම. | • පෘතුගීසින් පැමිණෙන විට යාපනයේ දේශපාලන තත්ත්වය විස්තර කරයි.<br>• පෘතුගීසින් යාපනය රාජධානිය කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු දක්වයි.<br>• පෘතුගීසින් යාපනයේ බලය පිහිටුවීමේ අවස්ථා පැහැදිලි කරයි. | 02 |
| | 3.6 පෘතුගීසී ආගමනයෙන් පසු මෙරටට ඇති වූ බලපෑම පිළිබඳ විමසා බලයි. | 3.6 පෘතුගීසි ආගමනයෙන් පසු ශ්‍රී ලංකාව තුළ ඇති වූ දේශපාලන, ආර්ථික, සමාජ සංස්කෘතික වෙනස්කම් | • මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසීන්ගේ පාලන කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• පෘතුගීසින් යටතේ මුහුදුබඩ ප්‍රදේශවල ආර්ථික කටයුතු පැහැදිලි කරයි.<br>• පෘතුගීසින් යටතේ ආගමික කටයුතු විස්තර කරයි.<br>• පෘතුගීසි පාලනයෙන් මෙරට සංස්කෘතියට එක් වූ නවාංග පෙන්වා දෙයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| 4. ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරය. | 4.1 ලන්දේසි බල ව්‍යාප්තිය විමර්ශනය කරය | 4. ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශවල බලය අල්ලා ගැනීම<br>4.1 ශ්‍රී ලංකාවේ ලන්දේසි බල ව්‍යාප්තිය | • ලන්දේසීන් ආසියාවට පැමිණීමට හේතු පැහැදිලි කරයි.<br>• ලන්දේසීන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු විස්තර කරයි<br>• ඉන්දියානු සාගරය ආශ්‍රිත කලාපය තුළ ලන්දේසි බලය තහවුරු කර ගැනීමට ගත් ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධයෙන් අදහස් දක්වයි. | 02 |
| | 4.2 උඩරට හා ලන්දේසීන් අතර සබඳතා පැහැදිලි කරයි. | 4.2 උඩරට රාජ්‍යය හා ලන්දේසීන් අතර සම්බන්ධතා | • උඩරට රජවරුන් හා ලන්දේසීන් අතර පැවති සබඳතා විස්තර කරයි.<br>• ලන්දේසීන් හා උඩරට පාලකයින් අතර ඇති වූ ගිවිසුම් සඳහා හේතු පැහැදිලි කරයි.<br>• උඩරට පාලකයින් හා ලන්දේසීන් අතර හටගත් ගැටුම් අවම කරගත් ආකාරය පෙන්වා දෙයි. | 02 |
| | 4.3 මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය විස්තර කරයි. | 4.3 මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය | • ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමට ගත් උත්සාහය පැහැදිලි කරයි.<br>• මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය පැවති ආකාරය විස්තර කරයි.<br>• ලන්දේසි පාලනය තුළ ලංකාවේ ඇති වූ නව අංග හඳුනා ගෙන අර්ථ දක්වයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 4.4 ලන්දේසි පාලනයේ ආර්ථික ප්‍රවණතා විමර්ශණය කරයි. | 4.4 ලන්දේසි පාලන සමය තුළ ශ්‍රී ලංකා ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් | • ලන්දේසි පාලනය යටතේ මෙරට වාණිජ බෝග වගාවක් ලෙස කුරුඳු වගාව ව්‍යාප්ත වූ ආකාරය පැහැදිලි කරයි.<br>• ලන්දේසි පාලනය තුළ දේශීය කෘෂි ආර්ථිකය පෝෂණය වූ අයුරු විස්තර කරයි.<br>• ලන්දේසීන් යටතේ මෙරට ආර්ථිකය තුළ ඇති වූ වෙනස්කම් පෙන්වා දෙයි. | 02 |
| | 4.5 ලන්දේසි පාලනයෙන් සාමාජීය වශයෙන් මෙරටට එක් වූ නවාංග විමර්ශනය කරයි. | 4.5 ලන්දේසි පාලනයේ මෙරට ඇති වූ සමාජ සංස්කෘතික වෙනස්කම් | • .ලන්දේසින් යටතේ ශ්‍රී ලංකාවේ සමාජීය සහ සංස්කෘතික කටයුතු පැහැදිලි කරයි.<br>• ලන්දේසි පාලනය යටතේ ශ්‍රී ලාංකික සමාජයට එකතු වූ නවාංග පෙන්වා දෙයි.<br>• ක්‍රිස්තියානි ආගමේ ව්‍යාප්තිය සඳහා ලන්දේසීන් භාවිත කළ උපක්‍රම සමාජීයව බලපෑ ආකාරය අර්ථකථනය කරමින් පහදයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| 5.0 ලෝක ශිෂ්ටාචාරවල ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | 5.1.1 ග්‍රීක ශිෂ්ටාචාරය ගොඩනැගීම පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරයි. | **5. ශිෂ්ටාචාර ව්‍යාප්තිය**<br>5.1.1 ග්‍රීක ශිෂ්ටාචාරය<br>- භූගෝලීය පිහිටීම<br>- ආරම්භය හා ව්‍යාප්තිය<br>- පාලන ක්‍රමය<br>- ආර්ථික කටයුතු | • ග්‍රීක ශිෂ්ටාචාරයේ ආරම්භය හා ව්‍යාප්තිය පිළිබඳ විස්තර කරයි.<br>• ග්‍රීක ශිෂ්ටාචාරයේ පාලන කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ග්‍රීක ශිෂ්ටාචාරයේ ආර්ථිකය පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.<br>• ග්‍රීක ශිෂ්ටාචාරය සිතියමක ලකුණු කර නම් කරයි. | 02 |
| | 5.1.2 ග්‍රීක ශිෂ්ටාචාරයේ ආගමික සමාජ හා සංස්කෘතික ක්ෂේත්‍ර පිළිබඳ විමසා බලයි. | 5.1.2 ග්‍රීක ශිෂ්ටාචාරයේ ආගමික, සමාජ හා සංස්කෘතික තත්ත්වය<br>- ආගමික තත්ත්වය<br>- ග්‍රීක කලාව හා ගෘහ නිර්මාණ<br>- අධ්‍යාපනය හා දාර්ශනික තත්ත්වය<br>- ග්‍රීක සමාජය | • ග්‍රීක ශිෂ්ටාචාරයේ ආගමික තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.<br>• ග්‍රීක ශිෂ්ටාචාරයේ සමාජ තත්ත්වය පිළිබඳ අදහස් දක්වයි.<br>• ග්‍රීසියේ කලා කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 5.1.3 ග්‍රීක ශිෂ්ටාචාරයේ පරිහානිය හා ලෝකයට උරුම වූ දායාද පිළිබඳ අධ්‍යයනය කරයි. | 5.1.3ග්‍රීක ශිෂ්ටාචාරයේ පරිහානිය හා ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද | • ග්‍රීක ශිෂ්ටාචාරයේ පරිහානියට බලපෑ හේතු දක්වයි.<br>• ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද පෙන්වා දෙයි.<br>• ග්‍රීක ශිෂ්ටාචාරයේ පරිහානිය සිදු වුවද, එහි දායාද වර්තමානයේ ද ක්‍රියාත්මක බව අගය කරයි. | 02 |
| | 5.2.1 රෝම ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි. | **5.2 රෝම ශිෂ්ටාචාරය**<br>5.2.1 භූගෝලීය පිහිටීම සහ එහි ආරම්භය හා ව්‍යාප්තිය | • රෝම ශිෂ්ටාචාරයේ භූ භෞතික පරිසරය පිළිබඳ හඳුන්වා දෙයි.<br>• රෝම ශිෂ්ටාචාරයේ ආරම්භය විස්තර කරයි.<br>• රෝම ශිෂ්ටාචාරයේ වර්ධනීය අවස්ථා පෙන්වා දෙයි.<br>• රෝම ශිෂ්ටාචාරය ව්‍යාප්ත වූ ප්‍රදේශ හා ඓතිහාසික ස්ථාන සිතියමක ලකුණු කර නම් කරයි. | 02 |
| | 5.2.3 රෝම ශිෂ්ටාචාරයේ පාලනය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි. | 5.2.3 රෝම ශිෂ්ටාචාරයේ පාලනය<br>- සමූහාණ්ඩු පාලනය<br>- අධිරාජ්‍ය පාලනය | • රෝම පාලන ක්‍රමයේ විකාශනය විස්තර කරයි.<br>• රෝම පාලනයේ සුවිශේෂ ලක්ෂණ පෙන්වා දෙයි.<br>• රෝමය අධිරාජ්‍යවාදී පාලන ක්‍රමය ලෝකයට දායාද කළ බව පෙන්වා දෙයි. | 01 |

| | | | | |
|---|---|---|---|---|
| | 5.2.3 රෝම ශිෂ්ටාචාරයේ ආර්ථිකය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි. | 5.2.3 රෝමයේ ආර්ථිකය<br>- කෘෂිකර්මය<br>- වෙළෙඳාම<br>- කර්මාන්ත | • රෝම ශිෂ්ටාචාරයේ තත්ත්වය පැහැදිලි කරයි.<br>• රෝම ආර්ථිකය විවිධ ක්ෂේත්‍ර ඇසුරින් පැවති බව පෙන්වා දෙයි.<br>• රෝම ආර්ථිකය දියුණු තත්ත්වයක පැවති බව අගය කරයි. | 01 |
| | 5.2.4 රෝම ශිෂ්ටාචාරයේ සමාජ, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි. | 5.2.4 රෝම ශිෂ්ටාචාරයේ ජන ජීවිතය<br>- රෝම සමාජය<br>- රෝම ශිෂ්ටාචාරයේ ආගමික තත්ත්වය<br>- රෝම ශිෂ්ටාචාරයේ කලාව | • රෝම ශිෂ්ටාචාරයේ ජනජීවිතය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• රෝමයේ පැවති සමාජ ක්‍රමය පිළිබඳ කරුණු දක්වයි.<br>• රෝමයේ ආගමික තත්ත්වය පිළිබඳ අදහස් දක්වයි.<br>• රෝමයේ කලා කටයුතු පිළිබඳ විස්තර කරයි. | 02 |
| | 5.2.5 රෝම ශිෂ්ටාචාරයේ පරිහානිය හා ලෝකයට උරුම වූ දායාද පිළිබඳ අධ්‍යයනය කරයි. | 5.2.5 රෝම ශිෂ්ටාචාරයේ පරිහානිය හා බිඳ වැටීම<br>• රෝම ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද | • රෝම ශිෂ්ටාචාරය පරිහානියට බලපෑ හේතු ඉදිරිපත් කරයි.<br>• රෝම ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද විස්තර කරයි.<br>• රෝම ශිෂ්ටාචාරය පරිහානියට පත් වුව ද එහි වටිනාකම් වර්තමානයේ ද දක්නට ඇති බව අගය කරයි | 01 |

| | | | | |
|---|---|---|---|---|
| | 5.2.6 ක්‍රි.පූ 6 වන සියවසේ ඉන්දියාවේ දේශපාලන තත්වය පිළිබඳ විමර්ශනය කරයි. | මෞර්ය අධිරාජ්‍යය<br>5.2.6 ක්‍රි.පූ 6 වන සියවසේ ඉන්දියාවේ දේශපාලන තත්ත්වය<br>- සොළොස්මහා ජනපද | • සොළොස්මහා ජනපද නම් කරයි.<br>• සොළොස්මහා ජනපද සිතියමක ලකුණු කොට නම් කරයි. | 01 |
| | 5.2.7 මගධය අධිරාජ්‍යයක් ලෙස වර්ධනය වූ ආකාරය විමසා බලයි. | 5.2.7 අධිරාජ්‍යයේ නැගීම | • මගධයේ බලවර්ධනයට බලපෑ භූගෝලීය පසුබිම විස්තර කරයි.<br>• රාජවංශ යටතේ මගධයේ බලය වර්ධනය වූ ආකාරය පෙන්වා දෙයි.<br>• මගධ අධිරාජ්‍ය ගොඩනැගීමට අශෝක රජුගේ දායකත්වය අගය කරයි. | 02 |
| | 5.2.8 මෞර්ය අධිරාජ්‍යයේ සංස්කෘතික කටයුතු සහ පරිහානිය පිළිබඳ තොරතුරු විමසා බලයි. | 5.2.8 මෞර්ය අධිරාජ්‍යයේ සංස්කෘතික හා කලා කටයුතු<br>- මෞර්ය අධිරාජ්‍යයේ පරිහානිය හා බිඳ වැටීම | • මෞර්ය අධිරාජ්‍යයේ කලාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>• මෞර්ය අධිරාජ්‍යයේ කලා නිර්මාණ අගය කරයි.<br>• මෞර්ය අධිරාජ්‍යය බිඳ වැටීමට බලපෑ හේතු දක්වයි. | 01 |

| | | | | |
|---|---|---|---|---|
| 06. අග්නිදිග ආසියාවේ පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය පෙන්වා දෙයි. | | **6. අග්නිදිග ආසියාවේ පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය** | | |
| | 6.1 ආසියානු බෞද්ධ සංස්කෘතීන් විමසා බලයි. | 6.1 අග්නිදිග ආසියාව හා ඈත පෙරදිග ආසියාවේ පිහිටීම | • අග්නිදිග ආසියාව හා ඈත පෙරදිග රටවල් පැහැදිලි කරයි.<br>• අග්නිදිග හා ඈත පෙරදිග ආසියානු රටවල්වල නාමයන් පැහැදිලි කරයි.<br>• අග්නිදිග හා ඈත පෙරදිග රටවල් සිතියමක සලකුණු කරයි. | 01 |
| | 6.2 බුරුමයේ බුදු දහම ව්‍යාප්තිය විමසා බලයි. | 6.2 බුරුමයේ බුදු දහම පැතිරීම | • බුරුමයට බුදු සමය පැමිණි ආකාරය පැහැදිලි කරයි.<br>• ථෙරවාදී බුදු සමයේ ප්‍රබෝධය ඇති වූ ආකාරය විස්තර කරයි.<br>• බුරුමය හා ලංකාව අතර ඇති ආර්ථික, ආගමික, සමාජීය, සංස්කෘතික සබඳතා වැඩි දියුණු වූ ආකාරය පහදයි. | 03 |
| | 6.3 තායිලන්තයේ බුදු දහම ව්‍යාප්ත වූ ආකාරය විමසා බලයි. | 6.3 තායිලන්තයේ බුදු දහම පැතිරීම | • තායිලන්තයට බුදුදහම ව්‍යාප්ත වූ අයුරු විස්තර කරයි.<br>• ථෙරවාදී බෞද්ධ කටයුතු පැහැදිලි කරයි.<br>• තායිලන්ත සමාජය කෙරෙහි ශ්‍රී ලාංකේය බුදු දහමින් ලැබුණු පෝෂණය පැහැදිලි කරයි. | 03 |

| | | | | |
|---|---|---|---|---|
| | 6.4 කාම්බෝජයේ බුදු දහම පැතිරීම පිළිබඳ තොරතුරු විමර්ශනය කරය | 6.4 කාම්බෝජයේ බුදු දහම පැතිරීම | • කාම්භෝජයේ අතීත බෞද්ධ උරුමය පිළිබඳව විස්තර කරයි.<br>• කාම්භෝජයේ බුදදු දහමේ ව්‍යාප්තියට කටයුතු කළ පාලකයන්ගේ ක්‍රියාකලාපය පැහැදිලි කරයි.<br>• කාම්භෝජයේ පැරණි බෞද්ධ වෙහෙර විහාර පෙන්වා දෙයි. | 02 |
| | **6.5** ලාඕසයේ බුදු දහම ව්‍යාප්ත වීම පිළිබඳ විමසා බලයි. | 6.5 ලාඕසයේ බුදු දහම පැතිරීම | • ලාඕසයේ පිහිටීම සිතියම ඇසුරින් පෙන්වා දෙයි.<br>• බුදු දහමේ ආභාසය ලැබීම පිළිබඳ ව පැහැදිලි කරයි.<br>• බුදු දහම සමාජගත වී ඇති අයුරු පෙන්වා දෙයි. | 02 |
| | **6.6** ඉන්දුනීසියාවේ බුදු දහම ව්‍යාප්ත වීම පිළිබඳ විමර්ශනය කරයි. | 6.6 ඉන්දුනීසියාවේ බුදු දහම ව්‍යාප්ත වීම | • ඉන්දුනීසියාවේ බුදු දහම පැතිරීම විස්තර කරයි.<br>• බුදු දහම පැතිරීමට පාලකයන්ගෙන් ලැබුණු අනුග්‍රහය අගය කරයි.<br>• විවිධ අවස්ථාවල බුදු දහමට එල්ල වූ අභියෝග පැහැදිලි කරයි. | 02 |

| | | | | |
|---|---|---|---|---|
| | 6.7 චීනයේ බෞද්ධාගම ව්‍යාප්ත වූ ආකාරය විමසා බලයි | 6.7 චීනයේ බුදු දහම පැතිරීම | • චීනයට බුදු දහම ලැබුණු ආකාරය විග්‍රහ කරයි.<br>• චීනයේ බුදු දහම ප්‍රචාරයට තුඩු දුන් හේතු ඉදිරිපත් කරයි.<br>• සදාචාරවත් චීන සමාජයක් ගොඩනගා ගැනීමට බුදු දහමින් ලැබුණු ආභාසය පෙන්වා දෙයි. | 03 |
| | 6.8 කොරියාවේ බෞද්ධාගම ව්‍යාප්ත වීම පිළිබඳ විමසා බලයි. | 6.8 කොරියාවේ බුදු දහම පැතිරීම | • කොරියාවේ බුදු දහම පැතිරීම පිළිබඳ විස්තර කරයි.<br>• බුදු දහම මගින් කොරියානු සමාජය වෙනස් වූ ආකාර පෙන්වා දෙයි.<br>• කොරියානු බුදු දහමේ වර්තමාන තත්ත්වය පහදයි. | 02 |
| | 6.9 ජපානයේ බුදු දහම ව්‍යාප්ත වීම පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි. | 6.9 ජපානයේ බුදු දහම පැතිරීම | • බුදු දහම පැමිණීමට පෙර ජපානයේ ආගමික මත විස්තර කරයි.<br>• ජපානයේ බුදු දහම ව්‍යාප්ත වූ ආකාරය පෙන්වා දෙයි.<br>• ජපානයේ බුදු දහම ප්‍රධාන ආගම බවට පත්වීම අගය කරයි.<br>• බුදු දහම මගින් ජපන් වැසියන් ලද දායාද පෙන්වා දෙයි. | 02 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 01

# පොලොන්නරුව රාජධානිය

**හැඳින්වීම**

භූගෝලීය වශයෙන් ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්න ව පිහිටා තිබීම ලංකාවේ සියලු අංශ කෙරෙහි සෘජුව බලපා තිබේ.

ඒ අනුව දකුණු ඉන්දියානු ආක්‍රමණ ලංකාවේ දේශපාලනික වශයෙන් අනුරාධපුර රාජධානියේ පරිහානිය කෙරෙහි බලපා ඇත. පරිහානියට පත් ලංකා රාජ්‍යය චෝළයන් විසින් අත්පත් කොට පොලොන්නරුවේ සිට පාලනය කිරීම සිදු විය.

චෝළයන්ගෙන් රට මුදා පොලොන්නරුව තම අගනුවර ලෙස තෝරා ගත් විජයබාහු, පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල වැනි පාලකයන්ගේ දේශපාලන, ආර්ථික, සංස්කෘතික කටයුතු හා පොලොන්නරුවෙහි පරිහානියට බලපෑ හේතු විමසා බැලීම මෙම ඒකකයෙන් සිදු කෙරේ.

**නිපුණතාව 1.0** : ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 1.1** : අනුරාධපුර රාජධානිය පරිහානියට පත්වීම පිළිබඳව තොරතුරු විමසයි.

**කාලච්ඡේද** : 01යි.

**ඉගෙනුම් පල** :

- අනුරාධපුර රාජධානියේ පරිහානිය පිළිබඳව තොරතුරු පැහැදිලි කරයි.
- අභ්‍යන්තර අරගල නිසා බාහිර බලවේග ක්‍රියාත්මක වන ආකාරය පෙන්වා දෙයි.
- තම රටේ අනන්‍යතාව ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතු බව විස්තර කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- සාමකාමීව ගැටලු විසඳා ගැනීමෙන් විශාල විනාශයන් වළක්වා ගත හැකි වීම පිළිබඳ අවබෝධය ලබා ගැනීම

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 1.1.1
- A3 කඩදාසි හෝ බ්‍රිස්ටල් බෝඩ්
- www.e - thaksalawa.moe.gov.lk/modle/pluginfile.php/22943/mod../eha
- www. lankalibrary.com/heritage/Anuradapura.htm

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.

**1.1 අනුරාධපුර රාජධානියේ පරිහානිය**

පහත සඳහන් කරුණු ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

- මෞර්ය හා ලම්බකර්ණ රාජවංස දෙක අතර ගැටුම නිසා රාජ්‍යය තුළ ව්‍යාකූලතාවක් ඇති වීම
- දුර්වල පාලකයන් බලයට පත් වීම
- අනුරාධපුර රාජධානියේ අගභාගයේ පාලකයින් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්ති
- ආර්ථික වශයෙන් ඇති වූ පරිහානිය
- වැව් අමුණු හා ඇළ මාර්ග විනාශ කිරීම
- රාජ්‍ය ආදායම් අඩු වීම
- විදේශ ආක්‍රමණ නිසා වැව් අමුණු ප්‍රතිසංස්කරණය නොකිරීම



ඡායාරූපය 1.1.1 සතුරු ආක්‍රමණ නිසා නටබුන් බවට පත් වූ අනුරාධපුර රාජධානිය

- අනුරාධපුර පාලන නිලධාරීන් රජුට විරුද්ධව කැරළි ගැසීම
- රජු අනුරාධපුර රාජධානියෙන් පලා යාම
- චෝළයන් අනුරාධපුරය ආක්‍රමණය කිරීම හා එය යටත් කර ගැනීම
- චෝළයන් අනුරාධපුරය වෙනුවට පොලොන්නරුව පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම
- පොලොන්නරුව පාලන මධ්‍යස්ථානයක් ලෙස වැදගත්වීමට හේතු
- රෝහණය හා උතුරු ප්‍රදේශය පාලනය කිරීමට පහසු වීම
- ගෝකණ්ණතිත්ථ වරාය මගින් දකුණු ඉන්දියාව සමග සබඳතා පැවැත්වීමට පහසු වීම
- රෝහණය හා අනුරාධපුරය ගමන් මාර්ගය අතර පිහිටා තිබීම
- මහවැලි ගඟ සහ කෘෂිකර්මාන්තයට හිතකර ප්‍රදේශයක් වීම

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම් අංක 1.1.1හි ක්‍රියාකාරකම සඳහා ශිෂ්‍ය කණ්ඩායම් යොමු කරන්න.
- ක්‍රියාකාරකම සඳහා විනාඩි 20ක් පමණ යොදා ගන්න.
- නිර්ණායක අනුව ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක ඃ**

- අනුරාධපුර රාජධානියේ පරිහානියට බල පෑ හේතු පැහැදිලි කිරීම
- අභ්‍යන්තර බල අරගල බාහිර බලවේග ක්‍රියාත්මකවීමට හේතු වන බවට කරුණු දැක්වීම
- රටේ ආරක්ෂාව සඳහා සාමූහිකව ක්‍රියා කළ යුතු බව පෙන්වා දීම
- ක්‍රියාකාරකම සඳහා දායක වීම
- ක්‍රියාකාරකම පන්තියට ඉදිරිපත් කිරීම

**ඇමුණුම් අංක 1.1.1**

**කාර්ය පත්‍රිකාව**

- අනුරාධපුර රාජධානියේ පරිහානිය
    - සිංහල රාජවංස අතර බල අරගලය හා දුර්වල පාලකයින් බලයට පත් වීම
    - ආර්ථික පරිහානිය
    - රාජ්‍ය ආදායම අඩු වීම
    - දකුණු ඉන්දියා ආක්‍රමණ හා අනුරාධපුර රාජධානිය පිරිහීම හා බිඳ වැටීම
- ඉහත කරුණු ඇසුරින් අනුරාධපුර රාජධානිය පිරිහීම හා බිඳ වැටීම පිළිබඳ තොරතුරු රැස් කරන්න.
- එය පන්තියේ ප්‍රදර්ශනය සුදුසු ලෙස A4 හෝ බ්‍රිස්ටල් බෝඩ් එකක ලියන්න.
- ක්‍රියාකාරකම පන්තියට ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 1.0** : ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 1.2 චෝළ පාලනය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද** : 01යි.

**ඉගෙනුම් පල** :

- චෝළයන් පිළිබඳ විස්තර කරයි.
- චෝළයන් මෙරට අල්ලා ගැනීමේ අරමුණු විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ චෝළ පාලනය සිදු වූ ආකාරය පැහැදිලි කරයි.

**ආකල්ප හා වටිනාකම්** :

- තම රට, දැය, සමය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම සඳහා පෙලඹීම

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම් අංක 01

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.

1.2 චෝළ පාලනය

- දකුණු ඉන්දියාව ශ්‍රී ලංකාවට ඉතා ආසන්න ව පිහිටා තිබීම හේතුවෙන් ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දියාව අතර විවිධ සබඳතා ඇති වීම. එනම්,
  - පල්ලව, පාණ්ඩ්‍ය, කේරළ, චෝළ යන දකුණු ඉන්දියානු රාජ්‍ය හා ලංකාව අතර විවිධ සබඳතා පැවැතීම
  - එම සබඳතා රාජතාන්ත්‍රික, විවාහ, ආගමික හා සංස්කෘතික ආර්ථික ආදී විවිධ ස්වරූපයෙන් සිදු වීම
  - ඒ අතර විවිධ කාලවල දී දකුණු ඉන්දියානු රාජ්‍යයන් ශ්‍රී ලංකාව ආක්‍රමණය කිරීම

  උදා - චෝළ, පාණ්ඩ්‍ය

- ශ්‍රී ලංකාව දකුණු ඉන්දියානු ආක්‍රමණවලට ලක්වීමට හේතු,

- ශ්‍රී ලංකාවේ පිහිටීම

  - දකුණු ඉන්දියානු බලවත් රාජ්‍ය තම බලය උතුරු ප්‍රදේශවලට වඩා දකුණට ව්‍යාප්ත කිරීම
  - ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනය සඳහා වූ අභ්‍යන්තර අරගල නිසා පාලනය දුර්වල වීම



**ඇමුණුම් අංක 1.2.1 ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දියාව දැක්වෙන සිතියම**

- චෝළවරු රජරට බලය ලබා ගැනීම

  - ක්‍රි.ව. 993 දී චෝළ අධිරාජ්‍ය වූ පළමුවෙනි රාජ රාජ, රාජ කකුධ භාණ්ඩ ලබා ගැනීම සඳහා ආක්‍රමණය කර මෙරට තිබූ දුර්වල පාලනය අනුව රජරට බලය අල්ලා ගැනීම.
  - ක්‍රි.ව. 1017 දී බලය අල්ලා ගත් පළමුවෙනි රාජේන්ද්‍ර ශ්‍රී ලංකාවේ උතුරු කොටස ඉන්දියාවේ චෝළ අධිරාජ්‍යයේ කොටසක් ලෙස නම් කිරීම
  - චෝළ අධිරාජ්‍ය මණ්ඩලම් වශයෙන් පාලන ඒකක අටකට බෙදා තිබූ අතර ශ්‍රී ලංකාව ද එහි එක් මණ්ඩලයක් වීම
  - ශ්‍රී ලංකාවේ මෙම පාලන ප්‍රදේශය මුණ්මුඩි ශෝළ මණ්ඩලම් ලෙස හැඳින්වීම
  - පොලොන්නරුව චෝළයන්ගේ අගනුවර වශයෙන් තෝරා ගැනීම
  - එය ජනනාත පුරම් (ජනනාත මණ්ඩලම්) ලෙස හැඳින්වීම
  - මුණ්මුඩි චෝළ ප්‍රදේශය යුධමය ස්වරූපයෙන් පාලනය කිරීම
  - චෝළ අධිරාජ්‍යයාගේ සෙන්පතියෙකු විසින් පාලනය මෙහෙයවීම
  - ඉහළ තනතුරුවලට චෝළයන් පමණක් පත් කිරීම
  - ප්‍රධාන වශයෙන් ඉඩම් බදු අය කර ගැනීම තුළින් රාජ්‍ය ආදායම තර කිරීම
  - ප්‍රතිරාජයා ප්‍රමුඛ නිලධාරීන් බදු, කප්පම් හා පුද පඬුරු එකතු කිරීම
  - බදු අයකොට ඒවා තම මව්රට වූ චෝළ දේශයට යැවීම
  - ආගමික අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා මෙහි දේවාල ඉදි කිරීම, ඒවා පොලොන්නරුව, කන්තලේ, මන්නාරම යන ප්‍රදේශවල ඉදි කර තිබීම



**1.2.1 පොලොන්නරුවේ අංක 02 ශිව දේවාලය**

  - චෝළයන් බෞද්ධ විහාරවලට ද උදව් කිරීම
  - පාලන කටයුතු විධිමත්ව තිබූ බැවින් චෝළ අධිරාජ්‍යයාගේ මැදිහත්වීමක් නැතිව ශ්‍රී ලංකාවේ චෝළ ප්‍රදේශ තමන්ට අභිමත පරිදි පාලනය කිරීම.

- **ඉහත විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකම සඳහා යොමු කරවන්න.**
  - චෝළ පාලනයට අදාළ ඇමුණුම 1.2.1 හි ප්‍රශ්නාවලිය සඳහා පිළිතුරු ලිවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
  - මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
  - සියලු ම ප්‍රශ්න අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට පිළිතුරු ලිවීමට උපදෙස් දෙන්න.
  - පෙළ පොත උපයෝගි කර ගනිමින් ප්‍රශ්නාවලි සම්පූර්ණ කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
  - පිළිතුරු ලිවීම සඳහා සුදුසු කාලයක් ලබා දෙන්න.
  - ශිෂ්‍ය පිළිතුරු පත්‍ර ඇගයීම් කරන්න.
  - ශිෂ්‍ය උපස්ථම්භන ක්‍රියාවලියක නිරත වන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- චෝළයන් පිළිබඳ විස්තර කිරීම
- ශ්‍රී ලංකාවේ චෝළ පාලනය විමසා බැලීම
- පොලොන්නරුව අගනගරය ලෙස තෝරා ගැනීමට හේතු පැහැදිලි කිරීම
- නිවැරදි ව ප්‍රශ්නාවලිය සම්පූර්ණ කිරීම
- උපදෙස් නිවැරදි ව පිළිපැදීම

**ඇමුණුම් අංක 1.2.1**

**ප්‍රශ්නාවලිය**

- චෝළ අධිරාජ්‍යයේ දේශසීමා නම් කරන්න.
- ශ්‍රී ලංකාව කොල්ල කෑ පළමු චෝළ අධිරාජයා නම් කරන්න.
- චෝළයන් අනුරාධපුරය අල්ලා ගැනීමෙන් පසු තම පාලන අගනගරය ලෙස තෝරා ගත්තේ කුමන ප්‍රදේශය ද?
- එම ප්‍රදේශය ඔවුන් නම් කළේ කුමන නමකින් ද?
- එම නගරය තම පාලන මධ්‍යස්ථානය කර ගැනීමට හේතු මොනවා ද?
- පස් වන මිහිඳු සිරකරුවෙකු ලෙස ගෙන ගිය චෝළ අධිරාජයා නම් කරන්න.
- චෝළ අධිරාජයා මෙරට පාලනය කිරීමට පත් කළ නිලධාරියා හැඳින්වූයේ කුමන නමකින් ද?
- චෝළයන් ඉහළ තනතුරුවලට මෙරට දී පත් කරන ලද්දේ කුමන ජාතිකයන් ද?
- චෝළයන් ආගමික අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා දේවාල නිර්මාණය කළ නගර තුනක් නම් කරන්න.

**නිපුණතාව** : ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 1.3 පොලොන්නරු රාජධානියේ පළමුවන විජයබාහු යුගය පිළිබඳ විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල**

- පළමුවන විජයබාහු රජු පිළිබඳ තොරතුරු රැස් කරයි.
- පළමුවන විජයබාහු රජුගේ කාර්ය සාපල්‍යය පැහැදිලි කරයි.
- පළමුවන විජයබාහු රජතුමා ලංකා ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ රජෙකු බව අගය කරයි.

**ආකල්ප හා වටිනාකම් :**

- තම රට පිළිබඳ අභිමානය හා රටට ගෞරව දැක්වීමට පෙලඹීම.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම් අංක 01 ක්‍රියාකාරකම් පත්‍රිකාව
- A3 හෝ බ්‍රිස්ටල් බෝඩ්
- පෙල්ට් පෑන්

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**පොලොන්නරු යුගයේ ශ්‍රේෂ්ඨ රජවරු**

**1.3 පළමුවන විජයබාහු රජතුමා**

- දේශපාලන කටයුතු
- ලෝකිතා හා මොග්ගල්ලාන දෙදෙනා දෙමව්පියන් වීම.
- බුද්ධරාජ හෙවත් බුදල්නා යටතේ ආරක්ෂාව ලැබීම
- රුහුණු පාලක කේශධාතුව කාශ්‍යප පරදා රුහුණේ විජයබාහු රජු ලෙස බලයට පත්වීම
- මොහු කාලිංග වංශික තිලෝකසුන්දරී විවාහ කර ගැනීම. ඔවුන්ට දූවරු පස්දෙනෙකු හා එක පුතෙකු සිටීම
- හමුදා බල ඇනි තුනක් යොදවා රජරට චෝළ බලය බිඳ දැමීම

1. දක්ෂිණ දේශය හරහා අනුරාධපුර හා මහාතිත්ථයට පිටත් කිරීම
2. නැගෙනහිර වෙරළ ඔස්සේ පොලොන්නරුවට ප්‍රවේශ වීම
3. මාගම බුත්තල පසුකොට මහවැලි ගඟ ඔස්සේ දහස් තොටින් පොලොන්නරුවට ප්‍රවේශ වීම

- වසර 53කින් පසු (1017 - 1070) චෝළයන්ගෙන් රට බේරා ගැනීම
- පොලොන්නරුව සිට පාලනය ගෙන යෑම
- පිරිහී තිබූ රාජ්‍යය පරිපාලනය විධිමත් කිරීම
    1. සහෝදර වීරබාහුට දක්ෂිණ දේශය භාර දී මහාදිපාද තනතුර පිරිනැමීම
    2. ජයබාහුට ආදිපාද තනතුර ලබා දී රුහුණු දේශය භාර දීම

» ආර්ථික කටයුතු

- වාරිකර්මාන්ත ප්‍රතිසංස්කරණය කිරීම
- (මහකනදරා, නාච්චදූව, මාඑළිය, ඉනාමළුව, වලාහස්ස, මින්නේරිය, පාණ්ඩවාපී වැව්)
- ඇළහැර ඇළ වැනි ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම
- බුදුගුණ වාපී වැව නිර්මාණය කිරීම
- වෙළෙඳාම දියුණු කිරීමට විදේශ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම
- බුරුමය සමග වෙළෙඳ සබඳතා ගොඩනැගීම
- භාණ්ඩාගාරයට අයබදු රැස් කිරීම විධිමත් කිරීම

ආගමික කටයුතු

- බුරුම රජුගේ (අනුරුද්ධ රජු) උපකාර මත මෙරට දහස්තොට දී උපසම්පදා උත්සව පැවැත්වීම
- වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම
- ග්‍රාමවාසී, වනවාසී භික්ෂූන්ට අනුග්‍රහ දැක්වීම
- පොලොන්නරුවෙහි දළඳා මැදුරක් නිර්මාණය කිරීම
- ශ්‍රී පාද බැතිමතුන්ට පුද සත්කාර කිරීමට ගිලීමලය ගම පූජා කිරීම. (බදුවලින් නිදහස් කිරීම)

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.**

- සිසුන් කණ්ඩායම් තුනකට බෙදන්න.
- ඇමුණුම් අංක 1.3.1හි ක්‍රියාකාරකම් පත්‍රිකා තුන කණ්ඩායම්වලට ලබා දෙන්න.
- ක්‍රියාකාරකමට A3 හෝ බ්‍රිස්ටල් බෝඩ් එකක පන්තියට ම පෙනෙන සේ බිත්තියේ ඇලවීමට සුදුසු පරිදි සකස් කර තමාට ලැබුණු මාතෘකාවට අදාළ තොරතුරු ලියා ගන්න.
- ක්‍රියාකාරකම සිදු කිරීමට සිසුන්ට සහාය වන්න.
- සිසු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- ඉදිරිපත් වන කරුණු සමග පාඩම සමාලෝචනය කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- විදේශ ආධිපත්‍යයෙන් රට මුදා ගැනීම සඳහා විජයබාහු රජුගෙන් සිදු වූ සේවය අගය කිරීම
- පළමුවන විජයබා රජුගේ ආගමික හා ආර්ථික සේවාව විස්තර කිරීම
- නිවැරදි කරුණු ඇසුරින් මාතෘකාවට අදාළ ව වාර්තාව සකස් කිරීම
- කණ්ඩායම් හැගීමෙන් කටයුතු කිරීම
- නියමිත කාලයට නිම කිරීම

ඇමුණුම් අංක 1.3.1 කාර්ය පත්‍රිකාව

**අංක 01**

පහත සඳහන් අනුමාතෘකා යටතේ පළමුවන විජයබාහු රජුගේ දේශපාලන සේවාව පිළිබඳ කෙටි වාර්තාවක් සකස් කර එය පන්තියට ඉදිරිපත් කරන්න.

පළමුවන විජයබාහුගේ ළමා කාලය
රුහුණේ පාලකයා වීම
දිවයින එක්සේසත් කිරීම

**අංක 02**

පළමුවන විජයබාහු රජුගේ ආර්ථික කටයුතු පිළිබඳ කෙටි වාර්තාවක් සකස් කර පන්තියට ඉදිරිපත් කරන්න.

**කාර්ය පත්‍රිකා 03**

පළමුවන විජයබාහු රජුගේ ආගමික සේවාව පිළිබඳ කෙටි වාර්තාවක් සකස් කර පන්තියට ඉදිරිපත් කරන්න.

**නිපුණතාව** : ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 1.4 පොලොන්නරුව රාජධානියේ මහා පරාකමබාහු යුගය පිළිබඳ විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- මහා පරාක්‍රමබාහු රජු පිළිබඳ තොරතුරු විස්තර කරයි.
- මහා පරාක්‍රමබාහු රජු මුහුණ දුන් අභියෝග පෙන්වා දෙයි.
- මහා පරාක්‍රමබාහු රජතුමා පාලකයකු ලෙස තම රටට කළ සේවාව අගය කරයි.

**ආකල්ප හා වටිනාකම් :**

- රටට ආදරය හා ගෞරව කිරීමට පෙලඹීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1.4.1 කාර්ය පත්‍රිකාව

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**1.4 මහා පරාක්‍රමබාහු රජතුමා**

දේශපාලන තොරතුරු

- මානාභරණ හා රත්නාවලී දෙමව්පියන් වීම
- කැගල්ලේ දැදිගම උත්පත්තිය සිදු වීම
- ක්‍රි.ව. 1140 දක්ෂිණ දේශයේ පාලකයා බවට පත් වීම (පඬුවස් නුවර මුල් කොට ගෙන)
- පරාක්‍රමබාහු රජු හා පොලොන්නරු පාලක ගජබාහු අතර ගිවිසුමක් ඇති කර ගැනීම. එහි පිටපත් සංගමු විහාරයෙන් හා මැදිරිගිරියෙන් සොයා ගැනීම.
- ක්‍රි.ව. 1153 ගජබාහුගේ අභාවයෙන් පරාක්‍රමබාහු පොලොන්නරුවෙහි බලයට පත් වීම.
- සුගලා බිසව සමග සටන් කොට දළදා වහන්සේ ලබා ගැනීමෙන් රාජ්‍යත්වය ස්ථාවර කර ගැනීම
- බුරුමය හා දකුණු ඉන්දියාව ආක්‍රමණය කිරීම

ආර්ථික කටයුතු

- ආර්ථික කටයුතු අදියර දෙකකින් යුක්තයි.
  - දක්ෂිණ දේශ පාලකයාව සිටිය දී
  - දිවයිනේ ම පාලකයාවීමෙන්

- ''අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතුය'' යන ආදර්ශයට අනුව කටයුතු කිරීම



ඡායාරූපය 1.4.1 පරාක්‍රම සමුද්‍රය

- දක්ෂිණ දේශපාලකයාව සිටිය දී දැදුරු ඔය තුන්පලකින් හරස් කොට (කොට්ඨ බද්ද, සුකර නිජ්ඣර, දෝරාදත්තික) විශාල වාරිකර්මාන්තයක් කළේ ය.
- එම කාලයේ දී පඬාවැව විශාල කිරීම
- මහාවංසයේ සඳහන් වන්නේ දක්ෂිණ පාලකයා වශයෙන් සිටිය දී වැව් 58ක් නිම වූ බවත් ඉන් 37ක් නාමිකව දක්වා ඇත.
- දිවයිනේ ම පාලකයා වූ පසු පොලොන්නරුවෙහි පරාක්‍රම සමුද්‍රය නිර්මාණය කිරීම
- පස්දුන් කෝරළය අස්වැද්දීම

වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම

- අඹන් ගඟ අංග මැඩිල්ල ස්ථානයේ අමුණක් බැඳ පරාක්‍රම සමුද්‍රයට ජලය ගෙන යාම
- මහාවංසයට අනුව මහවැව්, කුඩා වැව්, ඇළ මාර්ග විශාල සංඛ්‍යාවක් කර වූ බව සඳහන් වීම



ඡායාරූපය 1.4.2 අංගමැඩිල්ල අමුණ

- ආගමික කටයුතු
  - දිඹුලාගල කාශ්‍යප හිමිගේ මූලිකත්වයෙන් ශාසන ශෝධනයක් කිරීම
  - පොලොන්නරු භික්ෂු කතිකාවතින් සංඝ සමගියක් ඇති කිරීම
  - ආගමික ගොඩනැගිලි ඉදි කිරීම (අලාහන පිරිවෙන, රූපවතී ස්තූපය, ලංකාතිලක පිළිම ගෙය, ගල් විහාරය)



**ඡායාරූපය 1.4.3 ආලාහන පිරිවෙනෙහි නටබුන්**

  - උත්තරාරාමය හෙවත් ගල් විහාරය නිර්මාණය කිරීම
  - ආගමික ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම
  - (රුවන්වැලි සෑය, අභයගිරිය, ජේතවනය, මිරිසවැටිය)
  - සුගලා දේවියගෙන් දළදාව රැගෙන පොලොන්නරුවෙහි තැන්පත් කොට පුද සත්කාර කිරීම
  - ධර්ම ශාස්ත්‍රීය සේවය දේශ දේශාන්තරවල පැතිර යෑම



**ඡායාරූපය 1.4.4 පොලොන්නරුවේ ලංකාතිලක පිළිමගෙය**

**ඉහත විෂය කරුණු අන්තර්ගත වන සේ ඇමුණුම් අංක 1.4.1 හි ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.**

- පන්තියේ ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- එක් කණ්ඩායමකට ඇමුණුම් අංක 1.4.1හි එක් ක්‍රියාකාරකම් පත්‍රිකාවක් ලැබෙන්නට සලස් වන්න.
- කාර්ය පත්‍රිකාවට අනුව ක්‍රියාකාරකම සිදු කරන්න.
- එහි දී ගුරුවරයා ශිෂ්‍යයන්ට සහාය වන්න.
- ශිෂ්‍ය ක්‍රියාකාරකම් අවසානයේ එය ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- ශිෂ්‍ය ඉදිරිපත් කිරීම්වල ප්‍රබලතා දුබලතා හඳුනා ගනිමින් පාඩම සමාලෝචනය කරන්න.
- නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

ඇමුණුම් අංක 1.4.1 කාර්ය පත්‍රිකා

**කාර්ය පත්‍රිකා 01**

පළමුවන පරාක්‍රමබාහු රජු පිළිබඳ පහත සඳහන් මාතෘකාව යටතේ කරුණු රැස් කරන්න.

- රජුගේ දේශපාලන කටයුතු

  එය A3 හෝ බ්‍රිස්ටල් බෝඩ් එකක පුවත්පත් ලිපියක් ආකාරයට සකස් කරන්න.

  ඔබේ කණ්ඩායමේ ක්‍රියාකාරකම පන්තියට ඉදිරිපත් කරන්න.

**අංක 02**

පළමුවන පරාක්‍රමබාහු රජු පිළිබඳ පහත සඳහන් මාතෘකාව යටතේ කරුණු රැස් කරන්න.

- රජුගේ ආර්ථික කටයුතු

  එය A3 කොළයක හෝ බ්‍රිස්ටල් බෝඩ් එකක පුවත්පත් ලිපියක් ආකාරයට සකස් කරන්න.

  ක්‍රියාකාරකම පන්තියට ඉදිරිපත් කරන්න.

**අංක 03**

පළමුවන පරාක්‍රමබාහු රජු පිළිබඳ පහත සඳහන් මාතෘකාව යටතේ කරුණු රැස් කරන්න.

- රජුගේ ආගමික කටයුතු

  එය A3 හෝ බ්‍රිස්ටල් බෝඩ් එක පුවත්පත් ලිපියක් ආකාරයට සකස් කරන්න.

  ක්‍රියාකාරකම පන්තියට ඉදිරිපත් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ ආර්ථික, දේශපාලන හා ආගමික සේවාව විස්තර කිරීම
- රට සංවර්ධනය කිරීම සඳහා පළමුවැනි පරාක්‍රමබාහු අනුගමනය කළ ක්‍රියාමාර්ග අගය කිරීම
- නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීම
- කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් කටයුතු කිරීම
- නායකත්ව ගුණාංග පෙන්වීම

**නිපුණතාව** : ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 1.5 පොලොන්නරු රාජධානියේ නිශ්ශංකමල්ල යුගය පිළිබඳ විග්‍රහ කරයි

**කාලච්ඡේද** : 01යි.

**ඉගෙනුම් පල** :

- නිශ්ශංකමල්ල රජතුමා පිළිබඳ තොරතුරු විස්තර කරයි.
- නිශ්ශංකමල්ල රජතුමා අභියෝග ජයගත් ආකාරය විස්තර කරයි.
- නිශ්ශංකමල්ල චරිතයෙන් ගත හැකි ආදර්ශ අගය කරයි.

**ආකල්ප හා වටිනාකම් :**

- අභියෝගවලට සාර්ථක ව මුහුණ දීමේ ශක්තිය වර්ධනය කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 1.5.1 ක්‍රියාකාරකම
- www.sundaytimes.lk/080203/funDay/mahawamsa.html.lanka.com/about/attractions/nissankamallas - palace

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.

**1.5 නිශ්ශංකමල්ල රජතුමා**

දේශපාලන කටයුතු

- දෙවන විජයබාහු රජුගෙන් පසු පොලොන්නරුවේ රජකමට පත්වීම
- කාලිංග වංශික අයෙකු වීම හා ඉන්දියාවේ කාලිංග දේශයේ සිංහපුරයේ උපත සිදු වීම
- දිවයින එක්සත්ව පවත්වා ගෙන යාමට කටයුතු කිරීම
- ලංකාවේ ඈපා, මාපා තනතුරු හොබවා රජකමට පත්වීම
- රජවීමේ දී අභියෝග රාශියක් පැවතීම. (විජාතිකවීම, පරාක්‍රමබාහුගේ කීර්තිය, රාජ නිලධාරී තර්ජන, රෝහණ ජනතා තර්ජන, චෝළ පාණ්ඩ්‍ය තර්ජන)

- එම අභියෝග ජය ගැනීම සඳහා සෙල්ලිපි පිහිටුවා එහි තම උරුමයේ අයිතිය පෙන්වාදීමට කටයුතු කිරීම
- මෙතුමා ජනතා විශ්වාසය දිනාගත් රජකු වීම. (බුදු දහම වැළඳ ගැනීම, රටපුරා සංචාරය කිරීම, වෙහෙර විහාර තැනවීම, බදු අඩු කිරීම, දළදා මැදුර නිර්මාණය කිරීම, දාන දීම.)
- සෙල්ලිපිවලට අනුව දිවයිනම පාලනය කිරීම
- ලක්දිව වැඩිම සෙල්ලිපි පිහිට වූ රජතුමා වීම

ආගමික කටයුතු

- තුන් නිකාය එක්සත් කළ බව සෙල්ලිපිවල සඳහන් වීම
- දළදා වහන්සේ තැන්පත් කිරීම සඳහා හැටදාගෙය නිර්මාණය කිරීම
- දඹුලු විහාරය ප්‍රතිසංස්කරණය කොට ස්වර්ණගිරි ගුහා ලෙස නම් කිරීම
- බෞද්ධ විහාරස්ථාන වැඳපුදා ගැනීම
  (කැලණිය, මහියංගණය, ශ්‍රී පාදය, මාගම)
- පිරිත් ශ්‍රවණය හා දළදා වන්දනයට නිශ්ශංකලතා මණ්ඩපය නිර්මාණය කිරීම
- රන්කොත් වෙහෙර, සත්මහල් ප්‍රාසාදය ඉදි කිරීම


රූපය 1.5.1 සත්මහල් ප්‍රාසාදය


රූපය 1.5.2 නිශ්ශංකලතා මණ්ඩපය


රූපය 1.5.3 දඹුලු විහාරය


රූපය 1.5.4 හැටදාගෙය

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ ඇමුණුම් අංක 1.5.1හි ක්‍රියාකාරකම සඳහා ශිෂ්‍යයන් යොමු කරන්න.**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- ක්‍රියාකාරකම සඳහා දින දෙකක කාලයක් ලබා දෙන්න.
- සියලු ක්‍රියාකාරකම් ඇගයීමට කරන්න.
- නිර්ණායක අනුව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- නිශ්ශංකමල්ල රජතුමා මුහුණ දුන් අභියෝග විස්තර කිරීම
- නිශ්ශංකමල්ල රජතුමා අභියෝග ජයගත් ආකාරය පෙන්වා දීම
- නිවැරදි කරුණු ඇසුරින් නිශ්ශංකමල්ල රජතුමා පිළිබඳ රචනාවක් ලිවීම
- පැහැදිලි ව, තර්කානුකූල ව, ප්‍රමාණාත්මක ව රචනාව ගොඩනැගීම
- නියමිත කාලයට භාර දීම

ඇමුණුම් අංක 1.5.1 ක්‍රියාකාරකම

- මුහුණ දුන් අභියෝග
- අභියෝග ජයගත් ආකාරය
- චරිතයෙන් ලබා ගත හැකි ආදර්ශ
- ඉහත තොරතුරු අනුව නිශ්ශංකමල්ල රජු පිළිබඳ රචනාවක් ලියන්න.

**නිපුණතාව** : ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : පොලොන්නරුව රාජධානිය බිඳ වැටීම පිළිබඳ විග්‍රහ කරයි.

**කාලච්ඡේද** : 01යි.

**ඉගෙනුම් පල** :

- පොලොන්නරු රාජධානිය බිඳ වැටීමට හේතු පැහැදිලි කරයි.
- පාලකයින්ගේ ක්‍රියාකලාපය රාජ්‍යයක නැගීම සහ වැටීම කෙරෙහි බලපාන ආකාරය පෙන්වා දෙයි.
- උන්නතිකාමී පාලකයින් පත්වීමේ වටිනාකම අගයයි.

**ආකල්ප හා වටිනාකම් :**

- නායකත්ව භාර ගැනීම හා නායකයින් ශක්තිමත්ව කටයුතු කළ ආකාරය පිළිබඳ දැනුම ලබා ගැනීම.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම් අංක 1.6.1 කාර්ය පත්‍රිකාව

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**1.6 පොලොන්නරුව බිඳ වැටීම**

- පොලොන්නරුව රාජධානිය බිඳ වැටීමට හේතු
  - පාණ්ඩ්‍ය හා කාලිංග පෙළපත් අතර ඇති වූ බල අරගලය
  - දක්ෂ රජවරු බිහි නොවීම (1186 සිට 1215 දක්වා පාලකයන් 12 ක් බිහි වීම)
  - උදාහරණ වීරබාහු මෙම රජු එක් දිනක් පමණක් රජ කර ඇත. පූජාවලියට අනුව මෙම රජු රෑ රජු නමින් හඳුන්වයි. එනම් රාත්‍රී කාලයේ රාජ්‍යත්වය භාරගත් මෙතුමා උදය වන විට මරා දමා තිබීම හේතුවෙනි. ඉන්පසු පත් වූ වික්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලය මාස තුනකට සීමා විය. එලෙස පත් වූ රජවරු ඉතා කෙටි කලකින් කුමක් හෝ කුමන්ත්‍රණයක් හේතුවෙන් බලයෙන් පහකිරීම හෝ මරා දැමීම සිදු විය.
  - පරාක්‍රමබාහු රජුගේ සෙන්පතීන්ගේ ක්‍රියා කලාපය (තම අභිමත පරිදි පාලකයන් බලයට පත්වීම)
  - කාලිංග මාඝ ආක්‍රමණය හා ඉතා හිංසාකාරී පාලනය
  - රජරට වාරි කර්මාන්ත බිඳ වැටීම (මාඝ යුධ උපක්‍රමයක් ලෙස වැව් අමුණු කඩා බිඳ දැමීම)
  - වාරි කර්මාන්ත නොසලකා හැරීම

- වසංගත රෝග පැතිර යෑම
- ආර්ථික පරිහානිය



ඡායාරූපය 1.6.1 පොලොන්නරුව බිඳ වැටීමෙන් පසු අත්හැර දැමීම නිසා විනාශ වූ වාරි ශිෂ්ටාචාරය

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ ක්ෂණික කතාවක් පන්තියට ඉදිරිපත් කරවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- **පොලොන්නරුව බිඳ වැටීමට හා වර්තමානයට ඉන් ලබා ගත හැකි ආදර්ශ** යන මාතෘකාව යටතේ කතාවක් ඉදිරිපත් කිරීමට කණ්ඩායම් සූදානම් කරවන්න.
- කතාව කිරීම සඳහා ඉදිරිපත් වන ශිෂ්‍යයන් උපස්ථම්භනය කරන්න.
- අවසානයේ පාඩම සමාලෝචනය කරන්න
- ඇමුණුම 1.6.1හි කෙටි ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට ශිෂ්‍යයන් යොමු කරන්න. එය පසුවැඩක් ලෙස යොදා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- පොලොන්නරුව බිඳ වැටීමට හේතු විමසීම
- පොලොන්නරු රාජධානියේ දුර්වල පාලකයන් පිළිබඳ කරුණු පහදා දීම
- උන්නතිකාමී රජවරුන්ගේ අවශ්‍යතාව පෙන්වා දීම.
- ක්ෂණික කතාව සඳහා ඉදිරිපත් කිරීම
- සහයෝගයෙන් කටයුතු කිරීම

ඇමුණුම් අංක 1.6.1

කාර්ය පත්‍රිකාව

කේවල ක්‍රියාකාරකමක් ලෙස පහත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට යොදවන්න. පෙළ පොත ද භාවිත කරමින් ක්‍රියාකාරකම සිදු කිරීමට උපදෙස් ලබා දෙන්න.)

1. නිශ්ශංකමල්ල රජුගේ පසු බලයට පත් රජවරු සිවු දෙනෙකු නම් කරන්න.
2. තෙවරක් බලයට පත් වුණු රැජින නම් කරන්න.
3. දවසක් මෙරට පාලනය කළ පාලකයා නම් කරන්න.
4. පොලොන්නරු රාජධානියේ අවසාන පාලකයා කවුද?
5. පොලොන්නරු පරිහානියට බලපෑ රාජවංශ දෙකක් නම් කරන්න.
6. පොලොන්නරු රාජ්‍යය බිඳ වැටීමට බලපෑ ආසන්නතම හේතුව කුමක් ද?
7. පොලොන්නරු රාජධානිය පරිහානියට බලපෑ සෙසු කරුණු තුනක් දක්වන්න.

# 02
# පොලොන්නරුව බිඳ වැටීමෙන් පසුව බිහි වූ රාජධානි

**හැඳින්වීම**

ජලාශ්‍රිත ශිෂ්ටාචාරයක් ලෙස ගොඩනැගුණ රජරට ශිෂ්ටාචාරයෙහි පොලොන්නරු යුගය දීර්ඝ කාලයක් ශක්තිමත්ව පැවතුණි. එහෙත් දුර්වල පාලකයින් පත්වීම, විදේශ ආක්‍රමණ ආදිය හමුවේ දුර්වල වූ මෙය මාඝ නම් විදේශීය ආක්‍රමණිකයා නිසා බිඳ වැටුණි. පසුව දඹදෙණියෙන් ආරම්භ වූ දේශීය රාජධානි කෙටි කාලයක් තුළ යාපහුව, කුරුණෑගල, ගංපළ සහ කෝට්ටේ යන ස්ථානවලට මාරුවීම සිදු විය. ඒ පිළිබඳ අවධානය කිරීම මෙම ඒකකය මගින් සිදු කෙරේ.

**නිපුණතාව** : ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 2.1 දඹදෙණි රාජධානිය පිළිබඳ තොරතුරු විමසා බලයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- පොලොන්නරු යුගයෙන් පසු රාජධානි විතැන්වීමට හේතු පහදයි.
- දඹදෙණිය රාජධානියේ වැදගත්කම විස්තර කරයි.
- දෙවන පරාක්‍රමබාහු රජු දඹදෙණිය රාජධානියේ උන්නතියට දැක් වූ දායකත්වය පෙන්වා දෙයි.

**ආකල්ප හා වටිනාකම් :**

- දූරදර්ශී දක්ෂ නායකයන්ට සාර්ථකත්වය ලබා ගැනීමට හැකි බව අවබෝධ කර ගැනීම

**ගුණාත්මක යෙදවුම් :**

- www.mahawansaya.com/SriLanka-era-dambadeniya-7 html
- life.dailymirror.lk/articale/food/Dambadeniya-kingdom-and-the.golden-era
- amasinglanka.com/wp/dambadeniya/sinhalees-leterature30/17265

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

- **රජරට ශිෂ්ටාචාරයෙන් පසු බිහි වූ රාජධානි**

**දඹදෙණි රාජධානිය**

- රජරට වාරි ශිෂ්ටාචාරය විනාශවීමත් සමග ජනයා මලය රටට හා නිරිත දෙසට සංක්‍රමණය වීම
- රජරට කුඩා වැව් ආශ්‍රිතව සුළු ජන කොටසක් රැඳී සිටීම
- මාඝගේ කෲර පාලනය නිසා රජරට ප්‍රධානීහු ආරක්ෂිත ස්ථානයන්හි පාලන මධ්‍යස්ථාන පිහිටු වීම

- **වන්නි (තෙවන) විජයබාහු (ක්‍රි.ව 1232 - 1236)**

- කාලිංග මාඝ ආක්‍රමණය (ක්‍රි.ව 1215) හේතුවෙන් සිංහල රාජධානි නිරිත දිගට විතැන් වීම
- එහි පළමු රාජධානිය දඹදෙණි රාජධානිය වීම
- තුන්වන විජයබාහු හෙවත් වන්නි විජයබාහු එහි ආරම්භක පාලකයා වීම
- කොත්මලේ වැඩසිටි දළදා වහන්සේ වාචිස්සර තෙරුන්ගේ මූලිකත්වයෙන් බෙලිගලට වැඩමවා රාජ්‍යය ස්ථාවර කර ගැනීම.
- තුන්වන විජයබාහු රජු බුදුදහමේ දියුණුවට කටයුතු සිදු කිරීම
  - විජය සුන්දරාරාමය නිර්මාණය කිරීම
  - වත්තල විජයබාහු විහාරය නිර්මාණය කිරීම
  - අත්තනගලු, තොටගමු විජයබා, කැලණි විහාර ප්‍රතිසංස්කරණය කිරීම
  - සංඝරක්ඛිත හිමිගේ මූලිකත්වයෙන් සංඝ සංශෝධනයක් කිරීම
  - උගත් පඬිවරු ලවා බෞද්ධ පත පොත ලියවීම
  - උපසම්පදා විනය කර්ම සිදු කිරීමට උදව් කිරීම

- **දෙවන පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1236 - 1270)**
  - **දේශපාලන තොරතුරු**

- දඹදෙණි යුගයේ ශ්‍රේෂ්ඨතම පාලකයා
- මෙතුමා පිළිබඳව පූජාවලිය, මහාවංසය, හත්තවනගල්ල විහාරවංසය යන මූලාශ්‍රය තුළින් තොරතුරු අනාවරණය වීම
- ක්‍රි.ව. 1247 ජාවක පාලක වූ චන්ද්‍රභානු ආක්‍රමණය ජය ගැනීමට සමත් වීම (චන්ද්‍රභානු දේවතාවක් ආක්‍රමණය කරන ලදි.)

- ක්‍රි.ව. 1255 කාලිංග මාඝගෙන් පොලොන්නරුව මුදා ගැනීම සඳහා පාණ්ඩ්‍ය සහය ඇතුව ආක්‍රමණය කොට පොලොන්නරුව ජයග්‍රහණය කිරීම

- ආගමික තොරතුරු

  - බෙලිගල තැන්පත් කොට තිබූ දළදා වහන්සේ දඹදෙණියට වැඩමවා එහි තැන්පත් කිරීම
  - ශ්‍රී පාදය, විජය සුන්දරාරාමය, මහියංගණය, බෙන්තර ගලපාත විහාරය, අත්තනගලු විහාරය ප්‍රතිසංස්කරණය කිරීම
  - ධර්මධර විනයධර උගත් භික්ෂූන් ඉන්දියාවෙන් වැඩම කරවා මෙරට භික්ෂූන් ධර්මශ්‍රවණය ලබා දීම
  - දඹදෙණි කතිකාවත සම්පාදනය කිරීම.
  - වනවාසී සම්ප්‍රදායක් ඇරඹීම සඳහා පලාබත්ගල වන සෙනසුන නිර්මාණය කිරීම.
  - පොලොන්නරුවෙහි පොහොය සීමාවේ දී උපසම්පදා උත්සවයක් පවත්වා ශාසනික තනතුරු පිරිනැමීම
  - රජු විසින් විශුද්ධි මාර්ග සන්නය වන විනස සන්නය, කව්සිළුමිණ රචනා කිරීම
  - රජු කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් හැඳින්වීම

ඉහත විෂය කරුණු ආවරණය වන සේ පුවත්පත් වාර්තාවක් සැකසීමට සිසුන් යොමු කරන්න.

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- ''**දඹදෙණි යුගයේ ශ්‍රේෂ්ඨතම පාලකයා දෙවන පරාක්‍රමබාහු රජුය**'', මෙම මාතෘකාව අනුව පුවත්පත් ලිපියක් සැපයීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.
- ලිපිය සැකසීම සඳහා දින දෙකක කාලයක් ලබා දෙන්න.
- ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඇගයීම කරන්න.
- නිර්ණායක අනුව තක්සේරුව හා ඇගයීම සිදු කරන්න.
- සාර්ථක ලිපි තෝරා පන්තියේ සෙසු අයටත් කියවීමට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- දඹදෙණි රාජධානිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- දෙවන පරාක්‍රමබාහු රජුගේ සේවාව අගය කර කරුණු ඉදිරිපත් කිරීම
- නිවැරදි තොරතුරු සඳහන් කිරීම
- වාර්තාව පැහැදිලි ව ප්‍රමාණාත්මක ව සකස් කිරීම
- නියමිත කාලයට නිම කිරීම

**නිපුණතාව** : ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 2.2 යාපහුව රාජධානි යුගයේ සිට ගම්පොළ යුගය අවසානය දක්වා දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික තොරතුරු විමසා බලයි.

**කාලච්ඡේද** : 02 යි.

**ඉගෙනුම් පල** :

- යාපහුව, කුරුණෑගල හා ගම්පොළ රාජධානි පිළිබඳ විස්තර කරයි.
- නිරිත දිග රාජධානි වූ රාජධානි කෙටි කලකින් අවසන්වීමට හේතු විස්තර කරයි.
- ඒ ඒ රාජධානි තුළ දී බුදුදහමට සිදු වූ සේවාව විස්තර කරයි

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 2.2.1 ක්‍රියාකාරකම් පත්‍රිකා
- lanka.com/about/destinations/yapahuwa
- ekurunegala.lk/ekuruneg-history
- kalanir.freehostia.com/gampola.html

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**2.2 යාපහුව රාජධානි යුගයේ සිට ගම්පොළ යුගයේ අවසානය දක්වා**

**යාපහුව රාජධානිය**

- කාලිංග මාඝ ආක්‍රමණය නිසා සුභ පබ්බතය මුල් කොට බලකොටුවක් නිර්මාණය කිරීම
- එය පසුකාලීන ව යාපහුව රාජධානිය ලෙස ආරම්භ වීම
- පළමුවන බුවනෙකබාහු රජු (ක්‍රි.ව. 1272 - 1284) මෙහි ප්‍රථම පාලකයා වීම
- බුවනෙකබාහු රජුට විරුද්ධව කැරලි ඇති වීම
- (කඳලිවාට, ආපාණ, තිප, හිමියානක යන කැරලි කරුවන්)
- පළමුවන කාලිංගරායර්, චෝඩංගදේව යන දමිළ සතුරන්ගෙන් ද අභියෝග එල්ල වීම
- එමනිසා ආරක්ෂාව සඳහා යාපහුව තෝරා ගැනීම
- රජු ඊජිප්තු සුල්තාන් වරයා සමග සබඳතා ඇති කර ගනිමින් වෙළෙඳාම දියුණු කිරීම

- ආගමික කටයුතු

    - ත්‍රිපිටකය ලියවා ධර්ම පොත සුලභ කිරීම
    - උපසම්පදා උත්සව පැවැත්වීම
    - දළදා වහන්සේ යාපහුවේ තැන්පත් කිරීම
    - මහාවංසයට අනුව දෙවන බුවනෙකබාහු හා පරාක්‍රමබාහු කුමාරයා අතර තිබූ ආරවුල් තත්ත්වය නිසා දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය අධිරාජ්‍යයා දළදා වහන්සේ හා පාත්‍රා ධාතුව රැගෙන යාම
    - පරාක්‍රමබාහු කුමරු පාණ්ඩ්‍ය කුලසේකර රජු සමග මිත්‍ර සබඳතා ගොඩනගා ගනිමින් දළදාව හා පාත්‍ර ධාතුව ලබා ගැනීම
    - පරාක්‍රමබාහු කුමරු තුන්වන පරාක්‍රමබාහු ලෙස පොලොන්නරුවේ බලයට පත්වීම.
    - දළදා මැදුරක් පොලොන්නරුවේ තනවා දළදා වහන්සේ එහි තැන්පත් කිරීම
    - තුන්වන පරාක්‍රමබාහු පරදා දෙවන බුවනෙකබාහු දළදාව හා පාත්‍ර ධාතුව නැවතත් යාපහුවට වැඩමවීම
    - දෙවන බුවනෙකබාහු රජු උපසම්පදා උත්සව නවයක් පවත්වා තිබීම
    - භික්ෂු විනය සම්බන්ධයෙන් විධාන පනවා තිබීම
    - මහා සංඝයා වහන්සේලාට ශාසනික තනතුරු පිරිනැමීම

**2.2.2 කුරුණෑගල රාජධානිය (ක්‍රි.ව 1300 - 1341)**

- දෙවන බුවනෙකබාහු රජු රාජධානිය කුරුණෑගලට මාරු කිරීම
- දෙවන බුවනෙකබාහු රජුගෙන් පසු ඔහු පුත් හතරවන පරාක්‍රමබාහු 1302 දී බලයට පත්වීම.
- එතුමා කුරුණෑගල යුගයේ ශ්‍රේෂ්ඨ පාලකයෙකු වීම
- මොහුගේ බලය මලය කඳුකරය දක්වා ද දකුණින් මුහුදු තීරය දක්වා පැතිරී තිබීම

- ආගමික කටයුතු

    -
    - කුරුණෑගල දළදා මාලිගාවක් තනා දළදා වහන්සේ තැන්පත් කිරීම
    - මහනුවර අස්ගිරි විහාරය නිර්මාණය කිරීමට අනුග්‍රහය දැක්වීම
    - දළදා සිරිත, එළු බෝධි වංශය, අනාගත වංශය, ධාතු මංජුසා කෘති රචනා කිරීමට අනුග්‍රහය දැක්වීම
    - පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීමට අනුග්‍රහය දැක්වීම
    - තොටගමු වෙහෙර ප්‍රතිසංස්කරණය කොට ගම්බිම් පූජා කිරීම
    - දෙවුන්දර පටිමාඝරය වැලිගම විහාරයේ දීඝ පාසාදය නිර්මාණය කිරීම

### 2.2.3 ගම්පොළ රාජධානිය (ක්‍රි.ව. 1341 - 1351)

- හතරවන බුවනෙකබාහු ගම්පොළ ආරම්භක පාලකයා වීම
- ආරක්ෂිත ස්ථානයක් ලෙස ගම්පොළ වැදගත් වීම
- මෙහි ප්‍රභූ පවුල් දෙකක වූ සේනාලංකාර හා අළගක්කෝනාර අතර රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා ඇති වූ තරගය

- හතරවන බුවනෙකබාහු රජු (ක්‍රි.ව. 1341 1351)
  - ගංපළ අගනුවර කරගෙන බලයට පත්වීම
  - ඔහු ත්‍රිසිංහලාධීශ්වර නාමයෙන් හැඳින්වීම
  - අගමැති ලෙස සේනාධිලංකාර කටයුතු කිරීම
  - දෙවනගල වනරතන හිමිගේ මූලිකත්වයෙන් ශාසන ශෝධනයක් කිරීම
  - සේනාධිලංකාර අගමැති ලංකාතිලක විහාරය නිර්මාණය කිරීම
  - මෙකල සීලවංශ ධම්මත්ති හිමි ගඩලාදෙණිය විහාරය නිර්මාණය කිරීම

- තුන් වන වික්‍රමබාහු (ක්‍රි. ව. 1357 - 1374)
  - මොහුට බලය ලබා ගැනීමට නිශ්ශංක අළගක්කෝනාර හා භාස්කර ජයමහලැන නම් ප්‍රභූවරු උදව් කිරීම
  - නිශ්ශංක අළගක්කෝනාර අගමැති ලෙස කටයුතු කිරීම
  - මෙකල යාපන ආර්ය චක්‍රවර්තීන්ගේ බලපෑම් මැඩපවත්වන ලදී
  - නියම්ගම්පාය හා කැලණිය විහාර රජු ප්‍රතිසංස්කරණය කිරීම

- පස්වන බුවනෙකබාහු රජු (ක්‍රි. ව. 1374)
  - නිශ්ශංක අළගක්කෝනාර අගමැති ලෙස කටයුතු කිරීම
  - නිශ්ශංක අළගක්කෝනාර විසින් ප්‍රහාර එල්ල කොට බටහිර රෙළෙහි වෙළඳ බලය අල්ලා සිටි ආර්ය චක්‍රවර්තීන් පන්නා දැමීම
  - වීර අලකේශ්වර ගංපළ බුවනෙකබාහු රජු බලය පිළිනොගෙන රයිගම පාලනය කිරීම
  - චීන ජාතික චෙංහ විසින් වීර අලකේශ්වර ක්‍රි.ව. 1411 දී චීනයට පැහැරගෙන යාම
  - චීන අධිරාජ්‍යයා ලංකාවේ පාලකයා ලෙස පරාක්‍රම ඈපා පත් කිරීම

**2.2.4 යාපනය රාජධානිය**

- පොලොන්නරුව බිඳ වැටීමෙන් පසු 13 වන සියවසේ දී පමණ යාපනය ප්‍රාදේශිය රාජ්‍යයක් ලෙස නැගී ඒම.
- ආර්යචක්‍රවර්තී රජවරු
- විජය කුලංකෛ රජු යාපනය රාජ්‍ය ආරම්භ කිරීම.
- ආර්ය චක්‍රවර්තී රජවරු යටතේ රාජ්‍ය වර්ධනය වීම.
- ක්‍රි. ව. 1619 දී පෘතුගීසීන්ට යාපනය රාජ්‍යය යටත් වීම.

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ ඇමුණුම 2.2.1 ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් සේ යොදා ගන්න.
- ඇමුණුම 2.2.1හි වගු එක් කණ්ඩායමකට එකක් වන සේ ලබා දෙන්න.
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ක්‍රියාකාරකම පිළිබඳව ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- වගුව කණ්ඩායම් පත්‍රිකාවේ සටහන් කර ගන්නා ලෙස උපදෙස් දෙන්න.
- කණ්ඩායමට ලැබුණු වගුව සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.
- වගුව සම්පූර්ණ කළ පසු එය පන්තියට ඉදිරිපත් කරවන්න.
- මේ සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ඒ ඒ රාජධානිවල රජවරුන්ගේ සේවාවන් වගුගත කිරීම
- බුදුදහමේ දියුණුවට සිදු කළ සේවාවන් පෙන්වා දීම
- නියමිත කාලයට අවසන් කිරීම
- කරුණු ඉදිරිපත් කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කිරීම
- මෙම යුගවලට අයත් සාහිත්‍ය ග්‍රන්ථ හැඳින්වීම

ඇමුණුම 2.2.1

වගුව අංක 1 යාපහුව රාජධානිය පිළිබඳ තොරතුරු ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| රජවරු | ඓතිහාසික තොරතුරු | ආර්ථික කටයුතු | ආගමික ගොඩනැගිලි | ලියවුණු පොත්පත් | ගිහි පැවිදි උගතුන් |
|---|---|---|---|---|---|
| | | | | | |

වගුව අංක 2 කුරුණෑගල රාජධානිය පිළිබඳ තොරතුරු ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| රජවරු | ඓතිහාසික තොරතුරු | ආර්ථික කටයුතු | ආගමික ගොඩනැගිලි | රචනා කළ පොත් පත් | ගිහි පැවිදි උගතුන් |
|---|---|---|---|---|---|
| | | | | | |

වගුව අංක 3 ගම්පොළ රාජධානිය පිළිබඳ තොරතුරු ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| රජවරු | ඓතිහාසික තොරතුරු | ආර්ථික කටයුතු | ආගමික ගොඩනැගිලි | රචනා කළ පොත් පත් | ගිහි පැවිදි උගතුන් |
|---|---|---|---|---|---|
| | | | | | |

**නිපුණතාව** : ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 2.3 කෝට්ටේ රාජධානිය පිළිබඳ තොරතුරු විමසා බලයි

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- කෝට්ටේ යුගය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- හයවන පරාක්‍රමබාහු රජු කෝට්ටේ යුගයේ ශ්‍රේෂ්ඨ රජු ලෙස පෙන්වා දෙයි.
- කෝට්ටේ යුගය ඇසුරෙන් තොරතුරු වගුගත කරයි.

**ආකල්ප හා හර පද්ධතිය :**

- රට ආරක්ෂා කළ අතීත පාලකයින් පිළිබඳ ගෞරව කිරීම

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 2.3.1 ක්‍රියාකාරකම
- amasinglanka.com/wp/kotte

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**2.3 කෝට්ටේ රාජධානිය**

- නිශ්ශංක අළගක්කෝනාර විසින් ගොඩනගන කෝට්ටේ බලකොටුව මුල් කොට ගෙන රාජධානිය ආරම්භ වීම
- හයවන පරාක්‍රමබාහු රජු කෝට්ටේ ආරම්භක පාලකයා වීම
- කෝට්ටේ රාජධානිය පිළිබඳ හැදෑරීමට ඇති මූලාශ්‍රය
- රාජාවලිය
- පරවි සන්දේශය
- සැළලිහිණි සන්දේශය
- ගිරා සන්දේශය
- කෝකිල සන්දේශය
- අලකේශ්වර යුද්ධය
- සද්ධර්ම රත්නාකරය
- පැරකුම්බා සිරිත
- කාව්‍ය ශේඛරය
- ගුත්තිල කාව්‍ය

- ඔරුවල සන්නස
- ගාල්ලේ ත්‍රිභාෂා ශිලා ලේඛනය ඇතුළු සෙල්ලිපි

- හය වන පරාක්‍රමබාහු රජතුමා

    - ජයමහාලැන සිටුවරයා සහ, සුනේත්‍රාදේවි මෙතුමාගේ දෙමාපියන් වීම
    - දකුණු ඉන්දියාවේ අතිවීරරාම ගෙන වාර්ෂික ව බදු ලබා ගැනීම
    - සපුමල් කුමරු යවා යාපන හා වන්නි රාජ්‍ය පරාජය කිරීම
    - 1462 දී උඩරට ජෝතිය සිටාණන්ගේ කැරැල්ල මර්දනය කිරීම. ඊට අම්බුළුගල කුමරු පිටත් කිරීම
    - අවසන්වරට දිවයින ම එක්සේසත් කළ පාලකයා වීම
    - මෙතුමා යටතේ දිවයිනේ එක්සත් හා සාමකාමී පාලනයක් ඇති වීම
    - හයවන පරාක්‍රමබාහු රජුගෙන් පසු උරුමකරුවෙකු නොසිටි බැවින් එතුමන්ගේ දියණියගේ (උලකුඩය දේවිය) පුත් ජයබාහු රජකමට පත් වීම
    - එවකට යාපනයේ රාජ්‍යය භාරව සිටි සපුමල් කුමරු ජයබාහු රජු ජීවිතක්ෂයට පත් කර කෝට්ටේ හයවන බුවනෙකබාහු නමින් රජ වීම
    - හත්වන බුවනෙකබාහු අටවන වීර පාරාක්‍රමබාහු වැනි රජවරු පාලනය කිරීම හා එම කාලසීමා තුළ ශක්තිමත් පාලනයක් සිදු නොවීම

ආගමික කටයුතු

- හයවන පරාක්‍රමබාහු රජතුමා තම මව සිහිවීම සඳහා පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙන නිර්මාණය කිරීම
- ප්‍රතිසංස්කරණය කළ දේවස්ථාන
- ශ්‍රී පාදය, අත්තනගළු විහාරය, ගඩලාදෙණිය, ලංකාතිලකය, මහියංගණය, කැලණිය.

- හයවන පරාක්‍රමබාහු රජු අනුග්‍රහය දැක් වූ එකල තිබූ පිරිවෙන්
    - කැරගල පද්මාවතී පිරිවෙණ
    - තොටගමුවේ විජයබා පිරිවෙණ
    - දෙවුන්දර ඉරුගල් කුලතිලක පිරිවෙණ
    - වත්තල වනවාස පිරිවෙණ
    - වීදාගම ඝණානන්ද පිරිවෙණ

- එකල සිටි ප්‍රසිද්ධ උගතුන්
    - තොටගමුවේ රාහුල හිමි
    - වීදාගම මෛත්‍රේය හිමි
    - ධම්මදින්න විමලකිත්ති හිමි
    - විල්ගම්මුල හිමි
    - පැපිලියානේ මංගල හිමි
- කෝට්ටේ දළදා මාලිගාවක් කර වීම
- හින්දු ආගම දියුණු විම නිසා අගනගරය ආසන්නයේ ඊශ්වර කෝවිලක් හා කතරගම දේවාලයක් ඉදි කිරීම.
- සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය වීම.
    - හංස සංදේශය
    - සැලලිහිණි සංදේශය
    - ගිරා සංදේශය
    - කෝකිල සංදේශය
    - පරවි සංදේශය
    - ගුත්තිල කාව්‍යය
    - කාව්‍ය ශේඛරය
    - සද්ධර්ම රත්නාකරය

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ ඇමුණුම 2.3.1 ක්‍රියාකාරකම සඳහා ශිෂ්‍යයන් යොමු කරන්න.**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- ඇමුණුම 2.3.1 වගුව පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- වගුව අභ්‍යාස පොත්වල සටහන් කොට ගැනීමට උපදෙස් දෙන්න.
- පෙළ පොත උපයෝගී කොට ගනිමින් වගුව සම්පූර්ණ කිරීමට උපදෙස් ලබා දෙන්න.
- පන්ති කාමරය තුළ වගුව සම්පූර්ණ කිරීමට කාලය ලබා දෙන්න.
- නිර්ණායක ඇසුරින් තක්සේරුව හා ඇගයීම සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- හයවන පරාක්‍රමබාහු රජු පිළිබඳ තොරතුරු විස්තර කිරීම
- කෝට්ටේ යුගයේ ලිය වූ සංදේශ කාව්‍ය නම් කිරීම
- එකල සිටි උගතුන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- නිවැරදි ව වගුව සම්පූර්ණ කිරීම
- නියමිත කාලයට කාර්යය නිම කිරීම

ඇමුණුම අංක 2.3.1 ක්‍රියාකාරකම

කෝට්ටේ රාජධානිය පිළිබඳ තොරතුරු ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| දේශපාලන තොරතුරු | ආගමික තොරතුරු | ලේඛන කලාව හා සාහිත්‍ය | උගතුන් හා පඬිවරුන් |
|---|---|---|---|
| | | | |

**නිපුණතාව** : ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 2.4 දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගයේ අවසානය බිහි වූ රාජධානි සිතියමක් ඇසුරෙන් පෙන්වා දෙයි.

**කාලච්ඡේද** : 01යි.

**ඉගෙනුම් පල** :

- පොලොන්නරු යුගය බිඳ වැටීමෙන් පසු බිහි වූ රාජධානි නම් කරයි.
- එම රාජධානි ගොඩනැගුණු අනුපිළිවෙල පෙන්වා දෙයි.
- එම රාජධානි සිතියමක ලකුණු කර නම් කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**


(ප්‍රවේශය) පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.

- අනුරාධපුරය, පොලොන්නරුව, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගංපළ, කෝට්ටේ රාජධානියේ පිහිටීම ලංකා සිතියමක් ඇසුරින් පෙන්වා දෙන්න.
- එම ස්ථාන ඇමුණුම් අංක 2.4.1හි ඇතුළත් ශ්‍රී ලංකාවේ ආකෘතික ලංකා සිතියමක ලකුණු කිරීමට උපදෙස් දෙන්න.
- ස්ථාන සිතියමේ ලකුණු කළ පසු එම රාජධානි බිහි වූ අනුපිළිවෙළ අනුව ඊතල මගින් යා කිරීමට උපදෙස් දෙන්න.
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- පන්තිකාමරය තුළ ක්‍රියාකාරකම සිදු කිරීමට කාලය ලබා දෙන්න.
- සියලු ක්‍රියාකාරකම් ඇගයීම සිදු කරන්න.
- නිර්ණායක අනුව ත්ක්සේරුව හා ඇගයීම සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- පොලොන්නරු රාජධානියට පසු බිහි වූ රාජධානි නම් කිරීම
- ඒ ඒ රාජධානි නිවැරදි ව ලංකා සිතියමේ ස්ථාන ගත කිරීම
- රාජධානි බිහි වූ අනුපිළිවෙළ ඊතල මගින් පෙන්වා දීම
- සිතියම නිවැරදි ව පිරිසිදු ව ලකුණු කිරීම
- නියමිත කාලයට කාර්ය නිම කිරීම

ඇමුණුම් අංක 2.4.1



# 03

## ශ්‍රී ලංකාවේ පෘතුගීසි පාලන සමය

ශ්‍රී ලංකාව පෙර-අපර දෙදිග මුහුදු ගමන් මාර්ගයේ ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස අතීතයේ සිට ම විවිධ රටවල් සමග සම්බන්ධතා පවත්වා ඇත. මේ නිසා යුරෝපා ජාතීන්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමු වී තිබේ. ඒ අතරින් පෘතුගීසීහු ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම යුරෝපා ජාතිය වූහ.

ක්‍රි.ව. 1505 දී පෘතුගීසි ආගමනය නිසා මෙරට දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික ක්ෂේත්‍රවල විවිධ වෙනස්කම් සිදු විය. පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීමට බලපෑ හේතු, ඔවුන් පැමිණෙන විට මෙරට පැවැති දේශපාලන තත්වය සහ ශ්‍රී ලංකාව තුළ පෘතුගීසි බල ව්‍යාප්තිය පිළිබඳව මෙම ඒකකයෙන් අධ්‍යයනය කෙරේ.

**නිපුණතාව** : ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 3.1 යුරෝපීයයන් පෙරදිගට පැමිණීම හා පෘතුගීසීන් පැමිණෙන විට ශ්‍රී ලංකාවේ පැවැති දේශපාලන තත්ත්වය විස්තර කරයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීමට හේතු ඉදිරිපත් කරයි.
- පෙරදිගට පැමිණි යුරෝපා ජාතීන් නම් කරයි.
- පෘතුගීසීන් පැමිණෙන විට ශ්‍රී ලංකාවේ දේශපාලන තත්ත්වය විස්තර කරයි.

**ආකල්ප හා හරපද්ධති:**

- අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කිරීමෙන් ඉලක්ක ජය ගත හැකි බව පිළිගනියි.
- අභියෝගවලට නොබියව මුහුණදීමේ පුරුද්ද ඇති කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම් අංක 3.1.1 කාර්ය පත්‍රිකාව
- ඇමුණුම් අංක 3.1.2 ශ්‍රී ලංකා සිතියම


**පාඩම සැලසුම සඳහා උපදෙස් :**
**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න.**

**3. යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම**


- යුරෝපා ජාතීන් නව මුහුදු මාර්ග සොයා ගෙන ලෝකයේ එතෙක් හඳුනා නොගත් රටවල් සොයා ගැනීම දේශගවේෂණය ලෙස හඳුන්වයි.
- දේශගවේෂණ කටයුතු නිසා යුරෝපා ජාතීන්ට පෙරදිගට ඒමට අවස්ථාව සැලසුණි.

- දේශගවේෂණ කටයුතුවලට යොමු වූ රටවල්
    - පෘතුගාලය
    - ස්පාඤ්ඤය
    - ඕලන්දය
    - එංගලන්තය
    - ප්‍රංශය

- ආසියාවට පැමිණි යුරෝපා ජාතීහු
    - පෘතුගීසීන්
    - ලන්දේසීන්
    - ප්‍රංශවරුන්
    - බ්‍රිතාන්‍යයන්




සිතියම අංක 3.1.1 15 වන හා 16 වන සියවස්වල යුරෝපා රටවල දේශගවේෂණ ව්‍යාපාර




**සිතියම 3.1.2 - 16 වන සියවසේ දී ශ්‍රී ලංකාව**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා ඉතිහාසය දෙවැනි වෙලුම**
**(ක්‍රි.ව. 1500 - ක්‍රි.ව 1800 දක්වා)**

- **පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණෙන විට මෙරට දේශපාලන තත්ත්වය**
  - ශ්‍රී ලංකාව කොටස් තුනකට බෙදී තිබීම.
    1. කෝට්ටේ හත්වන වීර පරාක්‍රමබාහු රජු
    2. මහනුවර සේනාසම්මත වික්‍රමබාහු රජු
    3. යාපනය පරරාජසේකරම් රජු
  - වන්නි ප්‍රාදේශීය පාලනය වන්නිවරු
  - 1505 දී ලොරෙන්සෝ ද අල්මේදා ශ්‍රී ලංකාවට පැමිණීම.

**ක්‍රියාකාරකම 01**

**ඉහත විෂය කරුණු ඉස්මතු වන සේ පහත ක්‍රියාකාරකම කරවන්න.**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- ඇමුණුම් අංක 3.1.1හි ඇතුළත් කාර්ය පත්‍රිකාව පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- ඇමුණුම් අංක 3.1.2 සිතියම ශිෂ්‍යයන්ට බෙදා දෙන්න.
- ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම සිදු කරන්න.
- අවශ්‍ය ඉදිරිපෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**


- දේශගවේෂණයට සම්බන්ධ යුරෝපා රටවල් නම් කිරීම
- යුරෝපා ජාතීන් දේශගවේෂණ කටයුතුවලට යොමු වූ හේතු දැක්වීම
- දේශගවේෂණ කටයුතුවල ඇති වැදගත්කම පිළිබඳ කතා කිරීම
- දී ඇති උපදෙස් අනුව කටයුතු කිරීම.
- සිතියම ලකුණු කිරීමේ ශිල්පීය ක්‍රම අනුගමනය කිරීම

ඇමුණුම් අංක 3.1.1

**කාර්ය පත්‍රිකාව**

- ඔබ වෙත සපයා ඇති සිතියමේ කෝට්ටේ, සීතාවක හා රයිගම රාජධානිවල දේශසීමා රතු පාටින් ලකුණු කරන්න.
- එම රාජධානි නම් කරන්න.
- සිතියමේ පොත හා පෙළ පොත ආධාර කර ගෙන කෝට්ටේ රාජ්‍යයට අයත් ප්‍රදේශ කහ පාටින් ද මහනුවරට අයත් ප්‍රදේශ කොළ පාටින් ද, යාප නයට අයත් ප්‍රදේශ රෝස පාටින් ද පාට කරන්න.
- පහත දැක්වෙන ස්ථාන සිතියම තුළ ලකුණු කරන්න.
  කොළඹ, මහනුවර, යාපනය, මඩකලපුව, කෝට්ටේ
  ගාල්ල, ත්‍රිකුණාමලය, හලාවත, මාතර, කල්පිටිය

ඇමුණුම් අංක 3.1.2



**නිපුණතාව** : ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : **3.2** ශ්‍රී ලංකාවේ පෘතුගීසි බල ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය කරයි

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- කෝට්ටේ රාජ්‍යය බෙදී ගිය ආකාරය විස්තර කරයි.
- පෘතුගීසීන් කෝට්ටේ රාජ්‍යයේ බලය පිහිටුවාගත් ආකාරය විස්තර කරයි.
- කෝට්ටේ රාජ්‍ය බෙදී යෑම සිතියමක ලකුණු කර නම් කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- අදක්ෂ පාලකයින් නායකත්වයට පත්වීමෙන් රට, ජාතිය විනාශ වන බව වටහා ගනියි.
- විදේශ බලවේග හමුවේ එඩිතරව ක්‍රියා කළ යුතු බව පිළිගනියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**3.2 පෘතුගීසින් කෝට්ටේ රාජ්‍යය හා පැවැත් වූ සම්බන්ධතා**

- ක්‍රි.ව. 1518 කොළඹ කොටුවක් ඉදි කිරීම
- වර්ෂ 1521 විජයබා කොල්ලය නමැති ඓතිහාසික සිදු වීම නිසා පෘතුගීසීන්ට වාසිදායක වීම.
- විජයබා කොල්ලයෙන් කෝට්ටේ රාජ්‍යය කොටස් තුනකට බෙදී යාම
    - කෝට්ටේ - හත්වන බුවනෙකබාහු රජු
    - සීතාවක - මායාදුන්නේ රජු
    - රයිගම - රයිගම් බණ්ඩාර රජු
- මායාදුන්නේ රජු හා හත්වන බුවනෙකබාහු රජු අතර ඇති වූ ගැටුම සහ පෘතුගීසි මැදිහත් වීම.
- ධර්මපාල රජුගේ පිළිරුවක් පෘතුගාලයට යවා ඔටුනු පැළඳ වීම
- හත්වන බුවනෙකබාහු රජු පෘතුගීසි ගැති පාලකයෙකු නොවීම
- හත්වන බුවනෙකබාහු රජුගේ අභාවය
- වර්ෂ 1551 දී ධර්මපාල කෝට්ටේ රාජ්‍යත්වයට පත්වීම
- ධර්මපාල රජතුමා කතෝලික ආගම වැළඳගෙන දොන් ජුවාන් ධර්මපාල නමින් බෞතීස්ම ලැබීම
- කැලිකට් සැමොරින් සමඟ පැවති සම්බන්ධතා

- ධර්මපාල රජු පිළිබඳ කෝට්ටේ ජනතාව කල කිරීම.
- දියවඩන නිලමේ වන හිරිපිටියේ රාළ දළඳා වහන්සේ සීතාවකට වැඩම කර වීම.
- භික්ෂූන් වහන්සේලා සහ කෝට්ටේ වැසියන් මායාදුන්නේ රජු වටා එක් වීම.
- රජුගේ පියා වීදිය බණ්ඩාර පෘතුගීසි විරෝධී ව නැගී සිටිය ද ධර්මපාල රජු පෘතුගීසි රූකඩයක් මෙන් කටයුතු කිරීම.
- කෝට්ටේ සහය ද ලබන මායාදුන්නේ රජු වඩා බලවත් වීම.
- ඔහු පුත් ටිකිරි කුමරුගේ නායකත්වයෙන් සීතාවක හමුදාව හා පෘතුගීසින් අතර මුල්ලේරියා වෙලේ දරුණු සටනක් ඇති වූ බව.
- මුල්ලේරියා සටනින් පෘතුගීසින් ආසියානු රටක දී ලැබූ දරුණුතම පරාජය ලැබීම
- සීතාවක ප්‍රහාර හමුවේ ධර්මපාල රජු ආරක්ෂාව පතා කොළඹ කොටුවට පැන යාම
- වර්ෂ 1580 දී ධර්මපාල රජු තෑගි ඔප්පුවකින් කෝට්ටේ රාජ්‍යය පෘතුගීසින්ට පවරා දීම
- වර්ෂ 1597 ධර්මපාල රජුගේ මරණයෙන් පසු කෝට්ටේ රාජ්‍යය පෘතුගීසින්ට අයත් වීම

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන ලෙස ප්‍රශ්න විචාරාත්මක තරගයක් පැවැත්වීමට කටයුතු කරන්න.**

- පන්තියේ සිසුන් ලවා මෙම නිපුණතා මට්ටමට අදාළව පෙළපොත ද භාවිතයෙන් ප්‍රශ්න සකස් කරවන්න.
- සිසුන් සැකසූ ප්‍රශ්න අතරින් සුදුසු ප්‍රශ්න තෝරා විෂය අන්තර්ගතය ආවරණය වන සේ ප්‍රශ්න එකතුවක් සකස් කරන්න.
- ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පන්තිය බෙදා ප්‍රශ්න විචාරාත්මක තරගයක් පවත්වන්න.
- මේ සඳහා එක් කාලච්ඡේදයක් යොදා ගන්න.
- ප්‍රශ්න විචාරාත්මක තරගයක දී පිළිපැදිය යුතු නීතිරීති අනුගමනය කරමින් කණ්ඩායම සඳහා ලකුණු පවරන්න.

ඇගයීම හා තක්සේරුකරණ නිර්ණායක

- වර්ෂ 1521න් පසු කෝට්ටේ රාජ්‍යය බෙදී ගිය ආකාරය විස්තර කිරීම
- දේශපාලන ඒකක වෙන් වී තිබූ ආකාරය පැහැදිලි කිරීම
- කෝට්ටේ රාජ්‍යය හා පෘතුගීසි පිළිබඳ ප්‍රශ්න සකස් කිරීම
- ප්‍රශ්නවලට පිළිතුරුදීමට ඉදිරිපත් වීම
- ජය පරාජය සමව විඳිමින් සහයෝගයෙන් කටයුතු කිරීම

**නිපුණතාව** : ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 3.3 පෘතුගීසී හා සීතාවක රාජධානිය පිළිබඳ විමර්ශනය කරයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- සීතාවක රාජධානියේ බලය වර්ධනය වූ ආකාරය විස්තර කරයි.
- පෘතුගීසීන් සීතාවක රාජධානිය කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු දක්වයි.
- පෘතුගීසීන් සීතාවක බලය පිහිටුවීමේ අවස්ථා පැහැදිලි කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- රට ජාතිය රැක ගැනීමට පාලකයා නොබියව ක්‍රියා කළ යුතු බව පිළිගනියි.
- අභියෝගවලට නිර්භීත ව මුහුණදීමෙන් ජයග්‍රහණය කළ හැකි බව අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්** :

- සීතාවක රාජ්‍යය සම්බන්ධ පොත්

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**3.3 සීතාවක රාජධානිය හා පෘතුගීසීන් :**

- මායාදුන්නේ රජුගේ ක්‍රියාකලාපය හා සීතාවක බලය වර්ධනය වීම
    - දළදා වහන්සේ සීතාවකට වැඩමවීම
    - රයිගම ඈදා ගැනීම
    - උඩරට ඈදා ගැනීම
    - කෝට්ටේ රාජ්‍යය පරිහානියට පත්වීම
- මායාදුන්නේ රජු දැඩි පෘතුගීසි විරෝධියෙකු වීම
- මුල්ලේරියා සටනේ දී ටිකිරි කුමරු පෘතුගීසින්ට දරුණුතම පරාජය අත්කර දීම

- අවස්ථා ගණනාවක දී ම පෘතුගීසි සීතාවක ආක්‍රමණය කිරීම
- මායාදුන්නේ ඇවෑමෙන් ටිකිරි කුමරු රාජසිංහ නමින් රජ වීම
- පළමු වන රාජසිංහ රජු ක්‍රි.ව. 1586 දී කොළඹ කොටුව වටලා පෘතුගීසි පළවා හැරීමට ගත් උත්සාහය අසාර්ථක වීම
- පෘතුගීසීන් සතු අවි ආයුධ බලය හා නාවික ශක්තිය වඩා බලවත් වීම
- සීතාවක රාජධානිය බලය පිරිහීම
    - පළමුවන රාජසිංහ රජු බෞද්ධ විරෝධී කටයුතු සිදු කිරීම
    - උඩරට ඈදා ගැනීමේ දී සහාය වූ වීරසුන්දර බණ්ඩාර මැරවීම
    - පළමුවන රාජසිංහ රජුගෙන් පසු නිසි උරුමකරුවෙකු නොසිටීම
    - පළමු වන විමලධර්මසූරිය යටතේ උඩරට සීතාවක රාජධානියෙන් මිදී ස්වාධීන වීම.
- පරිහානියට පත් සීතාවක පෘතුගීසි බලයට යටත් වීම

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකම සිදු කරන්න.**

- සීතාවක හා පෘතුගීසි සම්බන්ධතා පිළිබඳ රචනාවක් ලියන්න.
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- රචනාව ලිවීමේ දී අවශ්‍ය මගපෙන්වීම හා උපදෙස් ලබා දෙන්න.
- රචනා කිහිපයක් තෝරා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ ලබා දෙමින් ඇගයීම සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

**පහත සඳහන් නිර්ණායක ආශ්‍රයෙන් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.**

- රචනාව සඳහා ආකර්ශනීය නමක් යොදා ගැනීම
- කරුණු නිවැරදි ව ඉදිරිපත් කිරීම
- කරුණු සංවිධාන ගත කිරීම
- රචනාවක තිබිය යුතු ගුණාංග අනුගමනය කිරීම
- නිර්මාණශීලීව රචනාව ගොඩනැගීම

**නිපුණතාව** : ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : **3.4 පෘතුගීසීන් හා උඩරට රාජධානිය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.**

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- පෘතුගීසින් හා උඩරට රජවරු අතර සම්බන්ධතා විස්තර කරයි.
- පෘතුගීසින් උඩරට රාජ්‍යයේ බලය ලබා ගැනීමට උත්සාහ කළ ආකාරය පෙන්වා දෙයි.
- පෘතුගීසි උඩරට ආක්‍රමණ පිළිබඳ විස්තර කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- උපායශීලීව ක්‍රියාකිරීමෙන් සතුරා පරාජය කළ හැකි බව පිළිගනියි.
- පාලකයා හා පාලිතයා අතර දැඩි සබඳතාව රටේ ආරක්ෂාවට හේතු වන බව අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්** :

- සටන්වල නම් ලියන ලද තුණ්ඩු කැබලි
- ශ්‍රී ලංකාව හා පෘතුගීසි සම්බන්ධ පොත් පත්
- තොප්පියක්

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**3.4 උඩරට රාජධානිය හා පෘතුගීසින් අතර සම්බන්ධතා**

- සේනාසම්මත වික්‍රමබාහු උඩරට රාජධානිය ආරම්භ කිරීම
- සීතාවක රාජසිංහ රජුගේ බලය හමුවේ සෙංකඩගල කරලියද්දේ බණ්ඩාර පරාජය වීම
- කරලියද්දේ බණ්ඩාරගේ දියණිය වූ කුසුමාසන දේවිය හා බෑනා වූ යමසිංහ බණ්ඩාර පෘතුගීසි රැකවරණය ලැබීම

- කුසුමාසන දේවිය - දෝන කතිරිනා
- යමසිංහ බණ්ඩාර - දොන් පිලිප්
- කොනප්පු බණ්ඩාර - දොන් ජුවාන් යන නමින් බෞතීස්ම ලැබීම

- පෘතුගීසි සහයෙන් දොන් පිලිප් උඩරට රජවීමත් සමග පෘතුගීසි සෙංකඩගල රාජධානිය කෙරේ අවධානය යොමු කිරීම
- පෘතුගීසි රූකඩ පාලක යමසිංහ බණ්ඩාර කෙටිකාලයක දී මිය යාම
- පෘතුගීසීන් දෝන කතිරිනා උඩරට රජ කරවීමට උත්සාහ දැරීම
- කොනප්පු බණ්ඩාර පළමුවන විමලධර්මසූරිය නමින් උඩරට රජවීම
- පළමුවන විමලධර්මසූරිය රජු දෝන කතිරිනා විවාහ කර ගනිමින් රාජ්‍ය උරුමය තහවුරු කර ගැනීම.
- පළමුවන විමලධර්මසූරිය රජු පෘතුගීසි විරෝධියෙකු ලෙස කටයුතු කිරීම
- පෘතුගීසි පලවා හැරීමට ලන්දේසි සහය ලබා ගැනීමට උත්සාහ කිරීම

**පෘතුගීසි උඩරට ආක්‍රමණ**

| සටන | වර්ෂය | උඩරට රජු | පෘතුගීසි නායකයා |
|---|---|---|---|
| දන්තුරේ සටන | 1594 | පළමුවන විමලධර්මසූරිය රජු | පේරෝ ලෝපේස් ද සූසා |
| බලන සටන | 1602 | පළමුවන විමලධර්මසූරිය රජු | දොන් ජෙරනිමෝ ද අසවේදු |
| රන්දෙනිවල සටන | 1630 | සෙනරත් රජු (සටන මෙහෙය වූ ඔහු පුත් මහා අස්ථාන කුමරු පසුව දෙවන රාජසිංහ නමින් රජවිය.) | කොන්ස්තන්තිනූ ද සා |
| ගන්නොරුව සටන | 1638 | දෙවන රාජසිංහ රජු | දියෝගෝද මේලෝ |

**සෙනරත් රජු හා පෘතුගීසි අතර සම්බන්ධතා**

- සෙනරත් රජු පෘතුගීසි අතර සාමකාමීව කටයුතු කළ අතර 1617 දී සාමකාමී ගිවිසුමකට කටයුතු කළේ ය.
- පෘතුගීසි කපිතාන් ජනරාල් කොන්ස්තන්තිනෝ ද සා විශාල හමුදාවක් සමග උඩරට ආක්‍රමණය කළේය.
- රජුගේ පුත් මහා අස්ථාන කුමරු හමුදාව මෙහෙයවා පෘතුගීසි අන්ත පරාජයකට පත් කරන ලදී.
- දෙවන රාජසිංහ රජු දවස දියෝ ගෝ ද මේලේ නැමැති පෘතුගීසි කපිතන් ජනරාල් උඩරට ආක්‍රමණය කළ අතර එහි දී උඩරට හමුදාව අතින් පෘතුගීසි පරාජය විය.

- 1658 දී ලන්දේසි සහයෙන් පෘතුගීසීන් ලංකාවෙන් පලවා හැරීමට සමත් විය.

**පෘතුගීසින්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථකවීමට හේතු,**

- උඩරට රාජධානියේ පිහිටීම හා භූගෝලීය පරිසරය
- උඩරැටියන්ගේ උපාය මාර්ගික සටන් ක්‍රම
- සතුරු ආක්‍රමණවල දී උඩරට ජනතාව රජු වටා එක්වීම
- උඩරට රජවරුන්ට ලන්දේසි සහය ලැබීම

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන ලෙස ක්‍රියාකාරකම්වල සිසුන් යොමු කරවන්න.**

- විනෝද ක්‍රීඩාවක් ලෙස එළිමහනේ සිදු කළ හැකිය.
- ක්‍රියාකාරකමට සතියකට පෙර උඩරට රාජධානියට එල්ල කළ පෘතුගීසි සටන් පිළිබඳ විනාඩි තුනක පමණ කතාවක් ඉදිරිපත් කිරීමට සූදානම් වන ලෙස උපදෙස් දෙන්න. ඒ සඳහා,
- පෙළ පොත හා වෙනත් පොත්පත් පරිශීලනනය කර තොරතුරු සපයා ගත යුතු බව
- නියමිත දිනයේ තමාට ලැබෙන සටන පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතු බව දැනුවත් කරන්න.
- දන්තුරේ, බලන, රන්දෙනිවල සහ ගන්නොරුව සටන් නාම සඳහන් කළ තුණ්ඩු සකස් කර ගන්න.
- නියමිත දිනයේ සිසුන් එළිමහනකට ගෙන ගොස් පන්තිය රවුමට සකස් කර ගන්න.
- සංගීත තොප්පිය දැමීමේ ක්‍රියාකාරකම කරන්න.
- තොප්පිය අතේ හෝ හිසේ තිබෙන ශිෂ්‍යයා මැදට පැමිණ තෝරා ගන්නා ලද තුණ්ඩුවේ සඳහන් සටන පිළිබඳ කතාවක් ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා දෙන්න.
- ඉදිරිපත් කළ කතාව ඇසුරින් ප්‍රශ්න ඇසීමට අවස්ථාව ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- පෘතුගීසි උඩරට රාජධානියට එල්ල කළ ආක්‍රමණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- කරුණුවල නිවැරදි වීම
- කරුණු සංවිධානගත කිරීම
- ඉදිරිපත් කිරීමේ කුසලතා පෙන්නුම් කිරීම
- කාල කළමනාකරණය කිරීම

**නිපුණතාව** : ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 3.5 යාපන රාජධානිය හා පෘතුගීසි බල ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- පෘතුගීසින් පැමිණෙන විට යාපනයේ දේශපාලන තත්ත්වය විස්තර කරයි
- පෘතුගීසින් යාපනය රාජධානිය කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු දක්වයි.
- පෘතුගීසින් යාපනයේ බලය පිහිටුවීමේ අවස්ථා පැහැදිලි කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- පාලකයින්ගේ අදූරදර්ශී ක්‍රියා කලාපය හමුවේ රටේ එක්සත් භාවය බිඳී යන බව අවබෝධ කර ගනියි.
- අභියෝගවලට නොබියව මුහුණදීමෙන් තම ඉලක්ක හා අරමුණු ජය ගත හැකි ය.

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න.**

**3.5 යාපන රාජධානිය හා පෘතුගීසීන්**

- පෘතුගීසින් පැමිණෙන විට පරරාජසේකරම් යාපනයේ පාලනය කිරීම
- යාපන රාජ්‍යය තුළ කතෝලික ආගමික ප්‍රචාරක කටයුතු
- වර්ෂ 1519 පරරාජසේකරම් මරා සංකිලි රජ වීම
- කතෝලික ආගම ප්‍රචාරය කිරීමට එරෙහිව පාලකයන්ගේ විරෝධ දැක්වීම
- වර්ෂ 1543 දී පෘතුගීසින් යාපනය ආක්‍රමණය කිරීම
- සංකිලි රජු යුද්ධයකට නොගොස් පෘතුගීසි ගැති පාලකයෙකු වී කප්පම් ගෙවීමට එකඟ වීම
- පෘතුගීසින් කතෝලික ආගම පැතිරවීමට ක්‍රියා කිරීම
- සංකිලි රජු මන්නාරම් ප්‍රදේශයේ කතෝලික ආගම ව්‍යාප්ත කිරීමට විරුද්ධ වීම, කතෝලික ආගම වැලඳ ගත් අයට නැවත සාම්ප්‍රදායික ආගම පිළිගන්නා ලෙස නියෝග කිරීම
- මිෂනාරී පූජකවරු යාපනය පාලකයා බලයෙන් පහකරන ලෙස පෘතුගීසින්ගෙන් ඉල්ලා සිටීම
- වර්ෂ 1560 දී පෘතුගීසින් යාපනය ආක්‍රමණය කිරීම
- මන්නාරම් අල්ලා ගත් පෘතුගීසිහු එහි ආරක්ෂක බලකොටුවක් ඉදි කිරීම

- වර්ෂ 1591දී පෘතුගීසීන් නැවතත් යාපනය ආක්‍රමණය කිරීම
- තමන්ට ගැති පාලකයෙකු වූ එදිරිමාන්න සිංහම් රාජ්‍යත්වයට පත් කිරීම
- 1617 දී එදිරිමාන්නසිංහම් රජු මිය යාම සහ බල අරගලය ඇති වීම
- සංකිලි නැමැත්තෙකු නැවත බලය ලබා ගැනීම
- ඔහු උඩරට රජුගේ විදේශ කටයුතුවලට සහය දීම
- දකුණු ඉන්දියාව සමග සම්බන්ධතා පැවැත්වීම පෘතුගීසිහු නොඉවසූහ
- වර්ෂ 1619 දී පිලිප් ද ඔලිවේරා යටතේ යාපනය ආක්‍රමණය කිරීම
- වර්ෂ 1621 වන විට යාපනයේ පෘතුගීසී බලය පිහිටුවීම
- යාපනය රාජ්‍යයේ අභ්‍යන්තර බල අරගල නිසා පෘතුගීසීන්ට පහසුවෙන් බලය අල්ලා ගැනීමට හැකි වීම.

- **යාපනය රාජ්‍ය බිඳ වැටීමට හේතු**
  - අභ්‍යන්තර බල අරගල
  - ජනතාව බෙදී සිටීම
  - ප්‍රමාණවත් නිත්‍ය හමුදාවක් නොසිටීම

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන සේ පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න.**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- යාපන රාජ්‍යය තුළ පෘතුගීසීන්ගේ කටයුතු සම්බන්ධව පුවත්පතකට ලිපියක් ලිවීමට උපදෙස් දෙන්න.
- පෙළ පොත ඇසුරින් යාපනය රාජ්‍යයේ හා පෘතුගීසි පාලන කටයුතු පිළිබඳ තොරතුරු හා පින්තූර රැස් කරන්න උපදෙස් දෙන්න.
- ලිපිය සඳහා සුදුසු මාතෘකාවක් යොදා ගන්නා ලෙස උපදෙස් දෙන්න.
- ලිපිය ලිවීමට අවශ්‍ය කාලය ලබා දෙන්න.
- පැවරුම නිම කිරීමට දිනයක් දෙන්න.
- අදාළ දිනයේ පැවරුම අධීක්ෂණය කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ලිපිය සඳහා මාතෘකාවක් සකස් කිරීම
- කරුණු නිවැරදි ව ඉදිරිපත් කිරීම
- කරුණුවල සංවිධානාත්මක බව
- නියමිත කාලය තුළ දී ලිපිය නිර්මාණශීලී ව සකස් කිරීම

**නිපුණතාව** : ශ්‍රී ලංකා ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 3.6 පෘතුගීසී ආගමනයෙන් පසු මෙරටට ඇති වූ බලපෑම පිළිබඳ විමසා බලයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසීන්ගේ පාලන කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- පෘතුගීසින් යටතේ මුහුදුබඩ ප්‍රදේශවල ආර්ථික කටයුතු පැහැදිලි කරයි.
- පෘතුගීසින් යටතේ ආගමික කටයුතු විස්තර කරයි.
- පෘතුගීසි පාලනයෙන් මෙරට සංස්කෘතියට එක් වූ නවාංග පෙන්වා දෙයි

**ආකල්ප හා හර පද්ධති** :

- පාලකයින්ගේ අදූරදර්ශී ක්‍රියාකලාපය හමුවේ රටේ එක්සත් භාවය බිඳී යන බව අවබෝධ කර ගනියි.
- අභියෝගවලට නොබියව මුහුණදීමෙන් තම ඉලක්ක හා අරමුණු ජය ගත හැකි බව පිළිගනියි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම අංක 3.6.1 කාර්ය පත්‍රිකාව

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**3.6 මුහුදුබඩ පළාත්වල පෘතුගීසි පාලනය**


**පාලන ව්‍යුහය**

- පාලනයේ දී උසස් තනතුරු පෘතුගීසි ජාතිකයන්ටත් ලබා දීම සහ පහළ තනතුරු දේශීය නිළධාරීන්ට ලබා දීම. උදාහරණ

පෘතුගාලයේ රජු
↓
ගෝවේ පෘතුගීසි ප්‍රතිරාජ
↓
ලංකාවේ කපිතාන් ජනරාල්
↓
දිසාවේ
↓
කෝරාළ (කෝරළේ විදානේ)
↓
අතුකෝරාළ
↓
ගම්පති (ගම් මුලාදෑනි)

- සාම්ප්‍රදායික පරිපාලන ක්‍රමය අනුව දිසාවනි පාලන පහසුව උදෙසා කොටස් හතරකට බෙදින.
    - දිසාවනිය - දිසාවේ
    - කෝරළය - කෝරළේ විදානේ
    - පත්තුව - අතුකෝරාළ
    - ගම් මුලාදෑනි

කෝට්ටේ පාලකයා වූ ධර්මපාල රජු ක්‍රි.ව 1597 මිය යාමෙන් පසු කෝට්ටේ රාජ්‍යය තුළ පෘතුගීසීන්ගේ බලය ස්ථාපිත විය. මින් පසුව මෙරට පෘතුගීසීන්ගේ පාලන කටයුතු කෙසේ විය යුතු ද යන්න පිළිබඳව කතිකාවතක් ඇති විය. ශ්‍රී ලංකාවේ පෘතුගීසී කපිතාන් ජනරාල් දොන් ජෙරොනිමෝ ද අසවේදු දේශීය ප්‍රධානීන් සමග සාකච්ඡා කර පෙර පැවති දේශීය පාලන ක්‍රමය තවදුරටත් ගෙන යාමට එකඟතාව ඇති කර ගත් අතර එය මල්වානේ ගිවිසුම ලෙස හැඳින්වේ. දේශීය වශයෙන් ක්‍රියාත්මක වූ ප්‍රාදේශීය පාලන ව්‍යුහයක් පවත්වා ගැනීම. කෝට්ටේ රාජධානිය ප්‍රධාන දිසාවනි හතරකට බෙදා පාලනය කිරීම.



- පෘතුගීසි ප්‍රතිපත්තියේ එක් ප්‍රධාන අරමුණක් වූයේ රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත කිරීමයි.
- ප්‍රධාන අරමුණු දෙකක් පදනම් කරගෙන ආගමික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
    - පෘතුගීසි ආණ්ඩුවට පක්ෂපාතී රට වැසියන් පිරිසක් ඇති කර ගැනීම
    - මෙරට ප්‍රභූ ජනතාව ආගමට හරවාගෙන දේශපාලන වාසි ලබා ගැනීම
- ආගම ප්‍රචාරය කිරීමට නිකාය හතරක පූජකවරු හෙවත් මිෂනාරිවරු පැමිණීම
    - ෆ්‍රැන්සිස්කන් සමාගම - මාතර
    - ඩොමිනිකන් සමාගම - සබරගමුව
    - ඔගස්ටීනියන් සමාගම - සතර කෝරළය
    - ජේසුයිට් සමාගම - සත් කෝරළය
- ආගම ප්‍රචාරයට විවිධ ක්‍රියාමාර්ග ලබා ගැනීම
    - ධර්මපාල රජු ආගමට හරවා ගැනීම
    - අධ්‍යාපනය ලබා දීම, පැරිස් පාසල් පිහිටු වීම
    - කතෝලික ආගම වැලඳගත් අයට වරප්‍රසාද, දීමනා හා රජයේ තනතුරු ලබා දීම
    - බදුවලින් නිදහස් කිරීම
    - ජනතාවගේ සිත් ඇදගන්නාසුළු උත්සව හා පෙරහර සංවිධානය කිරීම
    - සුභසාධක කටයුතු සිදු කිරීම. මේවා කොළඹ, ගාල්ල, යාපනය ආදී ප්‍රදේශවල පිහිටුවා ඇත.
- උදාහරණ ස්පිරිත්ටන් නමින් ආරෝග්‍යශාලා ඉදි කිරීම, නැති බැරි අය බලා ගැනීමට හා අනාථයන්ට ඉගැන්වීමට මඩම් පිහිටුවීම. (මිෂනාරි කෝසියා)

**පෘතුගීසී යටතේ ආර්ථික කටයුතු**

- උපරිම ලාභ ලැබීම අරමුණින් විඩෝර් ද පැසෙන්ඩා නැමැති නිළධාරියා යටතේ ආර්ථික කටයුතු සංවිධානය කිරීම
- ආර්ථික කටයුතු ප්‍රධාන අංශ දෙකක් යටතේ සංවිධානය වීම.
    - ආදායම් රැස් කිරීම
    - වෙළඳ ද්‍රව්‍ය පිටරටට යැවීම
- යුරෝපයේ ඉහළ ඉල්ලුමක් ඇති කුළුබඩු ඇතුළු ද්‍රව්‍ය ලබා ගැනීම ප්‍රධාන අරමුණ වීම
- ආදායම් මාර්ගවලට අදාළ තොරතුරු ලේඛනගත කිරීම එම ලේඛන තෝම්බු ලෙස හැඳින්වේ
- කුරුඳු වෙළඳාම ප්‍රධාන ආදායම් මාර්ගය වීම
- කුරුඳු වගා නොකළ අතර ස්වභාවිකව වැඩුණු කුරුඳු ලබා ගැනීම
- කුරුඳු සඳහා මහබද්දේ දෙපාර්තමේන්තුව පිහිටු වීම

- එහි ප්‍රධානියා මහබද්දේ කපිතාන් විය.
- පුවක්, ගම්මිරිස්, අලි ඇතුන්, මුතු මැණික් වෙළෙඳාම පැවතිණ.
- පුවක්, ගම්මිරිස්, විකිණීමේ අයිතිය පෘතුගීසීන්ට පමණක් හිමි වීම
- ආදායම් එකතු කිරීමට සුළු නිළධාරීන් ද පත් කිරීම
    - කනකපුල්ලේ
    - ලියන්නන්
    - මයෝරාළවරුන්
- උඩරට රජු සමග ද අභ්‍යන්තර වෙළෙඳාම් කිරීම
- වෙළෙඳාමේ ඒකාධිකාරය පෘතුගීසීන් අතට පත්වීම නිසා දේශීය හා මුස්ලිම් වෙළෙන්දන්ට එතෙක් පැවති වෙළෙඳ අයිතීන් අහිමි වීම

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන ලෙස පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න.**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම් අංක 3.6.1හි කාර්ය පත්‍රිකා කණ්ඩායම් වෙත ලබා දෙන්න.
- ප්‍රමාණවත් කාලය ලබා දෙන්න.
- ක්‍රියාකාරකම අවසානයේ එය පන්තිය වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඇසුරින් දුබලතා හා දක්ෂතා පෙන්වා දෙමින් පාඩම සමාලෝචනය කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- පෘතුගීසීන්ගේ ආර්ථික, සමාජ හා සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- පෘතුගීසි බලපෑමෙන් මෙරට සමාජයට එක් වූ නව අංග පෙන්වා දීම
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම
- නායකත්ව ගුණාංග ප්‍රදර්ශනය කිරීම
- නිවැරදිව තොරතුරු ඉදිරිපත් කිරීම හා ක්‍රියාකාරකම වඩාත් නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම

ඇමුණුම් අංක 3.6.1

**කණ්ඩායම් 01 කාර්ය පත්‍රිකාව**

- පෘතුගීසීන්ගේ පාලන කටයුතු පිළිබඳ තොරතුරු රැස් කරන්න.
- ඒවා ඇසුරින් පෘතුගීසී පාලනය පිළිබඳව පන්තියට ඉදිරිපත් කිරීමට කතාවක් සූදානම් කර ගන්න.
- කණ්ඩායමේ සියලු දෙනාගේ සහයෝගයෙන් කතාව පන්තියට ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම් 02 කාර්ය පත්‍රිකාව**

- පෘතුගීසීන්ගේ ආර්ථික කටයුතු පිළිබඳ තොරතුරු රැස් කරන්න.
- පෘතුගීසීන්ගේ ආර්ථික කටයුතු ඇසුරින් කතාවක් සූදානම් කර ගන්න.
- කණ්ඩායමේ සියලු දෙනාගේ සහයෙන් කතාව පන්තියට ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම් 03 කාර්ය පත්‍රිකාව**

- පෘතුගීසීන්ගේ සමාජ සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු රැස් කරන්න.
- පෘතුගීසීන්ගේ සමාජ සංස්කෘතික කටයුතු ඇසුරින් කතාවක් සූදානම් කර ගන්න.
- කණ්ඩායමේ සියලු දෙනාගේ සහයෙන් කතාව පන්තියට ඉදිරිපත් කරන්න.

# 04

## ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශවල බලය අල්ලා ගැනීම

16 වන සියවස ආරම්භයේ දී ලංකාවට පැමිණි පෘතුගීසීහු එම ශතවර්ෂය අවසාන වන විට දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශ රැසක ම තම බලය පිහිටුවා ගැනීමට සමත් වූහ. මෙසේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කරගත් පෘතුගීසීන් උඩරට යටත් කර ගැනීමේ අරමුණින් යුතුව වරින් වර උඩරට ආක්‍රමණ කළහ. මෙම තත්වය වළක්වා ගැනීමට හා පෘතුගීසීන් ලංකාවෙන් පලවා හැරීමට ශක්තිමත් නාවික බලයක් සහිත ජාතියකගේ සහාය අත්‍යවශ්‍ය විය. ඒ බව තේරුම්ගත් උඩරට පාලකයෝ VOC හෙවත් පෙරදිග ලන්දේසි වෙළෙඳ සමාගම පිහිටුවා ගෙන ආසියාවට පැමිණි ලන්දේසීන්ගේ සහාය ලබා ගැනීමට උත්සාහ කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශවල බලය අත්පත් කර ගැනීම පිළිබඳ ව මෙම ඒකකය තුළින් අධ්‍යයනය කිරීම අපේක්ෂිත ය.

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 4.1 ලන්දේසි බල ව්‍යාප්තිය විමර්ශනය කරයි

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- ලන්දේසීන් ආසියාවට පැමිණීමට හේතු පැහැදිලි කරයි.
- ලන්දේසීන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු විස්තර කරයි
- ඉන්දියානු සාගරය ආශ්‍රිත කලාපය තුළ ලන්දේසි බලය තහවුරු කර ගැනීමට ගත් ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධයෙන් අදහස් දක්වයි.

**ආකල්ප හා හර පද්ධති** :

- දූරදර්ශී ව තීරණ ගැනීමේ වටිනාකම පහදා දීම
- යම්කිසි දෙයක් සිදු කිරීමේ දී ගැටලු ඇති වේ නම් ඒ සඳහා තව තවත් ශක්තිමත් වී ඉන් ජය ගැනීමට උත්සාහ කිරීම

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 4.1.1 කාර්ය පත්‍රිකාව

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**4.1 ශ්‍රී ලංකාවේ ලන්දේසි බල ව්‍යාප්තිය**

**ලන්දේසීන් පෙරදිගට පැමිණීම**

- පෘතුගීසීන් හා ලන්දේසීන් අතර වූ එදිරිවාදිකම් හේතුවෙන් ලන්දේසීන්ට කුළුබඩු ඇතුළු ආසියාතික වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීමට අවස්ථා නොලැබී යාම
- මේ නිසා ඒවා නිෂ්පාදනය වන ආසියාතික රටවල් කරා පැමිණීම
- ක්‍රි.ව. 1602 පමණ වන විට පෙරදිග ඉන්දීය ඕලන්ද වෙළෙඳ සමාගම (VOC) පිහිටුවීම හා අග්නිදිග ආසියාවේ ජාවා දූපතේ (වර්තමාන ඉන්දුනීසියාවට අයිති) බතාවිය ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානය ලෙස තෝරා ගනිමින් ආසියාවේ ලන්දේසි බලය ගොඩනැගීම.
- ලන්දේසීන් තම බලය ව්‍යාප්ත කිරීමේ දී ආර්ථික අරමුණු මෙන් ම රෙපරමාදු ක්‍රිස්තියානි ආගම පැතිරවීම සඳහා මුල්තැනක් ලබා දීම

**ලන්දේසීන් ලංකාවට පැමිණීම**

- පෘතුගීසීන් ලංකාවෙන් නෙරපා හැරීමට ශක්තිමත් නාවික බලයක් සහිත ජාතියකගේ සහය අත්‍යාවශ්‍ය බව වටහා ගත් ලාංකික රජවරුන් ඒ සමය වන විට ඉන්දියන් සාගරයේ බලය අත්පත් කර ගනිමින් ලන්දේසීන්ගේ සහය ලබා ගැනීමට උත්සාහ ගැනීම
- ලංකාවේ කුරුඳු ප්‍රධාන කුළුබඩු වර්ග මුතු, මැණික් ආදී වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීමට ඇති අවශ්‍යතාව මත ලන්දේසීහු පෘතුගීසීහු ලංකාවෙන් නෙරපා හැරීමට උදව් ලබාදීමට එකඟ වූහ.
- ශ්‍රී ලංකාවේ පැවති දේශපාලන වාතාවරණය අනුව ලන්දේසීන්ට මෙරට ආධිපත්‍යය පැතිරවීමට පහසු වීම
- ඉහත සඳහන් විෂය අන්තර්ගතයට අනුව ඇමුණුම 3.1.1 හි ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු ලිවීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදාගන්න.
- ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම සඳහා එක් කාලපරිච්ඡේදයක් ලබා දෙන්න.
- සිසු ක්‍රියාකාරකම් ඇගයීමට යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ලන්දේසීන්ගේ ආසියාගමනය පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීම
- ලන්දේසීන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු පැහැදිලි කිරීම
- ශ්‍රී ලංකාවේ පැවැති දේශපාලන තත්ත්වය ලන්දේසීන්ගේ අරමුණු කරා යාමට පහසු වූ බවට තොරතුරු පැහැදිලි කිරීම
- ප්‍රශ්න සඳහා නිවැරදිව තොරතුරු සැපයීම
- නියමිත කාලය ඇතුළත අවසන් කිරීම

**ඇමුණුම් අංක 4.1.1 කාර්ය පත්‍රිකාව**

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

1. ලන්දේසීන් පෙරදිගට පැමිණීමට හේතු පැහැදිලි කරන්න
2. ලන්දේසීන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු ලියන්න.
3. ලන්දේසීන් ලංකාවට පැමිණෙන අවධියේ එහි පැවති දේශපාලන පසුබිම ඔවුන්ගේ බලය පැතිරවීම සඳහා උපකාරී වූ අන්දම විස්තර කරන්න.

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : **4.2** උඩරට හා ලන්දේසීන් අතර සබඳතා පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- උඩරට රජවරුන් හා ලන්දේසීන් අතර පැවති සබඳතා විස්තර කරයි.
- ලන්දේසීන් හා උඩරට පාලකයින් අතර ඇති වූ ගිවිසුම් සඳහා හේතු පැහැදිලි කරයි
- උඩරට පාලකයින් හා ලන්දේසීන් අතර හටගත් ගැටුම් අවම කරගත් ආකාරය පෙන්වා දෙයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 4.2.1
- www.britannica.com/place/Srilanka/Dutch.rule-in-Sri-Lanka-1658-1796

**ආකල්ප හා හර පද්ධති** :

- රැවටීම්වලට හසු නොවී ශක්තිමත්ව කටයුතු කිරීම

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**4.2 උඩරට සමග ලන්දේසි සබඳතා**

- ලන්දේසීන් පෙරදිගට පැමිණ 1602 මැයි 21 වන දින ජොරිස් වැන් ස්පිල්බර්ජන් නම් ලන්දේසි ජාතික අද්මිරාල්වරයා නැව් තුනක් සමග ලංකාවේ නැගෙනහිර වෙරළේ මඩකලපුවට ගොඩබැස කන්ද උඩරට රජු වූ පළමුවන විමලධර්මසූරිය රජු හමු විය. එය ලන්දේසීන් හා උඩරට පාලකයෙකු හමු වූ පළමු අවස්ථාව විය.

- ලන්දේසි සමග ඇති වූ සාකච්ඡාවලින් පසු පෘතුගීසීන් මෙරටින් පන්නා දැමීමට ලන්දේසීන්ගේ ආධාර ලබා ගැනීමට රජු එකඟ විය. රජුගෙන් සත්කාර, සම්මාන ලබා ගත් ලන්දේසීහු ආධාර ලබා ගෙන එන බව දක්වා පිටත් වූහ.

- 1602 දී සී බෝල්ට් ද වාර්ට් නම් ලන්දේසි අද්මිරාල්වරයා විශාල නාවික හමුදාවක් රැගෙන ලංකාවට පැමිණියේ ය. රජු ඔහුව බොහෝ සත්කාර සහිතව පිළිගත්තේ ය.

- සී බෝල්ට් ද වාර්ට් පෘතුගීසීන් සතු වූ ගාලු කොටුව නිදහස් කර ගත්තේ ය. නැවත එම බලකොටුව පළමු වන විමලධර්මසූරිය රජුට භාර නොදීම සහ රජුට අවමාන වන ලෙස හැසිරීම නිසා ලන්දේසීන් ඝාතනය කිරීම
- මෙම සිදු වීම නිසා රජු සහ ලන්දේසීන් අතර සබඳතා බිඳී යාම

- විමලධර්මසූරිය රජුගේ මරණයෙන් පසු ව රාජ්‍යත්වයට පත් සෙනරත් රජුගේ රාජ්‍ය කාලයේ දී ලන්දේසී දූත ගමන් දෙකක් සිදු වුව ද එය සාර්ථක නොවීම.

- 1635 දී සෙනරත් රජු පසුව රාජ්‍යත්වයට පත් දෙවන රාජසිංහ රජු ඇඩම් වෙස්ටර්වෝල්ඩ් අද්මිලාර්වරයා සමග එකතුව මඩකලපුව සහ ත්‍රිකුණාමලය බල කොටු අත්පත් කරගැනීම

- 1638 වර්ෂයේ දී දෙපාර්ශ්වය අතර ගිවිසුමක් අත්සන් කරන ලදි. එම ගිවිසුම ප්‍රකාරව මීගමුව ගාල්ල මාතර ආදී අනිකුත් බලකොටු අත්පත් කරගෙන ඇත. වර්ෂ 1658 වන විට යාපනය සහ මන්නාරම කොටු අත්පත් කර ගැනීමෙන් පසු ලංකාවේ පෘතුගීසි පාලනය අවසන් වීම

- ලන්දේසීන් උඩරට රජුන් සමඟ පැවැත්වූ සබඳතා එක්තරා අන්දමකට සංකීර්ණ ස්වරූපයක් ගත් අතර ඇතැම් වරක මිත්‍රයන් ලෙස හා තවත් වරෙක ආක්‍රමණිකයන් ලෙස ද ක්‍රියා කළ බව පෙනී යයි.

**ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් යොමු කරවන්න. මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.**

ඇමුණුම 4.2.1 අනුව ඓතිහාසික කරුණු එක් රැස් කොට කෙටි ප්‍රශ්න සකසන්න

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- උඩරට රජුන් හා ලන්දේසීන් අතර පැවති සබඳතා විස්තර කිරීම
- ලන්දේසීන් උඩරට රජුගේ අවශ්‍යතාවලට මුවා වී තම අරමුණු ඉටු කර ගත් ආකාරය පැහැදිලි කිරීම
- ලන්දේසීන්ගේ උපායශීලී බව පෙන්වා දීම
- රචනාව නිවැරදිව ලිවීම
- ගුරු උපදෙස් පිළිපදිමින් කටයුතු කිරීම

**ඇමුණුම් අංක 4.2.1 කාර්ය පත්‍රිකාව**

- ''**ඉඟුරු දීලා මිරිස් ගත්තා වගේ**'' මෙම පිරුළ සනාථ වන සේ පෘතුගීසි කරදරයෙන් මිදීමට ලන්දේසීන්ගේ උපායට හසු වීම පිළිබඳ තොරතුරු ඇසුරින් රචනාවක් ලියන්න.
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- රචනාව ලියාගෙන ඒම සඳහා දිනයක් ලබා දෙන්න
- සියලු ම රචනා කියවා බලා ඇගයීමට ලක් කරන්න.
- වඩාත් සාර්ථකව ම රචනාව තෝරා පන්තියේ සෙසු අයට ද එය කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- නිර්ණායක ඇසුරින් ඇගයීම සිදු කරන්න.

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 4.3 මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය විස්තර කරයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමට ගත් උත්සාහය පැහැදිලි කරයි.
- මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය පැවති ආකාරය විස්තර කරයි.
- ලන්දේසි පාලනය තුළ ලංකාවේ ඇති වූ නව අංග හඳුනා ගෙන අර්ථ දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** :

- www.britannika.com/place/Sri-Lanka/Dutch-rule-Sri-Lanka 1658-1796

**ආකල්ප හා හර පද්ධති** :

- නීතිගරුකව ජීවත්වීමට හුරු වීම

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**4.3 මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය**

- ලංකාවේ මෙම සමය වන විට ප්‍රධාන රාජ්‍ය (පාලන ප්‍රදේශ) දෙකක් දැකගත හැකි විය. ඉන් පළමුවැන්න සාම්ප්‍රදායික පාලනයක් ක්‍රියාත්මක වූ උඩරට රාජධානියයි. දෙවැන්න ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමේ පාලනය ක්‍රියාත්මක වූ මුහුදුබඩ ප්‍රදේශය යි.

- ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම පාලනය වූයේ පුද්ගලයන් දාහත් දෙනෙකුගෙන් යුතු මණ්ඩලයක් මගිනි. ඔවුන් වෙළඳ මණ්ඩල මගින් පත් වූ අතර වෙළඳ සමාගම වෙනුවෙන් පෙරදිග ලන්දේසි පාලන ප්‍රදේශ පාලනය වූයේ ආණ්ඩුකාරවරයෙකු යටතේ ය.


- ලන්දේසීන්ගේ පාලන මධ්‍යස්ථානය වූයේ ජාවා දූපතේ (වර්තමාන ඉන්දුනීසියාවට අයත්) බතාවියේ ය. ආණ්ඩුකාරවරයාගේ සහයට උපදේශක මණ්ඩලයක් ක්‍රියාත්මක විය.

- ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ ආණ්ඩුකාරවරයාට සහයවීම සඳහා උපදේශක මණ්ඩලයක් විය. එය සාමාජිකයින් නව දෙනෙකුගෙන් යුක්ත විය. එහි ආදායම් පාලක, කොළඹ දිසාවේ ප්‍රධාන ශ්‍රම නිලධාරී, පිස්කල් නිලධාරී ප්‍රධාන දෙපාර්තමේන්තු පහක නිලධාරීන් සිටි බව පෙනේ.

- ලංකාවේ ප්‍රදේශ ප්‍රධාන කොමාන්ඩරි තුනකට බෙදා ඇත. එය කොළඹ කොමාන්ඩරිය, ගාල්ල කොමාණ්ඩරිය, යාපනය කොමාණ්ඩරිය ලෙස බෙදා පාලනය කර ඇත. පසුව එම ප්‍රදේශ දිසාවන් කෝරාළ, පත්තු, ගම් ආදී ලෙස බෙදා පාලනය කර ඇත.
- ලන්දේසි පරිපාලනයේ ඉහළ නිලතල සඳහා ලන්දේසී නිලධාරීන් ද පහළ නිලතල සඳහා ස්වදේශීක නිලධාරීන් ද යොදා ගෙන පාලනය මෙහෙයවා ඇත.
- උදාහරණ:- කෝරාළ, මුදලි, විදානේ ගම්මුලාදෑනි තනතුරු සඳහා දේශීය නිලධාරීන් පත් කිරීම.
- ලංකාවේ අධිකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා රෝම ලන්දේසි නීති ක්‍රමය හඳුන්වා නව උසාවි පද්ධතියක් ආරම්භ කළ අතර
- රාද්වෑන් ජස්ටිටී මහාධිකරණය
- ලෑන්ඩ් රාද් ඉඩම් උසාවිය
- සිවිල් රාද් සිවිල් උසාවිය වැනි ආයතන ක්‍රියාත්මක කරනු දැකගත හැකිය.
- යාපන ප්‍රදේශය පරිපාලනයේ දී අධිකරණ කටයුතු ස්වදේශීය නීති ක්‍රමය වන තේසවලාමෙයි නීතිය යටතේ සිදු කරනු දැක ගත හැකි ය.

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන ලෙස පහත ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යයන් නිරත කරවන්න.**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- ලන්දේසීන්ගේ මුහුදුබඩ ප්‍රදේශ පිළිබඳ බිත්ති පුවත්පතකට ලිපියක් සැකසීමට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.
- බිත්ති පුවත් පතක ලිපියකට ඇතුළත් විය යුතු අංග පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
- මෙම ලිපිය සැකසීම සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදා ගන්න.
- විශිෂ්ට නිර්මාණය තෝරා ශිෂ්‍යයන් උපස්ථම්භනය කරන්න.
- නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.




සිතියම 4.3.1 ලන්දේසි පාලන ප්‍රදේශ

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 4.4 ලන්දේසි පාලනයේ ආර්ථික ප්‍රවණතා විමර්ශනය කරයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- ලන්දේසි පාලනය යටතේ මෙරට වාණිජ බෝග වගාවක් ලෙස කුරුඳු වගාව ව්‍යාප්ත වූ ආකාරය පැහැදිලි කරයි.
- ලන්දේසි පාලනය තුළ දේශීය කෘෂි ආර්ථිකය පෝෂණය වූ අයුරු විස්තර කරයි.
- ලන්දේසීන් යටතේ මෙරට ආර්ථිකය තුළ ඇති වූ වෙනස්කම් පෙන්වා දෙයි.

**ආකල්ප හා හර පද්ධති** :

- තම අරමුණු ඉටු කර ගැනීමට ශක්තිමත්ව ක්‍රියා කිරීම

**ගුණාත්මක යෙදවුම්** :

- www.britannika.com/place/SriLanka/Dutch-rule in Sri- Lanka 1658-1796
- lanka.com/about/attractions/hamiltoncanal

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**4.4 ලන්දේසින් යටතේ ආර්ථික කටයුතු**

- ලන්දේසි පාලන සමයේ අපනයන ද්‍රව්‍යයන් අතරින් වඩාත් ලාභදායි භෝගය වූයේ කුරුඳු ය.
- කුරුඳු වෙළඳාම ප්‍රධාන කොටගත් වෙළෙඳ ඒකාධිකාරයක් ලන්දේසීන් ලංකාව තුළ ගොඩනගා ඇත.
- කුරුඳු ඉඩම් මෙන් ම කුරුඳු සකස් කිරීම සහ කුරුඳු වෙළෙඳාමේ සියලු ම කටයුතු භාරව පැතියේ මහබද්ධ නම් කාර්යාංශයට ය. මෙම ඉඩම්වල පදිංචි ජනතාව තම ඉඩම් භුක්තිය වෙනුවෙන් සෑම වර්ගයක ම ජූලි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා සමාගමට කිසිදු ගෙවීමක් නොකොට කුරුඳු තලා දිය යුතු විය.

- පුවක් වෙළෙඳාමෙන් ද ලන්දේසීන් විශාල ආදායමක් ලබා ගැනීම එම නිසා පුවක් වැවීම ද සමහර ප්‍රදේශවල ආරම්භ කිරීම.
- අතිරේක භෝග වශයෙන් උක්, ගම්මිරිස්, කෝපි, කරදමුංගු වැනි වගාවන් කෙරෙහි යොමුවීම.
- ලන්දේසීන් කෘෂිකර්මාන්ත කටයුතු කෙරෙහි ද අවධානය යොමු කොට ඇත. විශේෂයෙන් එයට හේතු වූයේ ලන්දේසි හමුදාව සහල් සැපයීමට විශාල වියදමක් දැරීමට සිදු වීමයි. එම නිසා මුඩුබිම්වල ලෙස පැවති භූමිය අත්පත් කොට කෘෂි කර්මය ආරම්භ කර ඇත.
- මීගමු ඇළ (හැමිල්ටන් ඇළ) පවිත්‍ර කොට ජලය බැස යාමට සලස්වා මුතුරාජවෙල අස්වැද්දීම



ඡායාරූපය 4.4.1 හැමිල්ටන් ඇළ

- මන්නාරම අසල පිහිටි යෝධ වැව ද කන්තලේ වැව ද ප්‍රතිසංස්කරණය කිරීම
- ඌරුබොක්කේ වේල්ල කරවා ගිරුවාපත්තුවේ අක්කර දහස් ගණනක් වගා කිරීම
- යෝධ කණ්ඩිය වැව ප්‍රතිසංස්කරණය
- ඇතුන් වෙළඳාමෙන් මෙන් ම මුතු කිමිදීමෙන් ද වෙළෙඳ සමාගම විශාල ලාභයක් උපයා ඇත.
- සබරගමු පළාතේ ඇතුන් ඇල්ලීම සඳහා කුරුවේ දෙපාර්තමේන්තුව පිහිටීම
- යාපනය ප්‍රදේශය ආශ්‍රිතව රෙදි වියීම රෙදි සායම් කිරීම, මොරටුව ආශ්‍රිතව වඩු කර්මාන්තය, බංගදෙණිය ආශ්‍රිතව ගඩොල් කර්මාන්තය ලන්දේසීන්ගේ ආර්ථික ක්‍රියාවලිය ඔස්සේ වර්ධනය වී ඇත.



ඡායාරූපය 4.4.2 යෝධ කණ්ඩිය වැව

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකම සඳහා ශිෂ්‍යයන් යොමු කරන්න.**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- ලන්දේසීන්ගේ ආර්ථික කටයුතු පාඩමට අදාළ කෙටි ප්‍රශ්න හා පිළිතුරු සකස් කිරීමට උපදෙස් දෙන්න.
- මෙම ක්‍රියාකාරකම අභ්‍යාස පොතෙහි කිරීමට උපදෙස් දෙන්න.
- ක්‍රියාකාරකම පන්තිකාමරය තුළ දීම සිදු කරන්න.
- ශිෂ්‍යයන් සැකසූ ප්‍රශ්න ඇගයීම් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ලන්දේසීන්ගේ ආර්ථික කටයුතු විස්තර කිරීම
- ලන්දේසීන් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට උත්සාහ ගැනීම පෙන්වා දීම
- ලන්දේසීන් යටතේ මෙරට ආර්ථිකයේ වූ වෙනස්වීම් පෙන්වා දීම
- තර්කානුකූලව ප්‍රශ්න ගොඩනැගීම
- නියමිත වේලාවට ක්‍රියාකාරකම නිම කිරීම

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : **4.5 ලන්දේසි පාලනයෙන් සාමාජීය වශයෙන් මෙරටට එක් වූ නවාංග විමර්ශනය කරයි.**

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- ලන්දේසින් යටතේ ශ්‍රී ලංකාවේ සමාජීය සහ සංස්කෘතික කටයුතු පැහැදිලි කරයි.
- ලන්දේසි පාලනය යටතේ ශ්‍රී ලාංකික සමාජයට එකතු වූ නවාංග පෙන්වා දෙයි
- ක්‍රිස්තියානි ආගමේ ව්‍යාප්තිය සඳහා ලන්දේසීන් භාවිත කළ උපක්‍රම සමාජීයව බලපෑ ආකාරය අර්ථකථනය කරමින් පහදයි.

**ආකල්ප හා හර පද්ධති** :

- විදේශීය හුරු පුරුදු භාවිතයෙන් ඒවා දේශීයකරණය වීම පිළිබඳ අවබෝධ කර ගැනීම

**ගුණාත්මක යෙදවුම්** :

- www. serendib.btoptions.lk/article.php.issue-52xid-1339
- ලන්දේසීන්ගේ ගෘහ නිර්මාණ, ආහාරපාන, ඇඳුම් පැළඳුම් ඇතුළත් පින්තූර
- පෝස්ටරය සඳහා අවශ්‍ය කඩදාසි
- පෙල්ට් පෑන්
- ගම්

**පාඩම සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**4.5 ලන්දේසීන් යටතේ සමාජ හා සංස්කෘතික කටයුතු**

- ලන්දේසින් මෙරටට පැමිණි මුල් කාලවකවානුවේ දී ඕලන්ද දේවගැතිවරු කිහිපදෙනෙකු ලංකාවට ගෙන්වාගත් අතර ඔවුන් හරහා ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත කිරීමට උත්සාහ ගැනීම.
    - රෝමානු කතෝලික ආගම ඇදහීම තහනම් කිරීම
    - ක්‍රිස්තියානීන්ට රජයේ තනතුරු ලබා දීම
    - මුද්‍රණාල ආරම්භ කිරීම
    - පොත්පත් හා ප්‍රශ්නෝත්තර සංග්‍රහ වැනි ලියවිලි බෙදා හැරීම

- බයිබලය මුද්‍රණය කර බෙදාහැරීම
- ඉස්කෝල හෙවත් පාසල් ආරම්භ කිරීම හා එහි ඇති අධ්‍යාපන ක්‍රියාවලියේ දී රෙපරමාදු ආගමේ යාඥා ඉගැන්වීමට කටයුතු කිරීම
- සෙමනේරි ඔස්සේ උසස් අධ්‍යාපනය ලබා දීම



ඡායාරූපය 4.5.1 ලන්දේසි පල්ලියක්

- ලන්දේසි ඇඳුම් පැළඳුම්, විලාසිතා සහ භාෂාව මෙරට සංස්කෘතියට අලුත් අංග එකතු වීම
- ලන්දේසි ගෘහ නිර්මාණයේ ඇතුළත් මැද මිදුල සහිත ප්‍රභූ නිවාස, සොල්දර, ඉස්තෝප්පු වැනි අංග ලක්ෂණ ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පයට එකතු වීම.
- සිංහල සංස්කෘතියට එකතු වූ නව ආහාර අතර කොකිස්, අච්චාරු, කේක් වැනි ආහාර ද වැදගත්වේ.
- ලන්දේසි වචන එකතු වීම

උදාහරණ - වෙන්දේසි, ඉස්කෝල, කන්තෝරු, ඔප්පු, අල්මාරි





ඡායාරූපය 4.5.2 ලන්දේසි ගෘහ නිර්මාණයක්

ක්‍රියාකාරකම

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පහත ක්‍රියාකාරකමෙහි සිසුන් යොමු කරවන්න.**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ලන්දේසි පාලනයේ දී මෙරට සංස්කෘතියේ ඇති වූ නව අංග පිළිබඳ ව තොරතුරු රැස් කිරීමට ශිෂ්‍යයන්ට දැනුම් දෙන්න.
- ඒ සඳහා සතියක පමණ කාලයක් ලබා දෙන්න.
- ක්‍රියාකාරකම සඳහා බ්‍රිස්ටල් බෝඩ් හෝ පෝස්ටරයක් සැකසීමට සුදුසු කඩදාසියක් රැගෙන ඒමට උපදෙස් දෙන්න.
- ක්‍රියාකාරකම් සිදු කරන දිනයේ දී ශිෂ්‍යයන් රැස් කරගෙන ආ පින්තූර හා තොරතුරු ඇසුරින් පෝස්ටරයක් සකස් කිරීමට ශිෂ්‍ය කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.
- එක් එක් කණ්ඩායම්වලට ක්‍රියාකාරකම් පන්තියේ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකම ඇසුරින් කණ්ඩායම්වල ප්‍රබලතා හා දුබලතා පෙන්වා දෙන්න.
- කණ්ඩායම් අතුරින් වඩාත් නිවැරදි ක්‍රියාකාරකම තෝරා පන්තියේ ප්‍රදර්ශනයට තබන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ලන්දේසීන්ගෙන් මෙරට එක් වූ සංස්කෘතිකාංග විස්තර කිරීම
- ලන්දේසීන්ගේ ආගමික කටයුතු විස්තර කිරීම
- ලන්දේසීන්ගේ සංස්කෘතික ප්‍රවණතා ඇතුළත් පෝස්ටරයක් නිර්මාණය කිරීම
- පෝස්ටරය නිර්මාණය කිරීම සඳහා දායක වීම
- තොරතුරු නිවැරදි ව ඉදිරිපත් කිරීම

# 05

# ශිෂ්ටාචාර ව්‍යාප්තිය

තුන් වන ශ්‍රේණියේ දී ලෝකයේ පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරවල ඓතිහාසික විකාශනය හා වර්ධනය පිළිබඳ අධ්‍යයනය කරන ලදී. මෙම ඒකකයේ දී යුරෝපා ශිෂ්ටාචාරයේ පදනම වූ ග්‍රීක, රෝම ශිෂ්ටාචාර පිළිබඳ විමර්ශනාත්මක ව අවධානය යොමු කිරීමේ වැදගත්කම පැහැදිලි වේ. එය යුරෝපයට පමණක් නොව පසුකාලීන ව ලෝකයේ බොහෝ රටවලට එහි ප්‍රවණතාවල බලපෑම් ලැබී ඇති බව ද ප්‍රත්‍යක්ෂ වේ. එවන් පදනම් යුගයන්හි ආරම්භය, ව්‍යාප්තිය, පාලන කටයුතු, ආර්ථිකය හා සමාජ සංස්කෘතික තොරතුරු පිළිබඳ අවධානය යොමු කිරීම මෙම ඒකකය මගින් සිදු කෙරේ.

**නිපුණතාව** : ලෝක ශිෂ්ටාචාරවල ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 5.1.1 ග්‍රීක ශිෂ්ටාචාරය ගොඩනැගීම පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද** : 02යි

**ඉගෙනුම් පල** :

- ග්‍රීක ශිෂ්ටාචාරයේ ආරම්භය හා ව්‍යාප්තිය පිළිබඳ විස්තර කරයි.
- ග්‍රීක ශිෂ්ටාචාරයේ පාලන කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ග්‍රීක ශිෂ්ටාචාරයේ ආර්ථිකය පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.
- ග්‍රීක ශිෂ්ටාචාරය සිතියමක ලකුණු කර නම් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**5.1.1 ග්‍රීක ශිෂ්ටාචාරය**

**ග්‍රීසියේ භූගෝලීය පිහිටීම**

- මධ්‍යධරණී මුහුද, යුරෝපා, අප්‍රිකා හා ආසියා යන මහද්වීප තුනෙන් මායිම් වූ මධ්‍යධරණී මුහුද ග්‍රීක ශිෂ්ටාචාර කෙරෙහි විශාල බලපෑමක් ඇති කිරීම
- ග්‍රීසිය මධ්‍යධරණී මුහුදට මුහුණලා පිහිටීම
- විදේශ වෙළෙඳාමේ දී වැදගත් වූ වෙළෙඳ තොටුපළවල් කිහිපයක් ද මධ්‍යධරණී මුහුද ආශ්‍රිතව පැවතීම නිසා සෙසු ශිෂ්ටාචාර අතර සම්බන්ධතා පවත්වා ගැනීමටත්, වෙළෙඳාමේ දියුණුවටත් ඉවහල් වීම

- කඩතොලු සහිත වෙරළ මෙම තත්ත්වය තවදුරටත් තීව්‍ර කිරීමට හේතු වී ඇත.
- මේ නිසා මධ්‍යධරණී මුහුද යුරෝපා ශිෂ්ටාචාරයේ කේන්ද්‍රස්ථානය බවට පත් වී ඇත.
- ග්‍රීසියේ අභ්‍යන්තර භූ භෞතික පිහිටීම ද ශිෂ්ටාචාරයේ වර්ධනය කෙරෙහි බෙහෙවින් බලපා ඇත.
    - කුඩා ශේෂ කඳුවලින් ග්‍රීසිය සමන්විත වීම නිසා පෞර රාජ්‍ය බිහි වීමට පසුබිම සැකසීම
    - සාරවත් පසක් හා සෞම්‍ය දේශගුණික තත්ත්වයත් විශාල වශයෙන් තණබිම් ප්‍රදේශ දැකිය හැකිවීමත් කෘෂි කටයුතු සඳහා අවශ්‍ය පරිදි වර්ෂාපතනයක් ලැබීමත් නිසා ග්‍රීසියේ ජනාවාස බිහි වීමට අවශ්‍ය පසුබිම සැකසීම.

**ශිෂ්ටාචාරය හැඳින්වීම හා ආරම්භය**

- ක්‍රි.පූ 2000 දී පමණ ජන සංක්‍රමණ නිසා ග්‍රීසිය අවට ප්‍රදේශවල ජනපද වැසියන් පදිංචි වීම.
- ඉන්දු යුරෝපීය භාෂාවක් කථා කළ මෙම සංක්‍රමණිකයන් ගෝත්‍ර හා පෙළපත් ලෙස සංවිධානය වී තිබීම.
- ඒ අතුරෙන් මිනෝවරු හා මයිසීනියන්වරු ග්‍රීසිය පුරා විහිදී ඇත.
- ග්‍රීසිය ආශ්‍රිත ප්‍රදේශ ජනාවාස වන විට ඊට වසර ගණනාවකට පෙර ක්‍රීට දිවයින ආශ්‍රිත ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් දියුණු ශිෂ්ටාචාරයක් පැවති බවට තොරතුරු අනාවරණය කරගෙන තිබීම.
- ඒවා මිනෝවන් හා මයිසීනියන් ශිෂ්ටාචාර ලෙස හැඳින්වේ.



**ඡායාරූපය 5.1.1 මිනෝවන් ශිෂ්ටාචාරයට අයත් නටබුන්**

මෙම ශිෂ්ටාචාර පිළිබඳව 1870 දී පමණ විධිමත් පර්යේෂණ සිදු කිරීම.

- ක්‍රි.පූ 3000 දී පමණ ක්‍රීටය ආශ්‍රිත ප්‍රදේශවලට සිදු වූ ජන සංක්‍රමණ නිසා මිනෝවන් ශිෂ්ටාචාරය බිහි වීමට පදනම සකස් විය.
- ක්‍රි.පූ. 1900 දී පමණ ග්‍රීක අර්ධද්වීපයට එල්ල වූ ආක්‍රමණ නිසා ක්‍රි.පූ. 1600 වන විට එහි ස්ථිර ජනපද ඇති විය.
- මෙම ජන කොටස් හා ක්‍රීට දිවයින ආශ්‍රිත මිනෝවන්වරුන් අතර ඇති සබඳතා හේතුකොට සංස්කෘතිකමය වශයෙන් සම්මිශ්‍රණය වීම
- ක්‍රි.පූ. 1600- 1200 ත් කාලයේ ග්‍රීසියේ මයිසීනියාව නමින් නගරයක් වර්ධනය වූ අතර පසුව එය ක්‍රි.පූ. 1500න් පසු මයිසීනියානු ශිෂ්ටාචාරය බවට පත් විය.

- ක්‍රි.ව. 1876 සිට වරින් වර සිදු කළ පුරා විද්‍යා කැනීම්වලට අනුව ග්‍රීසියින් ගොඩබිම් ප්‍රදේශවලට අමතර ව ක්‍රීටය, සයික් ලැඩිස්, කාපතෝස්, රෝඩ්ස් වැනි දූපත්වල මයිසීනියන් ශිෂ්ටාචාර පැතිර තිබීම.



ඡායාරූපය 5.1.2 මයිසීනියන් ශිෂ්ටාචාරයට අයත් නටබුන්

- ක්‍රි.පූ 1250 දී පමණ මයිසීනියන්වරු හා ට්‍රෝජන්වරු සමග යුද්ධය ජයග්‍රහණය කළ ද මයිසීනියන් ශිෂ්ටාචාරය ක්‍රමයෙන් පරිහානියට පත් විය.

- ම්ලේච්ඡ ගෝත්‍රික පිරිසක් වූ යකඩ අවි භාවිත කළ ඩෝරියන්වරු නිසා ග්‍රීසියේ පාවන් අඳුරු යුගය අවසන් වී ක්‍රි.පූ. 1000 පමණ ග්‍රීක ශිෂ්ටාචාරයේ වර්ධනය වේ.

ව්‍යාප්තිය

- ග්‍රීසියේ ලිඛිත ඉතිහාසය ආරම්භ වන්නේ ක්‍රි.පූ. 750 දී පමණ ය. මේ වන විට ග්‍රීසිය කුඩා පෞර රාජ්‍ය (පොලිස්) නවයකට බෙදී තිබීම
- මේවා ස්වාධීන දේශපාලන ඒකක විය. මේවා අතුරෙන් ඇතැන්ස් හා ස්පාර්ටා ප්‍රබල විය.
- පෞර රාජ්‍ය අතර තරගකාරිත්වය නිසා ගැටුම් ඇති විය.
- පර්සියාවේ ඩේරියස් රජු ඇතැන්ස්වලට එරෙහිව ආක්‍රමණ කිහිපයක් සිදු කිරීම
- ඩේරියස් රජුගේ පුත් සෙරේසස් ඇතැන්ස්වලට ආක්‍රමණ එල්ල කලත් පෙරික්ලීස් රජු යටතේ පර්සියන්වරු පළවා හැර ස්වාධීන විය.
- නිරන්තරයෙන් ඇතැන්ස් හා ස්පාර්ටා අතර ගැටුම් හේතුකොට සියලු පෞර රාජ්‍ය මැසිඩෝනියාවට යටත් විය.

පාලන ක්‍රමය

- මුලින්ම ග්‍රීසියට සංක්‍රමණය වූ ගෝත්‍රික ජනතාව ගම් වශයෙන් ජනාවාස පිහිටුවා ගැනීම. පසුව ඒවා නගර බවට පත් විය. එම නගර කේන්ද්‍ර කොට ගෙන පෞර රාජ්‍ය ක්‍රමය ඇති වීම.
- නගර කේන්ද්‍ර කරගෙන පාලන ක්‍රමය ගොඩනැගී තිබීම
- ග්‍රීක පිරිමින් පමණක් පුරවැසියන් ලෙස සැලකීම
- පෞර රාජ්‍ය තුළ ජනගහණය කොටස් 4කින් සමන්විත වීම
    - පුරවැසියන්
    - ස්ත්‍රීන්
    - වහල්ලු
    - විදේශිකයන්
- පෞර රාජ්‍යවල විවිධ ආණ්ඩුක්‍රම පැවතීම. උදාහරණ ඇතැන්ස් ඍජු ප්‍රජාතන්ත්‍රවාදය පුරවැසියන් සියලු දෙනාම ඍජුව ම පාලනයට සම්බන්ධ වීම.
- ස්පාර්ටා රාජාණ්ඩු ක්‍රමයට සමාන ආණ්ඩු ක්‍රමයක් පැවතීම
- තනි පුද්ගලයකු නොව ප්‍රභූන් දෙදෙනෙකු යටතේ බලය පැවතීම

ආර්ථික කටයුතු

- ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය
    - ඔලිව්
    - බාර්ලි
    - එළවළු ආදිය ප්‍රධාන වගා භෝග විය.

- ග්‍රීසියේ පෞර රාජ්‍ය මධ්‍යධරණී මුහුදෙන් වට වී ඇති බැවින් පුළුල් ලෙස ධීවර කටයුතු සිදු කිරීම
- ප්‍රධාන පෞර රාජ්‍යයක් වන ඇතන්ස් කේන්ද්‍රකොට විදේශ වෙළෙඳාම පැවතීම.
- වහල් ක්‍රමය යටතේ ශ්‍රමය ලබා ගැනීම

**ක්‍රියාකාරකම**

1. පහත සඳහන් ස්ථාන යුරෝපා සිතියමක ලකුණු කර නම් කරන්න.

ඇතැන්ස්, ස්පාටා, ඔලිම්පස්, ක්‍රීට් දූපත්, ඇකේඩියා, නෙසලියා, ඇරකේඩියා

2. ''ග්‍රීක ශිෂ්ටාචාරයේ පාලනය හා ආර්ථිකය'' යන මැයෙන් රචනාවක් ලියන්න.

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- සිතියම නිවැරදි ව ලකුණු කර නම් කිරීම
- ග්‍රීක ශිෂ්ටාචාරයේ පාලනය හා ආර්ථිකය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- රචනාවට නිවැරදි ව කරුණු ඇතුළත් කිරීම
- නිර්මාණශීලීව කරුණු ගොනු කිරීම
- නියමිත කාලයේ දී රචනය අවසන් කිරීම

**නිපුණතාව** : ලෝක ශිෂ්ටාචාරවල ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : **5.1.2 ග්‍රීක ශිෂ්ටාචාරයේ ආගමික, සමාජ හා සංස්කෘතික ක්ෂේත්‍ර පිළිබඳ විමසා බලයි.**

**කාලච්ඡේද** : **02යි.**

**ඉගෙනුම් පල** :

- ග්‍රීක ශිෂ්ටාචාරයේ ආගමික තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.
- ග්‍රීක ශිෂ්ටාචාරයේ සමාජ තත්ත්වය පිළිබඳ අදහස් දක්වයි.
- ග්‍රීසියේ කලා කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- නිදහස් චින්තනය තුළින් ශ්‍රේෂ්ඨ නිර්මාණ බිහි වන බව පිළිගනියි.
- විවේක කාලය අර්ථාන්විත ව ගත කිරීමට පෙලඹෙයි.
- විශිෂ්ට සමාජයක් ගොඩනැගීමට අධ්‍යාපනය ප්‍රබල ලෙස බලපාන බව පිළිගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**5.1.2 ග්‍රීක ශිෂ්ටාචාරයේ ආගමික, සමාජ හා සංස්කෘතිය**

- ආගමික තත්වය

  ආගමික ඇදහිලි හා විශ්වාස

  - ග්‍රීක වැසියා බහුදේවවාදීන් වීම
  - ස්වභාවික වස්තූන් දේවත්වයෙන් සැලකීම
  - විවිධ අංශවලට සම්බන්ධ දෙවිවරු බොහෝ පිරිසක් සිටීම
    - අහසට අධිපති - සියුස්
    - යුද්ධයට අධිපති - ඒරස්
    - සූර්ය දෙවියා - ඇපලෝ
    - සමුද්‍රයට අධිපති - ප්‍රොසයිඩන්
    - ලෝකය උසුලා සිටින්නා - හර්කියුලිස්

  දෙවිවරුන් උදෙසා විවිධ පූජා විධි පැවතීම

  උදාහරණ : බිලි පූජා

- **ග්‍රීක කලාව හා ගෘහ නිර්මාණය**

  **මූර්ති කලාව**

- ග්‍රීසියේ විසූ දක්ෂ මූර්ති ශිල්පීන් අතින් අග්‍රගණ්‍ය කලා නිර්මාණ බිහි වීම.
- මූර්ති සඳහා ඇත් දළ හා රත්‍රං ආදිය භාවිත කිරීම

උදාහරණ:

ඇතීනාගේ ප්‍රතිමාව

මල්ලවපොර දැක්වෙන මූර්ති

- නිර්මාණය කරන ලද මූර්ති බොහොමයක් නග්න රූපවීම
- මිනිසාගේ විවිධ ඉරියව්වල දී මාංස පේෂී ක්‍රියාත්මක වන ආකාරය තාත්විකව ඉදිරිපත් කර ඇත.



ඡායාරූපය 5.1.2.1 ඇතීනා දෙවඟන



ඡායාරූපය 5.1.2.2 මල්ලවපොර දැක්වෙන අර්ධෝන්නත කැටයම


චිත්‍ර

- විශාල ගොඩනැගිලි (දෙව්මැදුරු හා පොදු ගොඩනැගිලි) ඉදි කිරීමේදී ඒවා චිත්‍රවලින් අලංකාර කිර තිබීම.



ඡායාරූපය 5.1.2.3 ඇතීනා දෙවගන වෙනුවෙන් ඇක්‍රොපොලිස් කඳු මුදුනේ ඉදි කළ පාතිනන් දෙව් මැදුර

- ග්‍රීක චිත්‍ර ශිල්පියකු වන ඇපලෝඩෝරස් චිත්‍ර ඇඳීමේ දී ආලෝකය හා අඳුර නිවැරදි ව භාවිත කිරීම පිළිබඳ ක්‍රමවේද හඳුන්වා දීම
- විවිධ මැටි බඳුන් අලංකාර කිරීමට ද චිත්‍ර ඇඳ තිබීම





ඡායාරූපය 5.1.2.4 විවිධ අලංකාර මැටි බඳුන්

- මිනිසුන්ගේ මුහුණෙන් පිළිබිඹු වන හැඟීම් ඉතා තියුණු ලෙස විදහා දක්වා තිබීම


සාහිත්‍ය කලාව

- ග්‍රීසියේ ඉතා විශිෂ්ට මට්ටමේ නාට්‍ය කලාවක් පැවතීම
- නූතන නාට්‍ය කලාව ආරම්භ වන්නේ ග්‍රීසියේ වාසය කළ නාට්‍ය කරුවෙකු වූ පෙරික්ලන්ගේ කාලයේ ය

- මෙකල සුඛාන්ත, ශෝකාන්ත මෙන් ම විකට නාට්‍ය නිර්මාණය විය.
- ග්‍රීසියේ විසූ ප්‍රකට නාට්‍ය කරුවන්,



ඡායාරූපය 5.1.2.5 සොපොක්ලීස්




ඡායාරූපය 5.1.2.6 ඇරිස්ටොපේනස්

- නාට්‍ය රඟ දැක්වීම සඳහා භාවිත කළ ඩයෝනීසියස්ගේ රඟමඬල

සාහිත්‍යය

- ග්‍රීසියේ ඉතා උසස් සාහිත්‍ය කලාවක් පැවතීම
- හෝමර් නම් කවියාගේ ඉලියඩ් සහ ඔඩිසි ලෝක ප්‍රකට කෘතිය.


අධ්‍යාපනය හා දාර්ශනික තත්ත්වය

- අධ්‍යාපනය පිරිමි දරුවන්ට හා තරුණයින්ට පමණ විය. විවිධ ගුරුවරුන් විසින් පවත්වාගෙන ගිය පෞද්ගලික පාසල් පැවතීම.

  උදාහරණ:

  - ප්ලේටෝගේ ඇකඩමි නම් ආයතනය
  - ඇරිස්ටෝටල්ගේ ලයිසියම් නම් ආයතනය

- සොෆිස්ට්, නම් ගුරුවරු බොහෝදෙනා අතර ජනප්‍රිය වීම
- ගණිතය, තාරකා ශාස්ත්‍රය, ව්‍යාකරණ, සාහිත්‍ය, කථිකත්වය ආදී විෂයයන් ඉගැන්වීම
- ස්පාර්ටා පෞර රාජ්‍යයේ සෑම පුරුෂයකුම යුද පුහුණුව ලැබිය යුතු වීම
- අධ්‍යාපනය හරහා විවිධ දාර්ශනිකයන් හා දාර්ශනික මතවාද ගොඩනැගීම



ඡායාරූපය 5.1.2.7 ප්ලේටෝ



ඡායාරූපය 5.1.2.8 ඇරිස්ටෝටල්



ඡායාරූපය 5.1.2.9 හෙරඩෝටස්

- ප්ලේටෝගේ **රිපබ්ලික්** නම් කෘතිය
- ඇරරිස්ටෝටල්ගේ **පොලිටික්ස්** නම් කෘතිය
- හෙරඩෝටස් ඉතිහාසයේ පියා

**ගෘහ නිර්මාණය**

ආගමික හා පොදු ගොඩනැගිලි හුණුගල් හා කිරිගරුඬෙන් ඉදිකර තිබීම කැපී පෙනෙන ලක්ෂණයකි.

ඉතා විශාල කුළුණු ඉදි කිරීම ද කැපී පෙනෙන තවත් ලක්ෂණයකි.


ගෘහ නිර්මාණ කටයුතු සඳහා විවිධ ශෛලීන් අනුගමනය කිරීම.

ඩොරික්

ජියෝනියන්

කොරින්තියන්

**ග්‍රීක සමාජය**




- පුරවැසිභාවය පියාගෙන් පුතාට උරුමවන්නක් වීම
- විදේශිකයින්ට හා වහල්ලුන්ට පුරවැසිභාවය හිමි නොවීම.
- සමාජයේ ඉහත ස්ථානය පුරුෂයන්ට හිමි වූ අතර කාන්තාවන්ට හිමිවුණේ ඊට වඩා පහත් මට්ටමකි.

- රාජ්‍ය පාලනය, අධ්‍යාපනය වැනි වැදගත් කටයුතු සඳහා ප්‍රමුඛස්ථානය පුරුෂයන්ට හිමි විය.
- ගේදොර කටයුතු සිදු කිරීම කාන්තාවන්ගේ ප්‍රධාන කාර්යය විය.
- වහල් සේවය නිසා ග්‍රීක වැසියන්ට බොහෝ ලෙස විවේකී ව කාලය ගත කරන්නට ඉඩ ලැබී ඇත.
- ක්‍රීඩාවලට සම්බන්ධ වීම මුළුමනින් ම පුරුෂයින්ට පමණක් සීමා විය.
- ග්‍රීක සමාජය තුළ ක්‍රීඩා අංශයට සුවිශේෂ ස්ථානයක් හිමි වී තිබිණි.
  - වඩාත් ජව සම්පන්න පුරුෂයන් තෝරා ගැනීමට ක්‍රීඩාව උපයෝගී කර ගෙන ඇත.



ඡායාරූපය 5.1.2.10 මල්ලවපොර කරුවන් නිරූපිත මූර්තිය

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකම සිදු කරන්න.**

- ග්‍රීක ශිෂ්ටාචාරයේ ආගමික, සමාජ, සංස්කෘතික ක්ෂේත්‍ර පිළිබඳ බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න.
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- සකස් කරන ලද ලිපිය නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- ශිෂ්‍ය නිර්මාණ පන්ති බිත්ති පුවත්පතෙහි ප්‍රදර්ශනය කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- කරුණු නිවැරදි වීම
- කරුණු සංවිධානගත කිරීම
- නිර්මාණශීලී වීම
- මූලාශ්‍රය භාවිත කිරීම
- කාල කළමනාකරණය කිරීම

**නිපුණතාව** : ලෝක ශිෂ්ටාචාරවල ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 5.1.3 ග්‍රීක ශිෂ්ටාචාරයේ පරිහානිය හා ලෝකයට උරුම වූ දායාද පිළිබඳ අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- ග්‍රීක ශිෂ්ටාචාරයේ පරිහානියට බලපෑ හේතු දක්වයි.
- ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද පෙන්වා දෙයි.
- ග්‍රීක ශිෂ්ටාචාරයේ පරිහානියක් සිදු වුවත්, එහි දායාද වර්තමානයේ ද විද්‍යමාන වන බව අගය කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- ග්‍රීකයන් ලෝකයට උරුම කළ දායාද අගය කරයි.
- ග්‍රීක වැසියන්ගෙන් ලද ආදර්ශ චරිතායනය කර ගැනීමට පෙලඹෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.

**5.1.3 ග්‍රීක ශිෂ්ටාචාරයේ පරිහානිය හා ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද**

- අභ්‍යන්තර ගැටුම් අභ්‍යන්තර ස්පාර්ටා අතර පැවති පෙලපොනේසියානු යුද්ධය
- විදේශීය ආක්‍රමණ එල්ල වීම (මැසිඩෝනියානු ආක්‍රමණ)
- ඇලෙක්සැන්ඩර් යටතේ ග්‍රීක පෞර රාජ්‍ය විනාශ වී නව ශිෂ්ටාචාරයක් බිහි විය. එය හෙලනිස්තික ශිෂ්ටාචාරය යි.



**ඡායාරූපය 5.1.3.1 පෙලපොනේසියානු යුද්ධය නිරූපිත චිත්‍රයක්**

- **ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද**

    - ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම
    - දාර්ශනික මතවාද
    - සාහිත්‍ය කෘති
    - ගෘහනිර්මාණ ශිල්ප ක්‍රම
    - නාට්‍ය හා රංග ශාලා නිර්මාණය
    - ඔලිම්පික් ක්‍රීඩාව

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකම සිදු කරන්න.**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඉදිරිපත් කිරීමට සූදානම් වීම සඳහා කාලය ලබා දෙන්න.
- ශිෂ්‍ය ඉදිරිපත් කිරීම් සඳහා මග පෙන්වන්න.
- කණ්ඩායම් ඉදිරිපත් කිරීම්වලට අවස්ථාව ලබා දී ඉදිරි පෝෂණ ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- ශිෂ්‍ය ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

**ඇමුණුම් අංක 01**

| |
|---|
| **කාර්ය පත්‍රිකාව 01**<br>ග්‍රීක ශිෂ්ටාචාරයේ පරිහානිය පිළිබඳ ව විස්තරයක් කරන්න. |

| |
|---|
| **කාර්ය පත්‍රිකාව 02**<br>''ග්‍රීක ශිෂ්ටාචාරයෙන් පසුකාලීන ලෝකයට උරුම වූ දායාද'' යන මැයෙන් රචනයක් ලියන්න. |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ග්‍රීක ශිෂ්ටාචාරය පරිහානියට බලපෑ හේතු ඉදිරිපත් කිරීම
- ග්‍රීක ශිෂ්ටාචාරයෙන් උරුම වූ දායාද නම් කිරීම
- එම දායාද පිළිබඳ අගයමින් විස්තර කිරීම
- තොරතුරු නිවැරදි ව ඉදිරිපත් කිරීම
- උපදෙස් පිළිපැදීම

**නිපුණතාව** : ලෝක ශිෂ්ටාචාරවල ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : **5.2.1 රෝම ශිෂ්ටාචාරය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.**

**කාලච්ඡේද** : **01යි.**

**ඉගෙනුම් පල** :

- රෝම ශිෂ්ටාචාරයේ භූ භෞතික පරිසරය පිළිබඳ හඳුන්වා දෙයි.
- රෝම ශිෂ්ටාචාරයේ ආරම්භය විස්තර කරයි.
- රෝම ශිෂ්ටාචාරයේ වර්ධනීය අවස්ථාවන් පෙන්වා දෙයි.
- රෝම ශිෂ්ටාචාරයේ ව්‍යාප්තිය වූ ප්‍රදේශ හා ඓතිහාසික ස්ථාන සිතියමක ලකුණු කොට නම් කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- ශිෂ්ටාචාර බිහිවීමට බලපෑ භූගෝලීය සාධකවල වැදගත්කම අවබෝධ කර ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**5.2.1 රෝම ශිෂ්ටාචාර ව්‍යාප්තිය**

- මධ්‍යධරණී මුහුදට නෙරාගිය ඉතාලි අර්ධද්වීපයේ රෝමය පිහිටා තිබීම
- රට මැදින් ගලා බසින ටයිබර් නදිය මුව දොරට සමීපව රෝම නගරය පිහිටීම
- ඇල්ප්ස් හා ඇපිනයින් කඳු වැටිවල පිහිටීම හා එහි බලපෑම
- කඩතොලු සහිත වෙරළ
- ස්වභාවික සම්පත් බහුල ව පැවති ප්‍රදේශයන් වීම
- රෝමය ශිෂ්ටාචාරයක් ලෙස වර්ධනයවීමට භූගෝලීය පරිසරය බලපා ඇත.
- ඉතාලි අර්ධද්වීපයේ හා සිසිලි දූපත පදනම් කරගෙන රෝම ශිෂ්ටාචාරය බිහි වීම අප්‍රිකාව හා යුරෝපය සම්බන්ධ කරන පවුරක් ලෙස රෝම ශිෂ්ටාචාරය පැවතීම
- වෙළෙඳ කටයුතුවලින් බොහෝ ආර්ථික වාසි ලබා ගැනීමට හැකි වීම

**රෝම ශිෂ්ටාචාරයේ ආරම්භය හා එහි බලය ව්‍යාප්තිය**

- ක්‍රි.පූ.753 දී රොමියුලස් හා රීමස් නම් නිවුන් සහෝදරයන් විසින් රෝමය ගොඩනැගූ බව
- ක්‍රි.පූ දෙවන සියවසේ සිට ක්‍රි.ව. පස්වන සියවස අතර කාලය රෝම ශිෂ්ටාචාරය බෙහෙවින් දියුණුව පැවති යුගය වීම.
- ලතින් භාෂාව කතා කරන ජනතාවක් විසින් ප්‍රථමවරට රෝම නගරය සොයා ගෙන ඇති බව පුරාවිද්‍යාත්මක පර්යේෂණවලින් අනාවරණය වී ඇත.
- මෙම ජන කොටස පසුව රෝමවරු බවට පත් වූහ.
- සුළු ආසියානු ප්‍රදේශවල සිට සංක්‍රමණය වූ ගෝත්‍රයක් වූ එට්ට්‍රස්කන්වරු ඉතාලි ප්‍රදේශවල ජනාවාස පිහිටුවාගත් මුල් පදිංචිකරුවන් ලෙස සැලකේ.
- රෝම ශිෂ්ටාචාරයට පදනම සකස් කරනුයේ මෙම එට්ට්‍රස්කන්වරුන් විසිනි.
- ක්‍රි.පූ. පස්වන සියවස වන විට එට්ට්‍රස්කන්වරුන්ගේ හා ග්‍රීකවරුන්ගේ බලපෑම මත රෝමවරුන්ගේ ජන ජීවිතය ගොඩනැගී තිබීම
- ලෝහ තාක්ෂණය හේතුකොට රෝමවරු අවි ආයුධ පමණක් නොව නැව් නිෂ්පාදනය කිරීමට තරම් නාවික තාක්ෂණයෙන් යුතු පිරිසක් වීම
- ග්‍රීකයන් මෙන් කලාකාමී පිරිසක් නොව, රෝමවරු රණකාමී පිරිසක් වීම



ඡායාරූපය 5.2.2.1 එට්ට්‍රස්කන්වරුන්ගේ ගොඩනැගිලි

**ඉතාලිය තුළ බල ව්‍යාප්තිය**

- පැලටයින් කඳු මුදුනේ ආරම්භ වූ රෝම නගරය සියවස් කීපයකට පසුව අධිරාජ්‍ය යක් දක්වා ව්‍යාප්ත වීම
- එට්ට්‍රස්කන්වරුන් අත පැවති රෝමයේ ප්‍රදේශ රෝමවරුන් විසින් අල්ලා ගැනීම.
- රණකාමී ජන කොටසක් වූ ගෝල්වරුන්ගෙන් රෝමයට දැඩි ප්‍රහාර එල්ල වූ අතර ඔවුන් රෝමය ගිනි තබා විනාශ කිරීම
- ගෝලිවරුන්ගේ ප්‍රහාරයෙන් ගැලවීම සඳහා රෝමවරුන් විසින් විශාල වන්දි මුදල් ගෙවීම
- තවත් ගෝත්‍රික පිරිසක් වූ සැම්නයිට්ස්වරුන් පරාජය කිරීමෙන් රෝමය මධ්‍යම ඉතාලියේ බලවතා බවට පත් වීම
- ග්‍රීකයන් සමග සටන්වලින් මුල් අවස්ථාවේ රෝමවරු පසුබෑව ද පසුව ලද ජයග්‍රහණයෙන් දකුණු ඉතාලියේ රෝමවරු බලය ලබා ගත්හ.
- ක්‍රි.පූ. 270 පමණ වන විට රෝමවරු යටතේ ඉතාලිය බලවත් වීම


**කාතේජය යටත් කර ගැනීම**

- රෝමවරු හා කාතේජය (සිසිලියට මුහුණ ලා පිහිටි රාජ්‍යයකි.) අතර පැවති යුද්ධ
- මෙම යුද්ධ **පියුනික් යුද්ධ** ලෙස හැඳින්වේ.
- කාතේජයේ පැවති ධන බලය රෝමවරුන් එයට විරුද්ධව සටන් කිරීමට හේතු විය.
- ක්‍රි.පූ. 197 මසිඩෝනියාව, සිරියාව, රෝමයේ පාලනය යටතට පත්වීම (රෝමයට කප්පම් ගෙවන රාජ්‍යයක් බවට පත්වීම)
- ඊජිප්තුව රෝමයේ පාලනයට නතු වීම

**රෝමය අධිරාජ්‍යයක් ලෙස වර්ධනය වීම**

- ජුලියට් සීසර්, ඔගස්ටස් සීසර්, නීරෝ, කැරකැල්ලා, කොන්ස්ට්කයින්, ජස්ට්ටීනියන්, මාකස් අවුරේලියස් යටතේ රෝම අධිරාජ්‍ය ව්‍යාප්ත වීම
- බටහිර යුරෝපය, නැගෙනහිර යුරෝපය, අප්‍රිකාව, මැදපෙරදිග ප්‍රදේශවල රෝම අධිරාජ්‍ය ව්‍යාප්ත වීම
- ඔගස්ටස් සීසර්ගේ අවදිය රෝම අධිරාජ්‍යයේ ස්වර්ණමය යුගය වීම
- ඔගස්ටස්ගේ පුත්‍රයා වූ තිබ්රියස් ප්‍රථමවරට තමා රෝම අධිරාජ්‍යයා බවට ප්‍රකාශ කිරීම
- මෙමගින් සමූහාණ්ඩු ක්‍රමය අවසන් වී රෝම අධිරාජ්‍ය තුළ එක පුද්ගලයෙකු විසින් පාලනය කරනු ලබන ක්‍රමයක් ආරම්භ වීම

ඇමුණුම් අංක 5.2.1 යුරෝපා ආකෘතික සිතියම



**ක්‍රියාකාරකම 01**

ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකම් සිදු කරන්න.

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- ඇමුණුම් අංක 5.2.1හි ඇතුළත් යුරෝපා ආකෘතික සිතියම සිසුන්ට ලබා දෙන්න.
- මධ්‍යධරණී මුහුද, ඉතාලි අර්ධද්වීපය, රෝමය, ටයිබර් නදිය, සිසිලි දූපත, ඇල්ප්ස් කඳු, ඇපනයින් කඳු) ස්ථාන දී ඇති සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- දී ඇති ස්ථාන නිවැරදි ව ලකුණු කිරීම.
- ලකුණු කරන ලද ස්ථාන නිවැරදි ව නම් කිරීම
- සංකේතවලට අදාළ වර්ණ භාවිත කිරීම
- පිරිසිදුව කාර්ය නිම කිරීම
- කාලය කළමනාකරණය කිරීම

**ක්‍රියාකාරකම 02**

රෝමය අධිරාජ්‍යයක් ලෙස වර්ධනය වූ ආකාරය පිළිබඳ බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න.

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- ලිපිය නිර්මාණාත්මකව සකස් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ ලිපිය සකස් කරන්න.
    - රෝම ශිෂ්ටාචාරයේ ආරම්භය
    - බලය ව්‍යාප්ත කරගත් ආකාරය, රෝමය
    - අධිරාජ්‍යයක් බවට පත්වීම
- ලිපිය සකස් කිරීමට අවශ්‍ය මගපෙන්වීම සිදු කරන්න.
- ලිපියට අවශ්‍ය ඡායාරූප ආදිය ද රැගෙන එන ලෙස දැනුම් දෙන්න.
- සිසු නිර්මාණ ප්‍රදර්ශනය කරන්න.
- නිර්මාණ අගයමින් අවශ්‍ය ඉදිරිපෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- රෝම ශිෂ්ටාචාරයේ භූ භෞතික පරිසර හඳුන්වා දීම
- රෝම ශිෂ්ටාචාරයේ ආරම්භය විස්තර කිරීම
- රෝම ශිෂ්ටාචාරයේ වර්ධනීය අවස්ථා පෙන්වා දීම
- රෝම ශිෂ්ටාචාරය ව්‍යාප්ත වූ ප්‍රදේශ ආකෘතික සිතියමක
- එම දායාද පිළිබඳ අගයමින් විස්තර කිරීම
- තොරතුරු නිවැරදි ව ඉදිරිපත් කිරීම
- උපදෙස් පිළිපැදීම

**නිපුණතාව** : ලෝක ශිෂ්ටාචාරවල ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : **5.2.2.** රෝම ශිෂ්ටාචාරයේ පාලනය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**ඉගෙනුම් පල** :

- රෝම පාලන ක්‍රමයේ විකාශනය විස්තර කරයි.
- රෝම පාලනයේ සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරයි.
- රෝමය අධිරාජ්‍යවාදී පාලන ක්‍රමය ලෝකයට දායාද කළ බව පෙන්වා දෙයි.

**කාලච්ඡේද** : 01යි.

**ආකල්ප හා හර පද්ධති**

- රෝමයේ පැරණි සංවිධානාත්මක පාලන ක්‍රමවේදය වර්තමානයට ප්‍රයෝජනවත් වන ආකාරය අගයයි.
- රෝම සභ්‍යත්වය විධිමත් ලෙස ගොඩනැගුනේ යහපත් පාලන ක්‍රමවේදයකින් බව වටහා ගනියි

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 5.2.1.1 කාර්ය පත්‍රිකාව

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**5.2.2 රෝම ශිෂ්ටාචාරයේ පැවති පාලන ක්‍රමවේද**

- සමූහාණ්ඩු පාලනය
- අධිරාජ්‍ය පාලනය

**සමූහාණ්ඩු පාලනය**

- රෝමයේ ඉහළින් ම සිටි ප්‍රධාන පුරවැසියන්ගෙන් රෝම සමූහාණ්ඩුව සකස් වීම; ඒ පිරිස පැට්‍රීෂියන්වරුන් ය; සමූහාණ්ඩු අවදියේ රෝමය පාලනය කළේ මේ පිරිස විසිනි.

- සමූහාණ්ඩු පාලනය තුළ සෙනෙට් සභාව නම් ප්‍රධාන ආයතනයක් තිබීම

- සමූහාණ්ඩු පාලනය රාජ්‍ය නිලධාරීන් දෙදෙනෙකු යටතේ පැවතීම; එම නිලධාරීන් කොන්සල්වරුන් ලෙස හැඳින්වීම.



ඡායාරූපය 5.2.2.3 ඔගස්ටස් සීසර්

- කොන්සල්වරු ප්‍රධාන විනිශ්චයකාරවරු හා හමුදාවේ ජන රාල්වරුන් ලෙස ද කටයුතු කිරීම
- සෙනෙට් පාලනය බහුතර ජනතාවට පීඩාකාරීවීම; මේ නිසා දෙපිරිස අතර අරගල ඇති වීම
- රාජ්‍ය පාලනය තුළ රටේ බහුතර ජනතාවගේ නියෝජන යක් නොතිබීම නිසා පාලන කටයුතුවලට සම්බන්ධවීමට ක්‍රියාකිරීම
- රෝම සමූහාණ්ඩුවේ බලය ක්‍රමයෙන් දුර්වල වීම
- ත්‍රිපුද්ගල පාලන ක්‍රමය
- රෝමයේ ත්‍රිපුද්ගල පාලනය හඳුන්වා දෙනු ලැබුවේ පොම්පේ විසිනි.

ප්‍රථම ත්‍රිපුද්ගල පාලකයන් වූයේ

» පොම්පේ - හමුදා නායකත්වය

» ක්‍රේසස් - මුදල් භාරකාරත්වය

» සීසර් - දේශපාලන කටයුතු

- සීසර් විවිධ ප්‍රදේශ යටත් කරමින් රෝමයේ ව්‍යාප්තිය දිගින් දිගටම සිදු කිරීම
- ජනතාව අතර සීසර් ජනප්‍රිය වීම
- ක්‍රේසස් මිය යාම සමග ත්‍රිපුද්ගල පාලනය තවදුරටත් ක්‍රියාත්මක නොවීම
- සීසර්ගේ යුද කටයුතු දිගින් දිගටම සිදු වූ අතර ඔහු යටතේ ඒකාධිපතිත්වයක් නිර්මාණය වීම
- සමූහාණ්ඩුව තවදුරටත් පැවතියත් එය නාමිකව පැවතීම සහ සීසර් සැබෑම පාලකයා වීම. (ඔටුනු නොපැළඳු පාලකයා විය)
- ක්‍රි.පූ. 44 දී ඔගස්ටස් ඝාතනය කිරීම
- ත්‍රිපුද්ගල පාලනය අවසන් වී එක් පාලකයකු යටතේ බලය කේන්ද්‍ර ගත වීමත් සමග සමූහාණ්ඩු පාලනය අවසන් වීම
- රෝමයට යටත් සියලු ම ප්‍රදේශ එක් පාලකයෙකු යටතට පත්වීමෙන් ඔහු අධිරාජ්‍යයෙකු ලෙස සැලකීම
- සීසර්ට පසුව ඔක්ටේවියන් ක්‍රි.පූ. 14 වන තෙක් රෝම අධිරාජයා ලෙස පාලනය මෙහෙය වීම

**අධිරාජ්‍යවාදී පාලනය**

- ඔගස්ටස් සීසර් රෝම අධිරාජ්‍යය විධිමත් හා සංවිධානාත්මක එකක් බවට පත් කිරීම.
- මොහුට පසුව නීරෝ, කොන්ස්ටන්ටන්ස්, ජස්ටීනියස් යන අධිරාජයන් යටතේ රෝම අධිරාජ්‍යය බලවත් ලෙස පැවතීම

- තවදුරටත් සෙනෙට් සභාව පැවතියත් අධිරාජ්‍යයා වටා සියලු බලතලම කේන්ද්‍රගත වී පැවතීම.
- රෝමයේ අධිරාජ්‍යා අසහාය නායකත්වයට පත් වීම
- **සීසර්** යනු ''අධිරාජයා'' යන්නයි.

ඉහත කරුණු ආවරණය වන පරිදි ඇමුණුම 5.2.1.1 ක්‍රියාකාරකම සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- රෝම පාලන ක්‍රම විස්තර කිරීම
- රෝම පාලනයේ සුවිශේෂ ලක්ෂණ පෙන්වාදීම
- නිවැරදි කරුණු ඇසුරින් වගුව සම්පූර්ණ කිරීම
- සහයෝගයෙන් කටයුතු කිරීම
- නියමිත කාලයට නිම කිරීම

**ඇමුණුම 5.2.1.1 කාර්ය පත්‍රිකාව**

1. ඉහත සඳහන් කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න.
   - මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
   - පහත සඳහන් වගුව ශිෂ්‍යයන්ට අභ්‍යාස පොතේ සටහන් කර අදාළ ආණ්ඩුවල ප්‍රධාන ලක්ෂණ ඇසුරෙන් වගුව සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.
   - සිසු ක්‍රියාකාරකම් ඇගයීම සිදු කරන්න.

| සමූහාණ්ඩු | අධිරාජ්‍ය |
|---|---|
| | |

**නිපුණතාව** : ලෝක ශිෂ්ටාචාරවල ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : **5.2.3 රෝම ශිෂ්ටාචාරයේ ආර්ථිකය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි**

**කාලච්ඡේද** : 01යි.

**ඉගෙනුම් පල** :

- රෝම ආර්ථික තත්ත්වය පැහැදිලි කරයි.
- රෝම ආර්ථිකය විවිධ ක්ෂේත්‍ර ඇසුරින් පැවැති බව පෙන්වා දෙයි.
- රෝම ආර්ථිකය දියුණු තත්වයක පැවැති බව අගය කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- පැරණි අර්ථක්‍රමයේ විවිධ අංශවල ඇති වූ වර්ධනය අගයයි
- ජනගහන වර්ධනයත් සමග අර්ථ ක්‍රමයේ ඇති වූ වර්ධනය අවබෝධ කර ගැනීමට උනන්දු වෙයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 5.2.3 කාර්ය පත්‍රිකාව

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**5.2.3 රෝම ශිෂ්ටාචාරයේ ආර්ථිකය**

**කෘෂිකර්මාන්තය**

- මිදි, ඔලිව්, බාර්ලි, තිරිඟු, ඕට්ස් වැනි දෑ මහා පරිමාණ වශයෙන් වගා කිරීම
- කෘෂිකර්මාන්ත සඳහා අවශ්‍ය ශ්‍රමය වහල් ශ්‍රමය හරහා ලබා ගැනීම
- කුඩා පරිමාණ ගොවියන් ග්‍රාමීය මට්ටමින් වගා කටයුතු කිරීම.



**ඡායාරූපය 5.2.3.1 ඔලිව්**

- වගා කටයුතු සඳහා පැවති ඉඩම් විශාල වතු වශයෙන් පැවතීම මෙම මහා වතුවල වහලුන් සහ අඳ ගොවියන් සේවය කර ඇත.
- මහා පරිමාණ වතු හිමියන් හා සුළු වතු හිමියන් අතර දැඩි තරගයක් පැවතීම

**වෙළෙඳාම**

- රෝමය ඉතා ධනවත් වෙළෙඳ නගරයක් වීම හා පෙර අපර දෙදිග වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස පැවතීම.
- මධ්‍යධරණී මුහුදු ප්‍රදේශ රටවල් හා ඈත පෙරදිග රටවල් සමග වෙළෙඳ සබඳතා පැවැත්වීම.

උදාහරණඃ ඉන්දියාව, ශ්‍රී ලංකාව

භාතිකාභය රාජ්‍ය පාලන සමයේ රුවන්මැලි සෑය සඳහා රෝමයෙන් පබලු ගෙන්වීම.

**කර්මාන්ත**

- මිනිස් ශ්‍රමය යොදා ගනිමින් හස්ත කර්මාන්ත සිදු කිරීම.
- නිෂ්පාදිත භාණ්ඩ අතර

  රෙදි පිළි, මැටි භාණ්ඩ, වීදුරු භාණ්ඩ, විසිතුරු භාණ්ඩ, යකඩ මෙවලම්, ආයුධ ප්‍රධාන විය.
- කර්මාන්ත සඳහා ද ශ්‍රමය මෙන් ම නිදහස් ශ්‍රමය ද යොදා ගැනීම.
- රාජ්‍ය මට්ටමින් ද පවත්වාගෙන ගිය කර්මාන්ත පැවතීම.



ඡායාරූපය 5.2.3.2 රෝමයේ වහල්ලු දැක්වෙන මූර්තියක්



ඡායාරූපය 5.2.3.3 මැටි බඳුන්



ඡායාරූපය 5.2.3.4 ආයුධ

ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන සේ පහත ක්‍රියාකාරකම සිදු කරන්න.

**ක්‍රියාකාරකම**

- රෝම ශිෂ්ටාචාරයේ ආර්ථික කටයුතු පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- ක්‍රියාකාරකම සිදු කිරීම සඳහා උපදෙස් ලබා දෙන්න.
- ඒ සඳහා සුදුසු පරිදි කාලය ලබා දෙන්න.
- නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ප්‍රධාන ආර්ථික ක්ෂේත්‍ර විස්තර කිරීම
- දියුණු ආර්ථිකයක් පැවැති බවට සාධක ඉදිරිපත් කිරීම
- ඉදිරිපත් කිරීම වඩා නිර්මාණශීලී ව සිදු කිරීම
- නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීම
- ගුරු උපදෙස් පිළිපැදීම

**නිපුණතාව** : ලෝක ශිෂ්ටාචාරවල ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : **5.2.4** රෝම ශිෂ්ටාචාරයේ සමාජ, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද** : **02යි.**

**ඉගෙනුම් පල** :

- රෝම ශිෂ්ටාචාරයේ ජන ජීවිතය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- රෝමයේ පැවති සමාජ ක්‍රමය පිළිබඳ කරුණු දක්වයි.
- රෝමයේ ආගමික තත්ත්වය පිළිබඳව අදහස් දක්වයි.
- රෝමයේ කලා කටයුතු පිළිබඳ විස්තර කරයි.

**ආකල්ප හා හර පද්ධති :**

- රෝම ශිෂ්ටාචාරයේ සංස්කෘතිකාංග අගය කරයි.
- ක්‍රිස්තියානි ආගම යුරෝපීය ශිෂ්ටාචාරයේ පදනම බව පෙන්වා දෙයි.
- ආගමික සංකල්ප සෑම ක්ෂේත්‍රයකම ප්‍රවර්ධනයට බලපා ඇති බව පිළිගනියි.


**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**5.5 රෝම ශිෂ්ටාචාරයේ ජන ජීවිතය**

- පීතෘ මූලික සමාජයක් වීම
- කාන්තාවට සමාජයේ ගෞරවනීය තැනක් හිමි වීම
- කාන්තාව කෘෂිකාර්මික හා ගෘහස්ථ කර්මාන්තවලට සහය දීම
- කාන්තාව දේශපාලන කටයුතුවලට නායකත්වය දීම
- කාන්තාව ප්‍රසිද්ධ ආගමික උත්සවවලට සහභාගි වීම
- විවිධ ක්‍රීඩා (මල්ලව පොර, ගව පොර) ආදිය නැරඹීමට ලැබීම

**රෝම සමාජය**




- ප්‍රභූන් ලෙස ආගමික පූජකයන්, රාජ්‍ය පාලකයන්, රාජ්‍ය නිලධාරීන්
- වෘත්තිකයන්, වෙළෙන්දන්, ගොවීන් දෙවන සමාජ ස්තරයට අයත් විය.
- විවිධ රටවල් සමග යුද්ධ කොට අල්ලා ගත් පිරිස් රෝමයට ගෙනවිත් වහලුන් ලෙස තබා ගැනීම

**රෝම ශිෂ්ටාචාරයේ ආගමික තත්වය**

- රෝමය අධිරාජ්‍යයක් බවට පත් වන විටත් සංවිධානාත්මක ආගමක් නොපැවැතීම
- ස්වභාව ධර්මයේ විවිධ වස්තූන් දේවත්වයෙන් පිදීම

  උදාහරණ : වැස්ස, විදුලිය
- බහුදේවවාදයක් පැවතීම

උදාහරණ

✳ ජුපිටර් - අහසට අධිපති

✳ සෙරස් - අස්වැන්නට අධිපති

✳ මාර්ස් - යුද්ධයට අධිපති

✳ වීනස් - ආලයට අධිපති

- මළවුන් හා මියගිය අධිරාජයන් දේවත්වයෙන් පිදීම

උදාහරණ : ජුලියස් සීසර්, ඔගස්ටස් සීසර්ට වැඳුම් පිදුම් කිරීම

- භූතාත්ම වන්දනා කිරීම

**රෝම ශිෂ්ටාචාරයේ කලාව**
**නගර නිර්මාණ හා වාස්තු විද්‍යා**

- නගර සැලසුම් සහගත ව ඉදි කිරීම.
- ජලය බැස යාම සඳහා කාණු පද්ධති
- ගල් අතුරන ලද මහා මාර්ග
- පාලම් තැනවීමේ ශිල්පය
- ප්‍රභූවරු සඳහා සුඛෝපභෝගී නිවාස
- නාන තටාක ඉදි කිරීම
- එකවර මිනිසුන් 5000කට සහභාගි විය හැකි කොලෝසියම් ක්‍රීඩා පිටිය



ඡායාරූපය 5.2.4.1 නගර

- පොදු වැසිකිළි පද්ධතියක්
- රෝම ශිෂ්ටාචාරය සතු විශිෂ්ට සාහිත්‍යයක් පැවතීම
- රෝමයේ ප්‍රධාන භාෂාව වූයේ ලතින් භාෂාවයි.
- ජුලියස් සීසර්, සීසරෝ වැනි පාලකයින් ද ග්‍රන්ථ රචනා කිරීම
- ඔගස්ටස් අධිරාජ්‍ය කාලයේ විසූ සුප්‍රකට ලේඛකයකු වූ වර්ජිල් විසින් රචිත ඊනිඩ් කෘතිය ලෝකයේ ශ්‍රේෂ්ඨ සාහිත්‍ය කෘතියකි.
- පුවත්පත් මගින් ජනතාව දැනුවත් කිරීමට කටයුතු කිරීම

(යුද්ධ පිළිබඳ, මරණ දැන්වීම්, ක්‍රීඩා ආදිය පිළිබඳ පුවත්පත්වල පල කිරීම.)



ඡායාරූපය 5.2.4.2 මහා මාර්ග



ඡායාරූපය 5.2.4.3 පාලම්



ඡායාරූපය 5.2.4.4 නාන තටාකය



5.2.4.5 කොලෝසියම් ක්‍රීඩා පිටිය



5.2.4.6 කොලෝසියම් ක්‍රීඩා පිටිය ඇතුළත



5.2.4.7 වැසිකිළි

**මූර්ති ශිල්පය**

- රෝමවරු සතු විශිෂ්ට මූර්ති ශිල්පයක් පැවතීම.
- නීරෝ අධිරාජයාගේ ලෝකඩ හිස



**නීරෝ අධිරාජයාගේ ලෝකඩ හිස**

**ඉහත සඳහන් කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න.**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- රෝම ශිෂ්ටාචාරයේ ආගම, කලාව, සමාජය පිළිබඳ තොරතුරු ඇතුළත් කොට රචනාවක් ලිවීමට උපදෙස් දෙන්න.
- වඩාත් නිර්මාණශීලී රචනාව තෝරා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසු ප්‍රබලතා හා දුබලතා හඳුනා ගනිමින් ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- කරුණු නිවැරදි ව ඉදිරිපත් කිරීම
- කරුණු උදාහරණ සහිත ව ඉදිරිපත් කිරීම
- එක් එක් ක්ෂේත්‍ර අනුව කරුණු සංවිධාන ගත කිරීම
- කරුණු නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම
- නියමිත කාලයට අවසන් කිරීම

**නිපුණතාව** : ලෝක ශිෂ්ටාචාරවල ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 5.2.5 රෝම ශිෂ්ටාචාරයේ පරිහානිය හා ලෝකයට උරුම වූ දායාද පිළිබඳ අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද** : 01යි.

**ඉගෙනුම් පල** :

- රෝම ශිෂ්ටාචාරය පරිහානියට බලපෑ හේතු ඉදිරිපත් කරයි.
- රෝම ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද විස්තර කරයි.
- රෝම ශිෂ්ටාචාරය පරිහානියට පත් වුව ද එහි වටිනාකම් වර්තමානයේ ද දක්නට ඇති බව අගය කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- බල අරගල හේතුකොට ශිෂ්ටාචාර පරිහානියට පත්වන බව අවබෝධ කර ගනියි.
- රෝමවරුන්ගේ දායාද අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම අංක 5.6.1 කාර්ය පත්‍රිකාව

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**5.6 රෝම ශිෂ්ටාචාරයේ පරිහානිය හා බිඳ වැටීම**

- අභ්‍යන්තර දේශපාලන අස්ථාවරභාවය

  - ක්‍රි.ව. 180 මාකස් අවුරෙලියස්ගේ මරණයෙන් පසු අවදියේ අභ්‍යන්තර දේශපාලන අර්බුදවලින් ගහන අවදියක් වීම
  - කෙටි කාලයක් තුළ විශාල සංඛ්‍යාවක් අධිරාජ්‍ය පාලනය කිරීම
    උදාහරණ සියවසක් ඇතුළත අසූදෙනෙකු විසින් රාජ්‍ය පාලනය කිරීම
  - රෝම හමුදාවේ සිටි හමුදාවේ ඉහළ නිලධාරීන් හෝ සෙබළු රාජ්‍ය පාලනයට පත් වීම

ආර්ථිකය අඩාල වීම

- නිරන්තර සිවිල් අරගල නිසා යුධ කටයුතු සඳහා විශාල මුදලක් වැය වීම
- හමුදාව පවත්වා ගැනීමට විශාල පිරිවැයක් දැරීමට සිදු වීම

- රජමාලිගයේ නඩත්තු කටයුතු සඳහා වැය කිරීමට සිදු වීම
- රජයේ ආදායම වැඩි කර ගැනීමට ජනතාවට අධික බදු ගෙවීමට සිදු වීම
- ගොවි ජනතාව හමුදා සේවය බඳවා ගැනීම නිසා කෘෂිකාර්මික කටයුතු අඩාල වීම
    - ශ්‍රමිකයන් හිඟ වීම
- රාජ්‍ය ආදායම ශක්තිමත් කළ අතිරික්ත කෘෂි නිෂ්පාදන අඩු වීම
- රෝම සමාජය තුළ ඇති නැති පරතරය විශාල වීම
- සමාජයේ සුළු පිරිසක් වරප්‍රසාද භුක්ති විඳීම හා බහුතරයකට වැඩි වරප්‍රසාද අහිමි වීම
- රෝම සමාජය තුළ පොදු අධ්‍යාපන ක්‍රමයක් නොතිබීම. එම අයිතීන් ජනතාවට අහිමි වීම
- රෝම සමාජයේ පහළ ස්තරය නියෝජනය කළ බහුතර වහල් ජනතාවට මුහුණ දීමට සිදු වූ පීඩාකාරී තත්ත්වය නිසා අභ්‍යන්තර අරගලවල දී ප්‍රමුඛස්ථානය ගැනීම

**ම්ලේච්ඡ ආක්‍රමණ**

- රෝම ශිෂ්ටාචාරය බිඳවැටීමේ ආසන්නතම හේතුව ම්ලේච්ඡ ආක්‍රමණයන් ය.
    - ජර්මන් ගෝත්‍ර
    - හන්වරු

  ආදීන්ගෙන් ආක්‍රමණවලට රෝමයට නිරන්තරයෙන් මුහුණදීමට සිදු වීම

**රෝම ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද**

- ක්‍රිස්තියානි ආගම
- රෝම නීතිය
- ගෘහනිර්මාණ ශිල්පය
- ලතින් භාෂාව

**ඇමුණුම් අංක 5.6.1 කාර්ය පත්‍රිකාව**

- රෝම ශිෂ්ටාචාරයෙන් ලෝකයට උරුම වූ දායාද පිළිබඳව හෝ එහි පරිහානිය පිළිබඳව රචනාවක් ලියන්න.
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- ක්‍රියාකාරකම සිදු කිරීම සඳහා උපදෙස් ලබා දෙන්න.
- මේ සඳහා සුදුසු පරිදි කාලයක් ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- රෝම ශිෂ්ටාචාරයේ පරිහානියට බලපෑ හේතු ඉදිරිපත් කිරීම
- රෝම ශිෂ්ටාචාරය බිඳ වැටුණු ආකාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- රෝම ශිෂ්ටාචාරය බිඳ වැටුණ ද එයින් උරුම වූ දායාද වර්තමානයේ ද ඇති බව අගය කරයි.
- රචනාවක ව්‍යුහය පිළිබඳ අවබෝධ කරගෙන තිබීම
- සමස්ත නිමාව

**නිපුණතාව** : ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා නව ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 5.2.6 ක්‍රි.පූ 6 වන සියවසේ දේශපාලන තත්ත්වය පිළිබඳ විමර්ශනය කරයි.

**කාලච්ඡේද** : 01යි.

**ඉගෙනුම් පල** :

- සොළොස්මහා ජනපද නම් කරයි.
- සොළොස්මහා ජනපද සිතියමක ලකුණු කොට නම් කරයි.

**ආකල්ප හා හර පද්ධති** :

- වගකීමෙන් කටයුතු කිරීමට පෙලඹෙයි
- ශ්‍රේෂ්ඨ රජවරුන්ගේ චරිත ආදර්ශයට ගනියි

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම් අංක 5.2.6.1 සොළොස්මහා ජනපද දැක්වෙන සිතියම

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

5.2.6 මෞර්ය අධිරාජ්‍යය

**ක්‍රි.පූ. 6 වන සියවසේ ඉන්දියාවේ දේශපාලන තත්ත්වය**

- ඉන්දියාව තුළ ජනපද 16ක් ගොඩනැගී තිබීම
- මෙම ජනපදවල රාජාණ්ඩු හා ගණතන්ත්‍ර පාලන ක්‍රම පැවතීම ක්‍රි.පූ 6 වන විට ඉන්දියාව තුළ දේශපාලන එක්සත්භාවයක් නොවීම
- ජනපද 16 අතුරෙන් මගධය බලවත් රාජ්‍ය බවට පත් වීම

ඉහත සඳහන් කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න.

- ඇමුණුම් අංක 5.2.6.2හි ඇතුළත් වගුව හුණු පුවරුවේ සටහන් කරන්න.
- වගුව අභ්‍යාස පොතේ පිටපත් කර පෙළ පොත ඇසුරින් ක්‍රි.පූ. 6 වන සියවසේ සොළොස්මහා ජනපද පිළිබඳ තොරතුරු සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.
- සුදුසු පරිදි කාලය ලබා දෙන්න.
- ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඇගයීම් කරන්න.

**ඇමුණුම් අංක 5.2.6.2**


| සොළොස්මහා ජනපද | අගනගර | පාලන ක්‍රමය |
|---|---|---|
| 1. ............................................<br>2. ............................................<br>3. ............................................<br>4. ............................................<br>5. ............................................<br>6. ............................................<br>7. ............................................<br>8. ............................................ | | |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- සොළොස්මහා ජනපද නම් කිරීම
- ක්‍රි.පූ. 6 වන සියවසේ සොළොස්මහා ජනපද පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- නිවැරදි ව වගුව සම්පූර්ණ කිරීම
- ගුරු උපදෙස් පිළිපැදීම
- නියමිත කාලයට නිමා කිරීම

ඇමුණුම් අංක 5.2.6.1

## සොළොස්මහා ජනපද දැක්වෙන සිතියම



**නිපුණතාව** : ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා නව ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 5.2.7 මගධය අධිරාජ්‍යයක් ලෙස වර්ධනය වූ ආකාරය විමසා බලයි.

**කාලච්ඡේද** : 02

**ඉගෙනුම් පල** :

- මගධයේ බලවර්ධනයට බලපෑ භූගෝලීය පසුබිම විස්තර කරයි.
- රාජවංශ යටතේ මගධයේ බලය වර්ධනය වූ ආකාරය පෙන්වා දෙයි.
- මගධ අධිරාජ්‍යය ගොඩනැගීමට අශෝක රජුගේ දායකත්වය අගය කරයි.

**ආකල්ප හා හර පද්ධති :**

- මගධය කේන්ද්‍ර කරගෙන ඉන්දියාවේ දේශපාලන බලය වර්ධනය වීමේ වැදගත්කම අගයයි.
- අශෝක චරිතයෙන් ගත හැකි ආදර්ශ චරිතායනය කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්** :

- මගධ අධිරාජ්‍යය දැක්වෙන සිතියම
- කාර්ය පත්‍රිකාව

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**5.3.2.7 මගධය අධිරාජ්‍යයක් ලෙස වර්ධනය වීමට බලපෑ භූගෝලීය පසුබිම**

- ගංගා ගඟ නිසා මගධය අවට භූමි ප්‍රදේශය ඉතා සශ්‍රීක වීම (කෘෂිකාර්මික කටයුතු සඳහා යෝග්‍ය වීම) රන් හා යපස් බහුල ප්‍රදේශයක් වීම
- තාම්‍රලිප්ත වරායේ සිට පාටලිපුත්‍රය දක්වා වෙළෙඳ මාර්ගය මගධය ඔස්සේ වැටී තිබීම නිසා වෙළෙඳාමෙන් ලද ආර්ථික වාසි වැඩි වීම
- ගිජ්ඣකූට, ඉසිගිලි, වේභාර, වේපුල්ල හා පාණ්ඩව යන පර්වතවලින් මගධයට ස්වාභාවික ආරක්ෂාව සැලසීම
- වින්ධ්‍යා කඳුවැටිය, නැගෙනහිරින් ඉන්දියන් සාගරය හා උතුරින් ආරවල්ලී කඳු පන්තියෙන් ආරක්ෂාව සැලසීම

**විවාහ සම්බන්ධතා**

උදාහරණ : කෝසලදේවිය විවාහ කර ගැනීම නිසා කාසි ජනපදය හිමි වීම.

**යුධමය කටයුතු**

උදාහරණ :

අංග රාජ්‍යය ආක්‍රමණය කොට අල්ලා ගැනීම

**හාර්යංක රාජවංශය (බිම්බිසාර, අජාසත්ත) යටතේ මගධය**

- රජගහ අගනුවර වීම
- පාටලීපුත්‍රය ගොඩනැගීම
- කාසි ඈඳා ගැනීම
- ලිච්ඡවී හා සටන

**සිසුනාග රාජවංශය යටතේ මගධය**

- අවන්ති රාජ්‍යය යටත් කර ගැනීම
- කාලාශෝක රජු පාටලිපුත්‍රය, මගධයේ ස්ථිර ලෙස අගනගරය බවට පත් කිරීම

**නන්ද රාජවංශය යටතේ මගධය**

- මහා පද්මනන්ද රජු විසින් මගධය ශක්තිමත් ලෙස පවත්වාගෙන යාම

මගධය කේන්ද්‍ර කර ගත් අධිරාජ්‍යයක් ගොඩනගා ගැනීම.

**මෞර්ය රාජවංශය යටතේ මගධය**

- චන්ද්‍රගුප්ත මෞර්ය
- බින්දුසාර රජු
- අශෝක රජු

චන්ද්‍රගුප්ත මෞර්ය (ක්‍රි.පූ. 324 - 300)

- ජුනාගාද් ලිපිය මේ රජු පිළිබඳ හැදෑරීමට වැදගත් වේ.



**ඡායාරූපය 5.2.7.1 ජුනාගාද් සෙල්ලිපිය**

- මෞර්ය අධිරාජ්‍යයේ ආරම්භක පාලකයා වීම
- කෞටල්‍ය හෙවත් චාණක්‍ය රජුගේ දේශපාලන උපදේශකවරයා වීම
- නන්ද රාජවංශය පරාජය කර මගධයේ පාලකයා වීම
- ග්‍රීක ආධිපත්‍යය යටතේ පැවති වයඹදිග ඉන්දියාව මගධයට පවරා ගැනීම
- මගධයේ බලය පර්සියාව දක්වා ව්‍යාප්ත කිරීම
- මිසරය (ඊජිප්තුව, සිරියාව වැනි රටවල් සමග තානාපති සම්බන්ධතා පැවැත් වීම)

**බින්දුසාර රජු (ක්‍රි.පූ. 300 237)**

- චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ පුත්‍රයා ය. චන්ද්‍රගුප්තගේ මරණින් පසු මගධයේ බලයට පත් වේ.
- සතුරන් විනාශ කරන්නා (අමිත්‍රඝාත) ලෙස මොහු හඳුන්වා ඇත.

**අශෝක රජු**

- බින්දුසාර රාජ්‍ය කාලයේ තක්ෂිලාවේ කැරැල්ල මර්ධනය කිරීම
- රජවීමට පෙර අවන්තියේ යුව රජ ලෙස කටයුතු කිරීම
- වැඩිමහල් සහෝදර සුසීම ඝාතනය කර මගධයේ සිහසුනට පත්වීම
- ක්‍රි.පූ. තෙවන සියවසේදී රාජ්‍යයට පත් වූ බව වංසකථා අනුව පෙනේ

**අශෝක රජු යටතේ මගධ අධිරාජ්‍යයේ ව්‍යාප්තිය**

- කාලිංගය යටත් කිරීම
- නැගෙනහිරින් ඇසෑම් වෙරළ තීරය
- උතුරින් හිමාලය, දකුණින් කාවේරී නදිය
- බටහිරින් අරාබි මුහුද දක්වා මෞර්ය අධිරාජ්‍යය ව්‍යාප්ත වීම

**අශෝක රජුගේ ධර්ම විජය ප්‍රතිපත්ති**

- ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා ධර්ම මහාමාත්‍යවරු පත් කිරීම
- නිග්‍රෝධ සාමණේරයන්ගෙන් බණ අසා බෞද්ධයකු වීම
- සියලු ම ආගම්වලට ගරු කළ යුතු බව 12 වන ගිරි ලිපියේ සඳහන් කර ඇත.
- තුන්වන ධර්ම සංගායනාව සඳහා අනුග්‍රාහකත්වය දීම
- බුදු දහම අන්‍ය රටවල ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම (නවරට ධර්මදූත සේවාව)
- විවිධ ආගම්වල ධර්ම කොටස් ලියා ජනතාවට කියවීම සඳහා අධිරාජ්‍යය පුරා ලිපි පිහිටු වීම



ඡායාරූපය 5.2.7.2 දිල්ලි තෝප්‍රා ටැම් ලිපිය

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න.**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- මෞර්ය අධිරාජ්‍යයේ හැඟීම පිළිබඳ ව ඉදිරිපත් කිරීමක් සඳහා ශිෂ්‍යයන් යොමු කරවන්න.
- කතාව සඳහා සූදානම්වීමට කාලයක් ලබා දෙන්න.
- ඉදිරිපත් කිරීම්වලින් අනතුරුව සිසු ප්‍රබලතා අගයමින් අවශ්‍ය ප්‍රතිපෝෂණ හා ඉදිරිපෝෂණ ලබා දෙන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- කරුණුවල අදාළ බව හා නිවැරදි ව ඉදිරිපත් කිරීම
- උදාහරණ සහිත ව කරුණු පැහැදිලි කිරීම
- කරුණු සංවිධානගත කිරීම
- ආකර්ශනීය ව ඉදිරිපත් කිරීම
- කාලය කළමනාකරණය කර ගැනීම

**නිපුණතාව** : ඉන්දීය ඉතිහාසයේ ඓතිහාසික විකාශනය හා නව ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 5.2.8 මෞර්ය අධිරාජ්‍යයේ සංස්කෘතික කටයුතු සහ පරිහානිය පිළිබඳ තොරතුරු විමසා බලයි.

**කාලච්ඡේද** : 01යි.

**ඉගෙනුම් පල** :

- මෞර්ය අධිරාජ්‍යයේ කලාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- මෞර්ය අධිරාජ්‍යයේ කලා නිර්මාණ අගය කරයි.
- මෞර්ය අධිරාජ්‍යය බිඳ වැටීමට බලපෑ හේතු දක්වයි.

**ආකල්ප හා හර පද්ධති** :

- දුර්වල පාලනය හමුවේ ශක්තිමත් අධිරාජ්‍ය පවා බිඳ වැටෙන බව දැන ගැනීම
- උසස් කලා නිර්මාණ පිළිබඳ උසස් හැඟීම් ඇති කර ගැනීම

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**5.2.8 මෞර්ය අධිරාජ්‍යයේ සංස්කෘතික හා කලා කටයුතු**

- ස්තූප ඉදි කිරීම
- අශෝක ස්තම්භ
- පර්වත ගුහා සකස්කොට ඉදි කරන ලද ලෙන් විහාර
- පිහිටි ගල් හාරා ලෙන් ඉදි කිරීම ප්‍රථම වරට ආරම්භ කිරීම



ඡායාරූපය 5.2.8.1 සාංචි ස්තූපය



ඡායාරූපය 5.2.8.2 සාංචි තොරණ



ඡායාරූපය 5.2.8.3 අශෝක ස්තම්භ



ඡායාරූපය 5.2.8.4 බරාබර් ලෙන



ඡායාරූපය 5.2.8.5 ගෝපිකා ගල් ලෙන

වාස්තු විද්‍යාව

- අශෝකගේ රජ මාලිගාවේ නටබුන්
- චන්ද්‍රගුප්ත රජ මාලිගය පර්සියානු අලංකාරවලින් යුතුව ඉදිකර තිබූ බව

**මෞර්ය අධිරාජ්‍යයේ පරිහානිය හා බිඳ වැටීම්**

- අශෝක රජුගෙන් පසු ප්‍රාදේශීය පාලකයන් ස්වාධීන වීම
- රාජ්‍යත්වය සඳහා පැවැති කුමන්ත්‍රණ හා අර්බුද
- ක්‍රි.පූ. 187 දී පමණ එල්ල වූ බැට්‍රියන් ග්‍රීක ආක්‍රමණ නිසා පරිහානිය වේගවත් වීම.
- මෞර්ය අධිරාජ්‍යගේ අවසාන පාලකයා වූ බෘහද්රථ මරණයට පත් කොට පුෂ්‍යමිත්‍ර ශුංග මගධයේ බලය අල්ලා ගැනීමෙන් මෞර්ය පාලනය අවසන් වීම

ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න.

- ''අශෝක අධිරාජයාගේ වැදගත්කම'' යන මැයෙන් ලිපියක් ලියන්න.
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- ලිපිය නිර්මාණශීලී ව සකස් කිරීමට උපදෙස් දෙන්න.
- මෙම ක්‍රියාකාරකම පසුවැඩක් ලෙස සිදු කිරීමට අවස්ථාව දෙන්න.
- ලිපි භාරදීම සඳහා දිනයක් දැනුම් දෙන්න.
- ලිපි පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ඇමුණුම අංක 5.2.8.1** කාර්ය පත්‍රිකාව

- මෞර්ය අධිරාජයේ සංස්කෘතික කටයුතු පිළිබඳ කතාවක් පවත්වන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- මෞර්ය අධිරාජ්‍යයේ කලාකෘති නම් කිරීම
- කලාකෘති උදාහරණ සහිත ව විස්තර කිරීම
- ඉදිරිපත් කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය වීම
- හඬ පාලනයෙන් යුතුව කරුණු නිවැරදි ව ඉදිරිපත් කිරීම
- කාල කළමනාකරණය කිරීම

# 06

## අග්නිදිග ආසියාවේ පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය

ආසියා මහද්වීපයේ ගිනිකොන දිගට පිහිටා ඇති රටවල් අයත් භූමි ප්‍රදේශය අග්නිදිග ආසියාව යනුවෙන් හැඳින්වේ. මෙම භූමි ප්‍රදේශය කොටස් දෙකකින් යුක්ත වේ. එනම්, 1. මහගොඩබිම් භූමි ප්‍රදේශය හා (2) සමුද්‍රාශ්‍රිත භූමි ප්‍රදේශය යනුවෙනි. පළමුවන භූමි ප්‍රදේශයේ පිහිටා ඇති රටවල් නම් ලාඕසය, වියට්නාමය, බටහිර මැලේසියාව, තායිලන්තය, බුරුමය හා කාම්බෝජයයි. දෙවන කොටසට අයත් ප්‍රදේශයේ පිහිටා ඇති රටවල් නම් ඉන්දුනීසියාව, නැගෙනහිර මැලේසියාව, පිලිපීනය හා සිංගප්පූරුව යනාදියයි.

මුහුදු ගමන් මාර්ග කිහිපයක් මෙම කලාපය තුළ තිබීමත් ඉන්දියාවත් සමග ගොඩබිමින් සම්බන්ධ වී තිබීමත් නිසා මේ රටවලට හා ඈත පෙරදිග රටවල් වන චීනය, කොරියාව හා ජපානය ආදී රටවලට ද ඉන්දියාවේ බිහිව වැඩුණු බ්‍රාහ්මණ හා බෞද්ධ ආගමික ලක්ෂණ හා සාහිත්‍ය කලා ශිල්ප එක එල්ලේ බලපා ඇත. ඒ අතර ශ්‍රී ලංකාවේ සංවර්ධනය වූ ආගමික හා සමාජීය විවිධ අංග බලපා ඇති බව හඳුනා ගත හැකි මෙම කලාපයේ ථෙරවාදී හා මහායාන බලපෑම ඒ ඒ රටවල පැතිරීම ද ඉහත සඳහන් ඈත පෙරදිග රටවල සංස්කෘතිය පිළිබඳව ද මෙම පාඩම් මාලාවෙන් අධ්‍යයනය කිරීම අපේක්ෂා කරනු ලැබේ.

**නිපුණතාව** : අග්නිදිග ආසියාවේ පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම** : 6.1 ආසියානු බෞද්ධ සංස්කෘතීන් විමසා බලයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- අග්නිදිග ආසියාව හා ඈත පෙරදිග රටවල් පැහැදිලි කරයි.
- අග්නිදිග හා ඈත පෙරදිග රටවල්වල නම් දැන ගනියි.
- අග්නිදිග හා ඈත පෙරදිග රටවල් සිතියමක සලකුණු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.

6.1.1 අග්නිදිග හා ඈත පෙරදිග ආසියාවේ පිහිටීම.




- සිතියම 6.1.1 ඇසුරින් අග්නිදිග හා ඈත පෙරදිග ආසියාවේ පිහිටීම ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ඊට අයත් රටවල් හා එම රටවල ප්‍රධාන නගර හඳුන්වා දෙන්න.
- ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටා ඇති රටවල් හඳුන්වා දෙන්න.
- ඉහත හඳුනා ගත් තොරතුරු ඇසුරින් ආසියාවේ සිතියමක පහත සඳහන් රටවල් ලකුණු කරන්න. ඒ සඳහා සපයා ඇති සිතියම (ඇමුණුම 02) භාවිත කරන්න.
- රටවල්, මියන්මාරය, චීනය, ලාඕසය, තායිලන්තය, කාම්බෝජය, ඉන්දුනීසියාව
- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- සිතියම ලකුණු කිරීම සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදා ගන්න.
- පහත නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

**ගුණාත්මක යෙදවුම් :**


- ආසියාවේ වර්තමාන රටවල් හා ප්‍රධාන නගර නම් කරන ලද සිතියමක්
- ඇට්ලස්හෝල් සිතියම් පොත
- පෙළ පොතෙහි සිතියම
- ඇමුණුම 6.1.1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක:**

- අග්නිදිග හා ඈත පෙරදිග ආසියාවේ පිහිටීම පිළිබඳ තොරතුරු විස්තර කිරීම
- අග්නිදිග හා ඈත පෙරදිග රටවල් හා නගර නම් කිරීම
- අග්නිදිග ආසියාවට අයත් රටවල් හා නගර සපයා දෙන සිතියමෙහි ලකුණු කිරීම
- සිතියම නිවැරදි ව හා පැහැදිලිව ලකුණු කිරීම
- නියමිත කාලයට නිම කිරීම

**ඇමුණුම් අංක 6.1.1**

- ආසියාවේ සිතියම



**නිපුණතාව** : අග්නිදිග ආසියාවේ පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම** : 6.2 බුරුමයේ බුදු දහම ව්‍යාප්තිය විමසා බලයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල** :

- මියන්මාරයට බුදු සමය පැමිණි ආකාරය පැහැදිලි කරයි.
- ථේරවාදී බුදු සමයේ ප්‍රබෝධය ඇති වූ ආකාරය විස්තර කරයි.
- මියන්මාරය හා ලංකාව අතර ආර්ථික, ආගමික, සමාජීය, සංස්කෘතික සබඳතා වැඩි දියුණු වූ ආකාරය පහදයි.

**ගුණාත්මක යෙදවුම්** :

- A4 හෝ සුදුසු කඩදාසි (පොත සැකසීමට)

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**6.2 මියන්මාරයේ බුදු දහම පැතිරීම**

- මියන්මාරයට බුදු සමයේ පැමිණීම
- මියන්මාරයට පෙර සෝණ රට්ඨය හෙවත් ස්වර්ණභූමි ලෙස හැඳින්වීම.
- මියන්මාරය බුරුමය ලෙස ද හැඳින්වීම
- ජීවත් වූ ජන වර්ග (පියු මොන්)

- **ථෙරවාදී බුදු දහමේ ප්‍රබෝධය**

- අනුරුද්ධ හෙවත් අනවරථ රජුගේ කාර්ය භාරය
- 1059 අරඹන ලද ස්වේදගොන් චෛත්‍යය
- මෙම චෛත්‍යය බුදුන් වහන්සේගේ ලලාට හා අකු ධාතුව නිදන් කොට නිර්මාණය කිරීම
- බුරුම රජවරුන් ථේරවාදී බුදු දහමේ ව්‍යාප්තියට කටයුතු කිරීම
- මියන්මාරය හා ලංකාව අතර ඇති සබඳතා
- චෝළ ආක්‍රමණ සමයේ ලංකා භික්ෂූන් ත්‍රිපිටක ධර්මය රැගෙන රාමඤ්ඤ දේශයට වැඩමවීම. මේ නිසා බුරුමයේ ථේරවාදී ධර්මය නැවත ස්ථාපිත කිරීම



ඡායාරූපය 6.2.1 ස්වේදගොන් චෛත්‍ය

- චෝළ ආධිපත්‍යයෙන් රජරට මුදවාගත් I විජයබාහු රජු බුරුම රජු වෙත දූතයන් යවා එරටින් ත්‍රිපිටකය හා බෞද්ධ භික්ෂූන් ගෙන්වා ගෙන බුදුසසුන මෙරට නැවත ස්ථාපිත කිරීම.
- පළමුවන පරාක්‍රමබාහු රජුගේ කාලයේ වෙළඳ හා සංස්කෘතික සබඳතා
- බුරුම-ලංකා සබඳතා සඳහා භික්ෂූන් වහන්සේලාගේ කාර්ය භාරය
- මහා පරාක්‍රමබාහු රජු හා බුරුම රජු වූ අලවුංසිතු රජවරුන් සමගි කර වීම.
- ක්‍රි.ව. 1167 පන්ථගු තෙරුන් මෙරටට වැඩම වීම.
- උත්තරජීව, ඡප්පට හිමිවරුන් වැඩම වීම.
- (සිහල සංඝ භික්ෂු නිකාය ඇරඹීම)
- නරපති සිථු රජුගේ කාලයේ නිරන්තර සබඳතා දියුණු වීම.
- ක්‍රි.ව. 1424 - 25දී සියම් - කාම්බෝජ බුරුම භික්ෂූන් වහන්සේලා 39 නමක් පැමිණ උපසම්පදාව ලබා ගැනීම.
- ක්‍රි.ව. 1450 වසරේ මර්තබන් නගරයේ සේවසුවණ්ණ සෝභණ තෙරුන් ඇතුළු භික්ෂු පිරිස කැලණියේ දී උපසම්පදාව ලැබීම.
- ක්‍රි.ව. 1474 දී ධම්මචේතිය රජු භික්ෂූන් 44 නමක් මෙරටට එවා උපසම්පදාව ලබා ගැනීම.
- හයවන බුවනෙකබාහු රජ බුරුම භික්ෂූන්ට ගෞරවනාම පිරිනැමීම
- වැලිවිට සරණංකර සංඝරාජයන් වහන්සේගේ උත්සාහයෙන් සියම් දේශයෙන් උපාලි තෙරුන් ඇතුළු භික්ෂු පිරිස නැවත උපසම්පදාව ගෙන ඒම.

**ඉහත විෂය අන්තර්ගතය ආවරණය වන සේ කෙටි ප්‍රශ්න හා පිළිතුරු පොතක් සැකසීමට ශිෂ්‍යයන් යොමු කරන්න.**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- පාඩමට අදාළ ව හැකිතාක් කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් පොතක් සැකසීමට උපදෙස් දෙන්න.
- පෙළ පොත ඇසුරින් ප්‍රශ්න සැකසීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- A4 කොළ හෝ සුදුසු කොළ භාවිත කරමින් කුඩා පොතක් ලෙස ප්‍රශ්න සහ පිළිතුරු ඇතුළත් පොත සැකසීමට උපදෙස් දෙන්න.
- මෙම ක්‍රියාකාරකම සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදා ගන්න.
- නිර්ණායක ඇසුරින් තක්සේරුව හා ඇගයීම සිදු කරන්න.
- සාර්ථක ප්‍රශ්න හා පිළිතුරු පොත් අගය කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- බුරුමයේ බුදු දහම ව්‍යාප්තියට තොරතුරු ඉදිරිපත් කිරීම
- බුදු දහමට අනුග්‍රහ දැක්වූ රජවරු ඇගයීම
- නිවැරදි ව ප්‍රශ්න සකස් කිරීම
- පාඩමේ අන්තර්ගතය ආවරණය වන පරිදි කෙටි ප්‍රශ්න හා පිළිතුරු සැකසීම
- නියමිත වේලාවට අවසන් කිරීම

**නිපුණතාව** : අග්නිදිග ආසියාවේ පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම** : 6.3 තායිලන්තයේ බුදු දහම ව්‍යාප්ත වූ ආකාරය විමසා බලයි.

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල** :

- තායිලන්තයට බුදු දහම ව්‍යාප්ත වූ අයුරු විස්තර කරයි.
- ථේරවාදී බෞද්ධ කටයුතු පැහැදිලි කරයි.
- තායිලන්ත සමාජය කෙරෙහි ශ්‍රී ලාංකේය බුදු දහමින් ලැබුණු පෝෂණය පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම් අංක 6.3.1

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**6.3 තායිලන්තයේ බුදුදහම පැතිරීම**

- තායිලන්තයේ පිහිටීම
- තායිලන්තයේ ආසන්න රටවල්
- ශ්‍රී ලංකාව සමග පවතින සමීප සබඳතා ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ද්වාරවතී ශිෂ්ටාචාරය
- ද්වාරවතී රාජ්‍යයට ථේරවාදී බුදුසමය ව්‍යාප්ත වූ ආකාරය
- පිළිමවල සමානත්වය (ලංකා, ඉන්දීය අමරවතී)
- ද්වාරවතී රාජ්‍යය හා අනුරාධපුරය අතර සබඳතා



**6.3.1 අමරාවතී පිළිමය**



6.3.2 තායිලන්තයේ පැරණි නගරයක වර්තමාන ඡායාරූපයක්

- **තායිලන්තයේ පැරණි නගර**

- පැරණි පාචින්පුරි
- ෆිස්නුලෝක (විෂ්ණු ලෝකය)
- සුපන්පුරි (ස්වර්ණ පුරය)
- සුඛෝතායි (සුඛෝදය)
- නබෝම් පතොම් (ප්‍රථම නගරය)
- ලොප්පුරි (ලාවා පුර)

- **සියම සමග පැවැති ලාංකීය සබඳතා**

  - පළමුවන විජයබාහු රජු දවස
  - මහා පරාක්‍රමබාහු රජුගේ සබඳතා
  - නිශ්ශංකමල්ල රජුගේ සෙල්ලිපිවල සඳහන් කරුණු
  - දෙවන පරාක්‍රමබාහු රජුගේ කාලයේ සබඳතා
  - සුඛෝදයේ පාලකයා වූ රාම්කම්හෙං රජු දවස සෙල්ලිපිය
  - ලංකාවට වැඩම කළ ශ්‍රී ශ්‍රද්ධා රාජ චුලමනී සිරිරතන ලංකාදීප මහාසාමි සමයේ තොරතුරු
  - සුඛෝදයේ රජ කළ ශ්‍රී ධර්මරාජ ලිදය්ය රජුගේ අවධිය
  - අයෝධ්‍යා නගරයේ වැඩවාසය කළ ධම්මකිත්ති හිමිගේ තොරතුරු
  - 18 වන සියවසේ වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගේ කාලයේ තොරතුරු

- **ඉහත විෂය අන්තර්ගතය ආවරණය වන සේ වගුවක් සම්පූර්ණ කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.**
  - මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් සේ යොදා ගන්න.
  - ඇමුණුම් අංක 6.3.1හි සඳහන් වගුව කණ්ඩායම්වලට ලබා දී එය සම්පූර්ණ කිරීමට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.
  - ඒ සඳහා එක් කාලච්ඡේදයක් යොදා ගන්න.
  - නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.
  - වගුව නිවැරදි ව සම්පූර්ණ කරන කණ්ඩායම තෝරා උපස්ථම්භනය කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- තායිලන්තයේ බෞද්ධ ප්‍රබෝධයට උරදුන් රජවරුන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- තායිලන්තයේ පැරණි බෞද්ධ නගර පිළිබඳව හා වෙහෙර විහාර පිළිබඳව තොරතුරු වගු ගත කිරීම
- තායිලන්තය හා සබඳතා පැවැත් වූ ලාංකීය රජවරු නම් කිරීම
- වගුව නිවැරදි ව සම්පූර්ණ කිරීම
- ක්‍රියාකාරකම සඳහා දායක වීම

**ඇමුණුම් අංක 6.3.1 කාර්ය පත්‍රිකාව**

| බෞද්ධ ප්‍රබෝධයට උරදුන් තායිලන්තයේ රජවරුන් | තායිලන්තයේ බෞද්ධ නගර | තායිලන්තය සමග සබඳතා පැවැත් වූ ලංකා රජවරු |
|---|---|---|
| 1. ........................................ | 1. ........................................ | 1. ...................................... |
| 2. ........................................ | 2. ........................................ | 2. ...................................... |
| 3. ........................................ | 3. ........................................ | 3. ...................................... |
| 4. ........................................ | 4. ........................................ | 4. ...................................... |
| 5. ........................................ | 5. ........................................ | 5. ...................................... |
| 6. ........................................ | 6. ........................................ | 6. ...................................... |
| 7. ........................................ | 7. ........................................ | 7. ...................................... |
| 8. ........................................ | 8. ........................................ | 8. ...................................... |

**නිපුණතාව** : අග්නිදිග ආසියාවේ පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම** : 6.4 කාම්බෝජයේ බුදු දහම පැතිරීම පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- කාම්බෝජයේ අතීත බෞද්ධ උරුමය පිළිබඳව විස්තර කරයි.
- කාම්බෝජයේ බුදු දහමේ ව්‍යාප්තියට කටයුතු කළ පාලකයන්ගේ ක්‍රියාකලාපය පැහැදිලි කරයි.
- කාම්බෝජයේ පැරණි බෞද්ධ වෙහෙර විහාර පෙන්වා දෙයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 6.4.1

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**6.4 කාම්බෝජයේ බුදු දහම පැතිරීම**

- කාම්බෝජයේ පිහිටීම මායිම්ව පවත්නා රටවල්
- වර්තමාන නාමය (කම්පුචියාව)
- කාම්බෝජයේ බුදු දහම පැතිර යාම
- ක්‍රි.ව. පස් වන සියවසේ ජයවර්මන් රජුගේ අවධිය
- ක්‍රි.ව. නව වන සියවසේ යශෝවර්මන් රජුගේ අවධිය
- ක්‍රි.ව. දහ වන සියවසේ රජකල ජයවර්මන් රජුගේ අවධිය
- ක්‍රි.ව. එකොළොස්වන සියවසේ රජකළ සුසර්මන් රජු දවස
- 13 වන සියවසේ දී තායි ආධිපත්‍යයට නතු වීම
- වර්තමාන ධම්ම යුත්තික හා මහායානික භික්ෂු නිකාය දෙක



6.4.1
කාම්බෝජයේ බෞද්ධ විහාරයක්

- **ඉහත විෂය අන්තර්ගත වන සේ ඇමුණුම් අංක 6.4.1හි සඳහන් ක්‍රියාකාරකම සඳහා ශිෂ්‍යයන් යොමු කරන්න.**

    - මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
    - පෙළ පොත ඇසුරින් ක්‍රියාකාරකම සිදු කිරීමට උපදෙස් දෙන්න.
    - ක්‍රියාකාරකම සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදා ගන්න.
    - සියලු ක්‍රියාකාරකම් ඇගයීම් සිදු කරන්න.
    - වඩාත් නිවැරදි ක්‍රියාකාරකම් තෝරා එම ශිෂ්‍යයන් උපස්ථම්භනය කරන්න.
    - නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- කාම්බෝජයේ බුදු දහම ව්‍යාප්ත වූ අයුරු විස්තර කිරීම
- බුදු දහමට අනුග්‍රහය දැක් වූ පාලකයින් අගය කිරීම
- කාම්බෝජයේ බුදු දහම සාර්ථක ව පැවැති බවට කරුණු දැක්වීම
- වඩාත් නිවැරදි ව තොරතුරු ඉදිරිපත් කිරීම
- නියමිත කාලයට අවසන් කිරීම

**ඇමුණුම් අංක 6.4.1 කාර්ය පත්‍රිකාව**

- ''කාම්බෝජයේ බුදුදහම'' යන මාතෘකාව අනුව පුවත්පතක් සඳහා ලිපියක් සකස් කරන්න.

**නිපුණතාව** : අග්නිදිග ආසියාවේ පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම** : 6.5 ලාඕසයේ බුදු දහම ව්‍යාප්ත වීම පිළිබඳ විමසා බලයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- ලාඕසයේ පිහිටීම සිතියම ඇසුරින් පෙන්වා දෙයි.
- බුදු දහමේ ආභාසය ලැබීම පිළිබඳව පැහැදිලි කරයි.
- බුදු දහම සමාජගත වී ඇති අයුරු පෙන්වා දෙයි.

**ගුණාත්මක යෙදවුම්** :

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**6.5 ලාඕසයේ බුදු දහම පැතිරීම**

- ලාඕසය, චීනය, මියන්මාරයට, තායිලන්තය, කාම්බෝජය හා වියට්නාමය වැනි රටවලට මායිම්ව පැවතීම
- බුදු සමය ලැබීම
- 14 වන සියවසේ බෞද්ධ රාජ්‍යයක් වූ තායිලන්තයට යටත් වීම
- ධම්ම යුක්තික හා මහායානික නිකාය දෙකේ පැතිරීම
- රාජ්‍ය අනුග්‍රහය ලැබුණු ආකාරය
- බෞද්ධ පොත්පත් සුලභ කිරීම
- පාලි භාෂාවට පාසල්වල ප්‍රමුඛත්වයක් ලබා දීම



**6.5.1 ලාඕසයේ බෞද්ධ සිද්ධස්ථානයක්**

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ ලාඕසයේ බුද්ධාගම පැතිරීම මාතෘකාව යටතේ ලිපියක් සකස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- මේ සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදා ගන්න.
- පෙළ පොත ද ඇසුරු කරගනිමින් රචනාවක් ලිවීමට උපදෙස් දෙන්න.
- සියලු රචනා ඇගයීම් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ලාඕසයට බුදු දහම ලැබුණු ආකාරය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම
- ලාඕසයේ බහුතර ජනතාව බෞද්ධයන් බව පෙන්වා දීම
- ලාඕසය ථේරවාදී බෞද්ධ රටක් වීම
- නිවැරදි ව රචනාව ලිවීම
- නියමිත කාලයට නිම කිරීම

**නිපුණතාව** : අග්නිදිග ආසියාවේ පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම** : 6.6 ඉන්දුනීසියාවේ බුදු දහම ව්‍යාප්ත වීම පිළිබඳ විමර්ශනය කරයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- ඉන්දුනීසියාවේ බුදු දහම පැතිරීම විස්තර කරයි.
- බුදු දහම පැතිරීමට පාලකයන්ගෙන් ලැබුණු අනුග්‍රහය අගය කරයි.
- විවිධ අවස්ථාවල බුදු දහමට එල්ල වූ අභියෝග පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**6.6 ඉන්දුනීසියාවේ බුදු දහම ව්‍යාප්ත වීම**

- ඉන්දුනීසියාවේ පිහිටීම




- ජාවා, සුමාත්‍රා, බෝර්නියෝ, සෙලිබබීස් ආදී දූපත් සමූහයකින් සමන්විත ප්‍රදේශයක් වීම

**ඉන්දුනීසියාවේ බුදු දහම පැතිරීම**

- ඉන්දුනීසියාවේ බුදු දහම පැතිරීම ඉන්දියාවේ ධර්මාශෝක රාජ සමය දක්වා ඈත කාලයේ සිදු වීම
- ජාවා, සුමාත්‍රා දූපත්වලින් හමු වී ඇති බෞද්ධ පිළිම ක්‍රි.පූ. තුන් වන හා දෙවන සියවස්වල අයත් වීම ඊට උදාහරණ වේ.
- ජාවාවලින් හමු වූ සෙල්ලිපියක අභයගිරිය ගැන ඇති සඳහන
- ථේරවාදී බුදු දහම ඉන්දුනීසියාව තුළ ව්‍යාප්ත වීම
- ශ්‍රී විජය රාජ්‍යයේ අගනුවර වූ පලෙයිබාන් ථේරවාදී බුදු සමයේ බලකොටුවක් වීම. එහි භික්ෂූන් දහසකට අධික පරිසක් වැඩ විසීම
- ඉන්දුනීසියාව තුළ මහායාන ධර්මය ප්‍රචාරය වීම හා ඊට ශෛලේන්ද්‍ර රාජ පරම්පරාව උපකාර කිරීම
- ශෛලේන්ද්‍ර රජුන් විසින් බෝරෝබුදූර් ස්තූප සංකීර්ණය ඉදි කිරීම
- නවවන සියවසේ ක්‍රමිකව වර්ධනය වූ හින්දු ආගම සහ 15 වන සියවසේ මුස්ලිම් ආධිපත්‍යය නිසා බෞද්ධාගමෙහි ව්‍යාප්තියට බාධා වීම
- එහෙත් වර්තමානයේ ද ඉන්දුනීසියාවේ බෞද්ධ ජනතාවක් වාසය කිරීම



ඡායාරූපය 6.6.1 බොරෝ බුදූර්

- **ඉහත විෂය අන්තර්ගතය ඇසුරින් කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් පොතක් සකස් කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.**

  - මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
  - පෙළ පොත ඇසුරින් හැකි තරම් කෙටි ප්‍රශ්න හා ඊට අදාළ පිළිතුරු ඇතුළත් පොතක් සැකසීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
  - නිර්ණායක ඇසුරින් තක්සේරුව හා ඇගයීම සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ඉන්දුනීසියාවේ බුදු දහම පැතිරීම පිළිබඳව විස්තර කිරීම
- මහායාන හා ථේරවාදී නිකායන් පිළිබඳ විස්තර කිරීම
- බෞද්ධාගමේ ව්‍යාප්තිය සඳහා කටයුතු කළ ඉන්දුනීසියානු රජවරුන් අගය කිරීම
- නිවැරදි ප්‍රශ්න හා පිළිතුරු සැකසීම
- නියමිත කාලයට අවසන් කිරීම

**නිපුණතාව** : ඈත පෙරදිග රටවල පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම** : 6.7 චීනයේ බෞද්ධාගම ව්‍යාප්ත වූ ආකාරය විමසා බලයි

**කාලච්ඡේද** : 03යි.

**ඉගෙනුම් පල** :

- චීනයට බුදු දහම ලැබුණු ආකාරය විග්‍රහ කරයි.
- චීනයේ බුදු දහම ප්‍රචාරයට තුඩු දුන් හේතු ඉදිරිපත් කරයි.
- සදාචාරවත් චීන සමාජයක් ගොඩනගා ගැනීමට බුදු දහමින් ලැබුණු ආභාසය පෙන්වා දෙයි.

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම් අංක 6.7.1
- ඇමුණුම් අංක 6.7.2

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**6.7 චීනයේ බෞද්ධාගම පැතිරීම**




සිතියම 6.7.1 චීනයේ පිහිටීම

**ආසියාවේ මහායාන බෞද්ධ සංස්කෘතිය**

- පස්වන ධර්ම සංගායනාව (කණිෂ්ක රජු දවස)
- මධ්‍ය ආසියාව පුරා බුදු දහම ප්‍රචාරය වීම
- පැරණි ගොඩබිම් සේද මාවත වෙළෙඳුන් මගින් චීනයට බුදු දහමේ පණිවිඩය ලැබීම

**චීනයේ බෞද්ධ සංස්කෘතිය**

- පැරණි චීනය
    - චීනය ඉතා දීර්ඝ කාලීන ඉතිහාසයක් ඇති රටකි. එහි ඓතිහාසික කථාව ක්‍රි.පූ. 12 ශතවර්ෂය පමණ දක්වා දීර්ඝ වේ. ඉතිහාසඥයන්ගේ මතය අනුව චීනයේ මුල් ම පාලකයින් ලෙස ෂැංග් පෙළපත හඳුන්වා දෙයි.
    - චීනය සේද රෙදි හා අලංකාර පිඟන් භාණ්ඩ සඳහා ලෝකයේ වඩාත් ප්‍රසිද්ධ වී තිබීම
    - අතීතයේ සිට බාහිර ලෝකය සමග චීනය වෙළඳ සබඳතා පවත්වා තිබීම
    - චීන වෙළෙන්දන් ඉන්දියාව, පර්සියාව, සිරියාව සහ යුරෝපයේ රෝම අධිරාජ්‍ය සමග ද වෙළඳ කටයුතු කිරීම
    - රෝමය තුළ චීනයේ සේද රෙදි සඳහා ඉහළ ඉල්ලුමක් වීම මගින් චීනය හා රෝමය අතර වෙළෙඳ සබඳතා වර්ධනය වීම.
    - චීනය හා රෝම අධිරාජ්‍ය සම්බන්ධ කළ වෙළෙඳ මාර්ගය සේද මාවත නමින් හැඳින්වීම



ඡායාරූපය 6.7.1 නටඹුන්ව ඇති ගොඩබිම් සේද මාවත වර්තමාන ඡායාරූපයක්

- මෙම සේද මාවත ඔස්සේ ගිය වෙළෙඳුන් මගින් චීනයට බුදු දහම හඳුන්වා දීම
- ක්‍රි.ව. පළමුවන සියවසේ දී පමණ හැං රාජවංශ සමයේ චීනය තුළ බුදුදහම ප්‍රචාරය වීම. හැං රාජවංශය යටතේ මේ කාලයේ චීනය ඉතා සෞභාග්‍යමත් යුගයක් වූ අතර බුදුදහම ලැබීම මගින් එය තවත් වර්ධනය වීම
- බුදුදහම චීනය තුළ ප්‍රචලිත වීමට පෙර කොන්පියුසියස් හා තාඕ ධර්මය පැවතීම.
- මෙම දහම් මගින් චීනය තුළ සදාචාර සමාජයක් සඳහා අදාළ පදනමක් ගොඩනගා තිබීම
- බෞද්ධ දර්ශනය හා මෙම දහම් අතර සමානතා පැවතීම
- ක්‍රි.ව. තුන්වන සියවස වන විට චීනය තුළ බුදුදහම සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම
- චීන භික්ෂූන් ඉන්දියාවට හා ශ්‍රී ලංකාවට ධර්ම ග්‍රන්ථ සොයා පැමිණීම හා ඒවා චීන බසට පරිවර්තනය කිරීම
- චීනය තුළ විවිධ ආචාරියවාද හෙවත් නිකායන් ඇති වීම

**චීනයට බුදු දහමින් ලද අභ්‍යාසය**

- කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය
- වෙහෙර විහාර හා විවිධ වාස්තු විද්‍යාත්මක නිර්මාණ බිහි වීම



ඡායාරූපය 6.7.2

මොන්ගෝ ලෙන් විහාරය



ඡායාරූපය 6.7.2

ලෙන් විහාරයේ ඇති බුද්ධ ප්‍රතිමාවක්

- තඹවලින් ප්‍රතිමා නිර්මාණය කිරීම
- චිත්‍ර කලාව දියුණු වීම
- ආගමික කරුණු මුල් කරගනිමින් චිත්‍ර ඇඳීම
- බෞද්ධ පාසල් ආරම්භ වීම
- බෞද්ධ දර්ශනය පදනම් කර ගත් සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම

- **ඉහත විෂය කරුණු ආවරණය වන සේ හැකුළුම්පතක් නිර්මාණය කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.**

  - මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
  - ඇමුණුම් අංක 6.7.1හි තොරතුරු ඇසුරින් ඇමුණුම් අංක 6.7.2හි හැකුළුම්පතෙහි ආකෘතිය අනුව ක්‍රියාකාරකම සඳහා ශිෂ්‍යයන් යොමු කරන්න.
  - ඒ සඳහා එක් කාල පරිච්ඡේදයක් යොදා ගන්න.
  - ක්‍රියාකාරකම කිරීමට පෙරදින අදාළ ද්‍රව්‍ය රැගෙන ඒමට උපදෙස් දෙන්න.
  - වඩාත් නිර්මාණශීලී නිවැරදි තොරතුරු ඇතුළත් හැකුළුම්පත් තෝරා ගන්න.
  - නිර්ණායක අනුව ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.


**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- චීනයට බුදුදහම ලැබුණු ආකාරය විග්‍රහ කිරීම
- චීනයේ බුදු දහම ප්‍රචාරයට තුඩු දුන් හේතු ඉදිරිපත් කිරීම
- බුදු දහමින් චීන සමාජය ලද පෝෂණය පෙන්වා දීම
- නිර්මාණශීලී ව හා නිවැරදි ව ක්‍රියාකාරකම සිදු කිරීම
- ක්‍රියාකාරකම සඳහා සහයෝගය දැක්වීම

ඇමුණුම් අංක 6.7.1

- ක්‍රියාකාරකම සඳහා උපදෙස්
- A4 කොළයක් ඇමුණුම 6.7.2හි ඇති ආකාරයට සකසා ගන්න.
- එය පිටු අනුව අංක කරගන්න.
- පහත මාතෘකා යටතේ එක් එක් පිටුවට අදාළ තොරතුරු හා රූප එකතු කරන්න.
- 1 පිටුව මාතෘකාව උදා - (චීනයේ බුදු දහම)
- 2 පිටුව චීනය පිළිබඳ හැඳින්වීම
- 3 පිටුව චීනයේ බුදු දහම පැතිරීම

ඇමුණුම් අංක 6.7.2 හැකුළුම්පත සඳහා ආකෘතිය



**නිපුණතාව** : ඈත පෙරදිග රටවල පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම** : 6.8 කොරියාවේ බෞද්ධාගම ව්‍යාප්ත වීම පිළිබඳ විමසා බලයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- කොරියාවේ බුදු දහම පැතිරීම පිළිබඳ විස්තර කරයි.
- බුදු දහම මගින් කොරියානු සමාජය වෙනස් වූ ආකාර පෙන්වා දෙයි.
- කොරියානු බුදු දහමේ වර්තමාන තත්ත්වය පහදයි.

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම 6.8.1 කාර්ය පත්‍රිකාව

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**6.8 කොරියාවේ බුදු දහම පැතිරීම**

**පිහිටීම**

- කොරියාව තුන් දිසාවකින් මුහුදෙන් වට වූ රටක් වීම
- චීනයට හා රුසියාවට මායිම්ව ඇත.
- උතුරු කොරියාව හා දකුණු කොරියාව යනුවෙන් වර්තමානයේ බෙදී ඇත.
- කොරියාවට බුදු දහම පැමිණීම

ආරමම්භයේදී කොරියාව රාජ්‍ය තුනකින් පාලනය විය. ඒවානම්,

1. ගොර්යෝ (වසර 7යි - ක්‍රි.පූ. 37 - ක්‍රි.ව. 668)
2. ශිල්ලා (වසර 992 - ක්‍රි.පූ. 57 - ක්‍රි.ව. 935 )
3. පෙක්චේ (වසර 681 - ක්‍රි.පූ. 18 - ක්‍රි.ව. 663)

ගොර්යෝ රාජ්‍යය

- ක්‍රි.ව. 372 දී ගොර්යො (කොගුර්යො) රාජ්‍යයේ පාලකයා වූ සොසෙරිම් රජුගේ කාලයේ පැමිණි සුනේදො භික්ෂුව
- ක්‍රි.ව. 381 පැමිණි මරනන්ද නම් ඉන්දියානු භික්ෂුන් වහන්සේ

**ශිල්ලා රාජ්‍යය**

- ශිල්ලා රාජ්‍යයට බුදු දහම හඳුන්වා දුන් මුක්හෝජා (මුක්නොජා) හිමියෝ
- තන්ත්‍රයානයේ ආභාසය
- ක්‍රි.ව. 393 දී කොකුවුවන් රජුගේ ආඥාව
- ක්වංකේතෝ රජුගේ ආරාම ඉදි කිරීම
- චීන සහ  කොගිරියෝ රාජ්‍යයේ භික්ෂූන්ගේ සමීප සබඳතා

**පෙක්චේ රාජ්‍යයේ බුදු දහම**

- කියටික් නම් භික්ෂූන් වහන්සේගේ ඉන්දීය සබඳතා
- එකල සිටි පෙක්චේ රජුගේ සහාය ලැබීම.
- ක්‍රි.ව. 600 - 640 සිටි පෙක්චේ රජුගේ මීරුක් විහාර නිර්මාණය
- හයවන සියවසේ දී කොරියානු භික්ෂූන් වහන්සේලා ජපානයට බුදු දහම හඳුන්වා දීම
- ක්‍රි.ව. 668 - 935 කාලයේ ශිල්ලා රාජ්‍යයේ රජ පවුලේ උදවිය හා භික්ෂූන් වහන්සේලා බුදුදහමට අනුකුල ව කටයුතු කිරීම
- සෙන් (ශෙන්) හා කියෙන් භික්ෂු නිකාය ඇතිවීම

**කොරියානු බුදු දහමේ වර්තමාන තත්වය**

- රාජ්‍යය අනාගාමික වීම
- ඇතැම් භික්ෂූන් වහන්සේලා වනගත ව භාවනානුයෝගී වීම
- තරුණ පිරිස අතර මතවාදී වෙනස් වීම්
- දේව වන්දනය හා බුදු දහම සම්මිශ්‍රණය වීම
- භික්ෂුණී සාසනයට වැදගත් තැනක් හිමි වීම
- ජපන් ආධිපත්‍යයෙන් කොරියාව නිදහස් කර ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලා ඇප කැප වී ක්‍රියාකිරීම
- සාමය ඇති කරගැනීම සඳහා බුදුදහමේ පණිවිඩය ජපානයට ලබා දීමට කටයුතු කිරීම
- බෞද්ධ ජනගහනය සීමාවීම

**කොරියාවෙන් බෞද්ධ සංස්කෘතියට සිදු වූ සේවාව**

- ත්‍රිපිටක කොරියානා ඇතුළු බෞද්ධ ග්‍රන්ථ බිහි වීම (ත්‍රිපිටක කොරියානා ලී පුවරු මත ලියා ඇත. ඒවා තැන්පත් කර ඇති පන්සල් එන්සානම් වේ. එය 13 වන සියවසට අයත් ය.)
- කොරියානු හිමිවරුන්ගේ චින්තනය වෙනත් රටවලට පැතිර යාම
- බෞද්ධ සංස්කෘතිය කොරියාවේ සංස්කෘතික උරුමය වීම
- බෞද්ධ ගෘහ නිර්මාණ ලක්ෂණ බිහි වීම
- සෙන් භාවනා ක්‍රමය අපරදිග රටවලට ව්‍යාප්ත කිරීම

- **ඉහත විෂය කරුණු ආවරණය වන සේ ඇමුණුම 6.8.1 ඇති ක්‍රියාකාරකම සඳහා ශිෂ්‍යයන් යොමු කරන්න.**

  - මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
  - පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 6.8.1හි මාතෘකා ශිෂ්‍ය කණ්ඩායම්වලට ලබා දෙන්න.
  - ක්‍රියාකාරකම සඳහා එක් කාල පරිච්ඡේදයක් යොදා ගන්න.
  - එක් එක් කණ්ඩායමට ලද මාතෘකාව අනුව පෙළ පොත ඇසුරින් තොරතුරු සොයා ගැනීමට යොමු කරන්න.
  - සොයා ගත් තොරතුරු පන්තියට ඉදිරිපත් කරවන්න.
  - ඉදිරිපත් කිරීම්වල දුබලතා ප්‍රබලතා හඳුනා ගනිමින් පාඩම සමාලෝචනය කරන්න.
  - නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- කොරියාවේ බෞද්ධ සංස්කෘතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- බෞද්ධ ආභාසයෙන් කොරියානු සමාජය වෙනස් වූ ආකාරය පෙන්වා දීම
- කොරියාව බහුආගමික රටක්වීම අගය කිරීම
- නිවැරදි ව තොරතුරු ඉදිරිපත් කිරීම
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම

**ඇමුණුම් අංක 6.8.1 කාර්ය පත්‍රිකාව**

**කණ්ඩායම 01**

- '' කොරියාවේ බුද්ධාගම ව්‍යාප්ත වීම'' යන්නට අදාළ තොරතුරු එකතු කර පන්තියට ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම 02**

'' කොරියානු සමාජය බුදු දහමින් ලද පෝෂණය'' යන මාතෘකාවට අදාළ තොරතුරු එකතු කර පන්තියට ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම 03**

''කොරියාවේ බුදු දහමේ වර්තමාන තත්ත්වය'' ඉහත මාතෘකාවට අදාළ තොරතුරු එකතු කර පන්තියට ඉදිරිපත් කරන්න.

**නිපුණතාව** : ඇත පෙරදිග රටවල පිහිටීම හා එහි සංස්කෘතික ඉතිහාසය පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම** : **6.9** ජපානයේ බුදු දහම ව්‍යාප්ත වීම පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද** : 02යි.

**ඉගෙනුම් පල** :

- බුදු දහම පැමිණීමට පෙර ජපානයේ ආගමික මත විස්තර කරයි.
- ජපානයේ බුදු දහම ව්‍යාප්ත වූ ආකාරය පෙන්වා දෙයි.
- බුදු දහම ජපානයේ ප්‍රධාන ආගම බවට පත්වීම අගය කරයි.
- බුදු දහම මගින් ජපන් වැසියන් ලද දායාද පෙන්වා දෙයි

**ගුණාත්මක යෙදවුම්** :

- ඇමුණුම අංක 6.9.1 කාර්ය පත්‍රිකාව

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

**පහත විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කරන්න.**

**6.9 ජපානයේ බුදුදහම පැතිරීම**

**ජපානයේ බුදු දහම ආරම්භ වීම**

- කොරියාවේ පෙක්චේ රාජ්‍යය හා ජපානයේ මිතුරු සබඳතා මගින් ජපානයට බුදු දහම ලැබීම
- ක්‍රි.ව. 552 පෙක්චේ රාජ්‍යයේ රජු ජපානයට බෞද්ධ දූත පිරිස පිටත් කොට හැරීම.
- ජපානයේ මොහෙරබ හා නකතොමිවරුන්ගේ විරෝධය
- සොගාවරුන්ගේ සහාය ලැබීම
- ජපානයේ පාරම්පරික ෂින්තො ආගම
- බුදු සමය ලැබුණු කාලයේ වසංගත රෝග බහුල වීම නිසා හිරිහැර සිදු වීම
- සොගාවරු දේශපාලන වශයෙන් බලවත් වූ බැවින් ලැබුණු සහාය හා අනුග්‍රහය

- **ජපානයේ බුදු දහම ව්‍යාප්ත වීම**
  - ක්‍රි.ව. 592 - 628 සුයිකො අධිරාජයාගේ කාලය
  - ෂෝතොකු කුමරුගේ කැපවීම හා ක්‍රියාමාර්ග
  - ක්‍රි.ව. 8 වන සියවසේ තරා යුගය
  - රාජධානිය කියෝතෝවට මාරුවීමට හේතු
  - සෙන් බුදු දහමේ ආභාසය

- **ඉහත විෂය කරුණු ආවරණය වන සේ ඇමුණුම 6.9.1හි ක්‍රියාකාරකම සඳහා ශිෂ්‍යයන් යොමු කරන්න.**

  - මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
  - පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම් අංක 6.9.1හි මාතෘකා එක බැගින් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
  - පෙළ පොත ඇසුරින් තොරතුරු එක් රැස් කර ක්‍රියාකාරකම සිදු කිරීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
  - ඒ සඳහා එක් කාලපරිච්ඡේදයක් යොදා ගන්න.
  - ක්‍රියාකාරකම්වල දුබලතා ප්‍රබලතා පෙන්වා දෙන්න.
  - නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක :**

- ජපානයේ බුදු දහම පැතිරුණු ආකාරය විස්තර කිරීම
- ෂින්තෝ බෞද්ධ
- බුදු දහමින් ජපානය ලැබූ පෝෂණය පෙන්වා දීම
- නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීම
- ක්‍රියාකාරකම සඳහා සහය දැක්වීම

**ඇමුණුම් අංක 6.9.1 කාර්ය පත්‍රිකාව**

**කණ්ඩායම 01**

- ''ෂෝතෙකු කුමරු ජපන් බුද්ධාගමේ දියුණුවට කළ සේවාව'' මාතෘකාවට අදාළ තොරතුරු රැස් කර බිත්ති පුවත් පතක් සඳහා ලිපියක් සකසන්න.

**කණ්ඩායම 02**

- ''සෙන් බුදු දහම මගින් ජපන් සමාජය ලද දායාද'' යන මාතෘකාවට අදාළ තොරතුරු රැස් කර බිත්ති පුවත්පතක් සඳහා ලිපියක් සකස් කරන්න.